# ඡේදනය වන අයිතිවාසිකම් ඔස්සේ සැරිසැරීමක්

## ශ්‍රී ලංකාව තුළ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ ප්‍රකාශනයේ නිදහස



NATIONAL CHRISTIAN EVANGELICAL ALLIANCE
SRI LANKA

# ඡේදනය වන අයිතිවාසිකම් ඔස්සේ සැරිසැරීමක්

## ශ්‍රී ලංකාව තුළ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ ප්‍රකාශනයේ නිදහස

**ජේදනය වන අයිතිවාසිකම් ඔස්සේ සැරිසැරීමක් | ශ්‍රී ලංකාව තුළ ආගමක් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස සහ ප්‍රකාශනයේ නිදහස**

© 2026 ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි එවැන්ජලික සන්ධානය (NCEASL)
URL: www.nceasl.org
සියලුම හිමිකම් ඇවිරිණි.
මෙම ප්‍රකාශනයේ ප්‍රකාශන අයිතිය ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි එවැන්ජලික සන්ධානයට (NCEASL) අයත් වන අතර, මෙම වාර්තාව සඳහා තනි බුද්ධිමය දේපළ සහ බෙදාහැරීමේ අයිතිය ඔවුන් සතු වේ.

චමේලි රණසිංහ ප්‍රනාන්දු සහ ජොවිටා අරුලනන්දම් විසින් මෙම අධ්‍යයනයෙහි කර්තෘත්වය දරන ලදී.

මෙය මුලින් ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද වාර්තාවක සිංහල පරිවර්තනයකි. එබැවින්, මෙම පරිවර්තනය සහ ඉංග්‍රීසි වාර්තාව අතර කිසියම් නොගැලපීමක් හෝ අපැහැදිලි බවක් ඇති වුවහොත්, ඉංග්‍රීසි භාෂාවෙන් ප්‍රකාශයට පත් කරන ලද මුල් වාර්තාවේ අන්තර්ගතය නිවැරදි අනුවාදය ලෙස සලකනු ලැබේ.

NATIONAL CHRISTIAN EVANGELICAL ALLIANCE
SRI LANKA

# පටුන


හැඳින්වීම ..... 1

1 වන පරිච්ඡේදය ..... 4

1 නීතිමය රාමුව ..... 4

1.1 ජාත්‍යන්තර නීතිමය රාමුව ..... 4

1.2 දේශීය නීති සම්පාදනය ..... 6

1.3 නිගමනය ..... 14

2 වන පරිච්ඡේදය ..... 15

2 ප්‍රකාශනයේ නිදහස (FoE) සහ ආගමික් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස (FoRB) අතර අභිසාරීතාව පිළිබඳ අභියෝග ..... 15

2.1 වෛරී කථනය ..... 16

2.2 දේවාපහාසය ..... 18

2.3 ප්‍රචාරණය සහ අන්‍යාගමිකකරණය ..... 19

2.4 ආගමික වන්දනා කිරීමේ ස්ථාන ලියාපදිංචි කිරීම ..... 20

2.5 නිගමනය ..... 21

3 වන පරිච්ඡේදය ..... 22

3.1 ආගම ආරක්ෂා කිරීම, ජනතාව ආරක්ෂා කිරීම ..... 22

3.2 ආගම ප්‍රකට කිරීම සහ එහි ප්‍රචාරණය පිළිබඳ දේශපාලනය ..... 28

3.3 මාර්ගගත FoE සහ FoRB ..... 30

3.4 'බියසුළු වීමේ ආවරණය' සහ සිවිල්-සමාජ ප්‍රතිචාරය ..... 32

3.5 'අප්‍රසන්න නමුත් නීත්‍යනුකූල' කථනයට මුහුණ දීම ..... 32

4 වන පරිච්ඡේදය ..... 35

නිර්දේශ ..... 35

නීති සම්පාදකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් ..... 36

අධිකරණය ..... 37

නීතිය බලාත්මක කරන ආයතන ..... 37

සිවිල් සමාජය සහ මානව හිමිකම් ආරක්ෂකයින් ..... 38

ආගමික නායකයින් සහ ඇදහිල්ල මූලික කරගත් ආයතන ..... 38

මාධ්‍ය සහ ඩිජිටල් වේදිකා ..... 39



# හැඳින්වීම

ආගමික හෝ ඇදහීමේ නිදහස (FoRB) සහ ප්‍රකාශනයේ නිදහස (FoE) ඇතුළු මූලික අයිතිවාසිකම් විසින් අයුතු රාජ්‍ය මැදිහත්වීම් වලින් පුද්ගලයන් ව ආරක්ෂා කිරීමට උත්සාහ කෙරෙන අතර ඒවා හිතකර සහ නිදහස් සමාජයක ලක්ෂණයන් වේ. FoE සහ FoRB අතර සංකීර්ණ සම්බන්ධතාවයක් පවතින අතර, එකී සම්බන්ධය ශ්‍රී ලංකාව වැනි විවිධත්වයකින් යුතු බහු-ආගමික සන්දර්භයක් තුළ වඩාත් ඉහළ මට්ටමේ සංකීර්ණත්වයක් උසුලයි.

ශ්‍රී ලංකාවේ නීති රාමුව යටතේ මෙන්ම ජාත්‍යන්තර නීති මගින් සහ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR) සහ සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (ICCPR) යටතේ FoRB සහ FoE යන ද්විත්වයම ආරක්ෂා වී ඇත.

පුද්ගලයෙකුගේ සිතුවිලි සහ ඒවා ඔවුන් විසින් බාහිරව ප්‍රකාශ කරන ආකාරය අතර නෛසර්ගික සම්බන්ධයක් ඇති බැවින්, FoRB සහ FoE යන දෙකම වෙන් කළ නොහැකි ලෙස එකිනෙක සමග බැඳී පවතී.[1] මෙකී දෙවැදෑරුම් නිදහස රාජ්‍යය සම්බන්ධ කටයුතුවල දී පුරවැසියන් හට එකිනෙකා ලෙස, තනි තනිව හෝ කණ්ඩායමක් ලෙස සම්බන්ධ වීමේදී අත්‍යවශ්‍ය වන අතර ඒවා ස්වාභාවික (කෙනෙකුගේ හෘද සාක්ෂියට සහ අදහස් ප්‍රකාශ කිරීමට අදාළ) සහ අහිමි කළ නොහැකි අයිතිවාසිකම් ලෙස දීර්ඝ කාලයක සිට සලකනු ලැබේ.[2] මානව හිමිකම් රාමුව ස්ථාපිත වූ යුගයේ සිට ඔවුන් ඒවා එකිනෙක සමග සමීපව බැඳී තිබී ඇති අතර, UDHR සහ ICCPR හි 18 සහ 19 වගන්ති ලෙස ඔවුන් එකිනෙකාට යාබදව පිහිටා ඇත.[3] සියලුම මානව හිමිකම් ලෙසින්ම, මෙකී

ස්වාධීනත්වයන් ද බාධාවන් රහිතව ක්‍රියාත්මක කිරීම මගින් රාජ්‍යය වගකිව යුතු ආස්ථානයක රඳවා ගැනීම සඳහා විධික්‍රමයක් ලෙස ක්‍රියා කෙරෙන අතර එනිසා එය හිතකර ප්‍රජාතන්ත්‍රවාදයක් සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වනවා සේම බහුතරයේ අදහස් උදහස් සහ ක්‍රියාවන්ට අභියෝග කිරීමට සුළු ජාතීන්ට හා විරුද්ධ මතධාරීන්ට බලය ලබා දෙයි.

යමෙකුගේ ආගම ප්‍රකට කිරීමේදී, FoRB සහ FoE අතර අභිසාරීතාවයක් පවතින අතර, එනිසා එක් අයිතියක් ක්‍රියාත්මක කිරීම අනෙකාගේ නීත්‍යනුකූල ක්‍රියාවන්ට බාධාවක් නොවන බව සහතික කිරීම සඳහා සියුම් සමබරතාවක් මෙහිදී අවශ්‍ය වේ. (උදා: ඔහුගේ/ඇයගේ ඇදහීමක් හේතුකොට ගෙන එකී පුද්ගලයාට එරෙහිව ප්‍රචණ්ඩත්වය උසිගැන්වීම වැළැක්වීම අරමුණු කොට ගෙන FoE මත සීමාවන් පනවනු ලැබීම, මෙකී අයිතිවාසිකම් ද්විත්වය ක්‍රියාත්මක කිරීමට යාමේ දී ඒවා අන්තර්ඡේදනය වන ප්‍රධාන අවස්ථාවකි.) එබැවින්, FoRB සහ FoE අන්තර්ඡේදනය කිරීමට හේතුවන ආගම, ඇදහීම සහ දේවධර්මය ට අදාළ ප්‍රකාශනයන් වෙතට මෙම වාර්තාවේ මූලික අවධානය යොමු කෙරෙනු ලැබේ. මෙයට කෙනෙකුගේ ඇදහීම් ප්‍රකාශ කිරීමට ඇති ධනාත්මක අයිතිය සහ එම ඇදහිලි මත පදනම්ව වෙනස්කොට සලකනු ලැබීමෙන් හෝ ප්‍රචණ්ඩත්වයට භාජනය වීමෙන් ආරක්ෂා වීමට ඇති ඍණාත්මක අයිතිය යන දෙකම ඇතුළත් වන අතර එමගින් ස්ථාවර, බහුවිධ හා සාමකාමී සමාජයක් පවත්වා ගැනීමට සහ සිවිල් සහභාගීත්වය දිරිමත් කිරීමට සහ සංවාදය හා සහයෝගීතාවය පෝෂණය කිරීමට පදනමක් නිර්මාණය කරනු ලබයි.

අවාසනාවකට මෙන්, ශ්‍රී ලංකාව ඇතුළුව ලොව පුරා සිටින ජනතාව, FoRB සහ FoE යන දෙකටම අදාළව තම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේදී දැඩි සීමාවන් අත්විඳිති. විශේෂයෙන් ශ්‍රී ලංකාව තුළ පශ්චාත් යුධ සමයේදී එවැනි සිදුවීම්වල වැඩිවීමක් අත්දැකීමට ලැබී ඇත.[4] රාජ්‍ය ව්‍යුහයන් තුළ පැතිරී පවත්නා ආයතනික පක්ෂග්‍රාහීත්වයන් සහ ගැඹුරින් මුල් බැසගත් සාංදෘෂ්ටික නොසන්සුන්කම් විසින්, ජනවාර්ගික හා ආගමික ප්‍රජාවන් අතර ආතතීන් චිරස්ථායී ලෙස පවත්වා ගෙන ගොස් ඇත. විශේෂයෙන් ගත්කල වගවීම තහවුරු කිරීම සහ යුක්තිය සඳහා ඇති ප්‍රවේශය සහතික කිරීම මෙන්ම FoRB සහ FoE උල්ලංඝනයන් නැවත ඇති නොවීම වැනි සැලකිය යුතු අභියෝග මෙම ගතිකත්වයන් විසින් ඉදිරිපත් කෙරෙනු ලැබේ. වෛරී කථනයට ගොදුරු වීම සහ තමන්ගේ ආගමික ප්‍රකාශනයට සීමාවන් පනවනු ලැබීම යන දෙආකාරයෙන්ම සුළුතර ආගමික ප්‍රජාවන් අවදානමට ලක්වන අතර, රාජ්‍යය සහ නීතිය බලාත්මක කිරීමේ පද්ධතිය තුළ ගොඩනැගී ඇති පක්ෂග්‍රාහීත්වයන් නිසා යුක්තිය ඉටුකර ගැනීමට ප්‍රමාණවත් පිළිසරණක් නොමැතිකම හේතුකොට ගෙන එය තවදුරටත් උග්‍ර අතට හැරේ.

මෙම වාර්තාව මගින් FoRB සහ FoE අතර සම්බන්ධතාවය පරීක්ෂා කෙරෙනු ඇති අතර, ජාත්‍යන්තර මානව හිමිකම් රාමුවක් තුළ මෙන්ම විශේෂයෙන් ශ්‍රී ලාංකික සන්දර්භය තුළ මෙම අයිතිවාසිකම් දෙකෙහි සංකීර්ණ හා අනුපූරක ස්වභාවය සාකච්ඡාවට බඳුන් වනු ඇත. නීත්‍යනුකූලව පිළිගත් සම්මතයන්ට අනුකූලව, ආගමික ප්‍රකාශනයන් කෙරෙහි සීමාවන් පැනවීම පිළිබඳව ද මෙහිදී සලකා බලනු ඇත. සීමිත නඩු පැවරීම් සහ රජයේ අඛණ්ඩ අකාර්යක්ෂමතාව විසින් සුළුතර ප්‍රජාවන් අතර අනාරක්ෂිත භාවයක් සහ අපරාධකරුවන් තුළ දඬුවම් නොලැබෙනු ඇතැයි යන හැඟීමක් ඇති කර ඇති බැවින්, පවත්නා නීතිමය විධිවිධාන හමුවේ වුවද, ශ්‍රී ලංකාව තුළ වෛරී කථනය දිගටම ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න ඊළඟ පරිච්ඡේදවල විශ්ලේෂණාත්මකව ගවේෂණය කෙරෙනු ඇත. අනෙක් අතට, මෑත කාලීන අධිකරණ තීන්දු, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම විසින් නිකුත් කරන ලද නිර්දේශ සහ නියෝග සහ FoRB උල්ලංඝනය කිරීම් විමර්ශනය කිරීමේදී පොලිස් හැසිරීම් වල දක්නට ලැබුණු වර්ධනයන් ඇතුළු නැගී එන ධනාත්මක ප්‍රවණතාවන් ද වාර්තාව විසින් ඉස්මතු කරනු ලබයි.

1 වන පරිච්ඡේදයෙන් FoRB සහ

FoE පාලනය කෙරන නෛතික රාමුව සැකෙවින් පරීක්ෂා කරනු ඇත. 2 වන පරිච්ඡේදයේ මෙම නිදහස ප්‍රායෝගිකව අන්තර්ක්‍රියා කර ඇති ආකාරය - එනම් අන්තර්ඡේදනය, අභිසාරීතාවය සහ අදාළ අභියෝග පිළිබඳ විශ්ලේෂණයක් ඇතුළත් වේ. 3 වන පරිච්ඡේදයේ දී සිද්ධි නායකයින් සමග නාභිගත කණ්ඩායම් සාකච්ඡාවන් හරහා විශේෂයෙන් 2023 සිට මේ සම්බන්ධයෙන් වන ශ්‍රී ලාංකික අත්දැකීම කෙරෙහි අවධානය යොමු කරනු ඇත. ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රකාශනය සඳහා වඩාත් දිරිගන්වනසුළු වාතාවරණයක් නිර්මාණය කිරීම උදෙසා මෙම වාර්තාවේ අනාවරණයන්ගෙන් උකහා ගන්නා ලද නිර්දේශයන්, 4 වන පරිච්ඡේදයේ දක්වා ඇත.





# 1 වන පරිච්ඡේදය

## 1. නීතිමය රාමුව

මෙම පරිච්ඡේදය මගින් FoRB සහ FoE ක්‍රියාත්මක කිරීමට අදාළවන ජාත්‍යන්තර නීති රාමුව සහ ශ්‍රී ලංකාව තුළ දැනට පවතින දේශීය නීති රාමුව පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයයි. මෙකී අයිතිවාසිකම් වෙනුවෙන් සළසා ඇති රැකවරණයේ පරිමාණය, රාජ්‍ය බැඳියාවන් සහ නීතිය යටතේ අවසර ලත් සීමාවන් ඊට ඇතුළත් වන අතර ශ්‍රී ලංකාව තුළ FoRB සහ FoE පූර්ණ හා නිදහස් ලෙස ක්‍රියාත්මක වීමට බාධා කරන ජාත්‍යන්තර සහ දේශීය ප්‍රමිතීන් අතර ඇතැම් හිඩැස් විශේෂ කොට දක්වයි.

### 1.1 ජාත්‍යන්තර නීති රාමුව

**ආගමික හෝ ඇදහීමේ නිදහස (FoRB) මූලික මානව අයිතිවාසිකමක් ලෙස**

FoRB යනු UDHR සහ ICCPR යටතේ ආරක්ෂා කර ඇති මූලික මානව අයිතිවාසිකමකි.[5] එහි තේරුම සෑම පුද්ගලයෙකුටම ආගමක් හෝ ඇදහීමක් තිබීමට හෝ නොතිබීමට, ඕනෑම වේලාවක තම ආගම හෝ ඇදහීම වෙනස් කිරීමට, තම ආගම හෝ ඇදහීම තනිව හෝ අන් අය සමග, පෞද්ගලිකව හෝ ප්‍රසිද්ධියේ පිළිපැදීමට, ප්‍රකාශ කිරීමට සහ බෙදා ගැනීමට අයිතියක් ඇති බවයි. FoRB යනු විශ්වීය අයිතියක් වන අතර එයින් අදහස් වන්නේ ඔවුන්ගේ පසුබිම, තත්ත්වය හෝ ඔවුන් අදහන දෑ කුමක් වුවත් එකී අයිතිය සෑම කෙනෙකුටම පොදු වන බවයි. වන්දනා කිරීම, අනුමනය කිරීම, පුහුණු කිරීම සහ ඉගැන්වීම තුලින් ආගම හෝ ඇදහීම ප්‍රකාශ කිරීමේ නිදහස යන්නට පුළුල් පරාසයක ක්‍රියාකාරකම් ඇතුළත් වන බව මානව හිමිකම් කමිටුව විසින් පිළිගෙන ඇත.[6]

පුද්ගලයන් හට තම ආගම හෝ ඇදහීම තමන්ගේම ආකාරයෙන් අර්ථකථනය කිරීමට නිදහස තිබේ. එය ප්‍රධාන ධාරාවේ ආගමකට හෝ ඇදහීමකට අභියෝග කිරීමක් වුවද, ආගමක් ප්‍රශ්න කිරීමට, ඒ පිළිබඳව එකඟ නොවීමට හෝ ඉන් ඉවත් ව යාමට ඇති අයිතිය මීට ඇතුළත් වේ.[7] මෙම අයිතිය මගින් මිනිසුන්ට තම ආගම හෝ ඇදහීම අනුමනය කිරීමට, වෙනස් කිරීමට හෝ අත්හැරීමට බල කිරීමට ලක්වීමෙන් හෝ පීඩනයට ලක්වීමෙන් ආරක්ෂා කරනු ලබයි. ආගමික සුළුතරයන්ට අයත් අයවලුන් හට තම ප්‍රජාවේ අනෙක් අය සමග එක්ව තම ආගම ඇදහීමට සහ ප්‍රකාශ කිරීමට අයිතියක් ඇති බව ICCPR පනත තවදුරටත් සඳහන් කරයි.[8]

#### FoRB සම්බන්ධයෙන් වන රාජ්‍ය බැඳීම්

FoRB සඳහා වන අයිතිය ආරක්ෂා කිරීමෙහි ලා පවතින රාජ්‍ය බැඳීම්වලට, තෙවන පාර්ශවයන් හෝ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් විසින් මෙම අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට එරෙහිව යමින් එවා

ආරක්ෂා කිරීම වැනි ධනාත්මක බැඳීම් මෙන්ම නීත්‍යනුකූලව පිළිගත් පරාමිතීන් තුළ බාධාවකින් හෝ වෙනස්කොට සැලකීමකින් තොරව පුද්ගලයන්ට ස්වකීය ආගමික හෝ ඇදහීමේ නිදහස ක්‍රියාත්මක කිරීමට හැකි බව සහතික කිරීම සඳහා වන සෘණාත්මක ආකාරයේ බැඳීම් යන දෙකොටස ම ඇතුළත් වේ.[9]

## FoRB හි අභ්‍යන්තර සහ බාහිර මානයන්

FoRB හි අභ්‍යන්තර සහ බාහිර මාන සමීපව විමසා බැලීමේ දී, FoRB විෂය පරාසයන් දෙකක් මත භුක්ති විඳිය හැකි බව පැහැදිලිය - පළමුව, ආගමක් හෝ ඇදහීමක් දැරීමට හෝ අනුගමනය කිරීමට ඇති අයිතිවාසිකම ඇතුළත් වන අභ්‍යන්තර පරාසයක් තුළ (චින්තනයේ නිදහස යටතේ වඩාත් පුළුල් ලෙස ආවරණය කෙරේ), සහ දෙවනුව මෙම ආගම හෝ ඇදහීම තනි තනිව හෝ සාමූහිකව විද්‍යාමාන කිරීම හෝ ප්‍රකාශ කිරීම යන බාහිර පරාසය තුළ.

## අවසර ලත් සීමාවන්

FoRB ක්‍රියාවට නැංවීමේ අභ්‍යන්තර පරාසය සම්බන්ධයෙන් ගත්කල පුද්ගලයෙකුට නිරපේක්ෂ චින්තන නිදහස පවතින අතර (එනම් එය කිසිදු ආකාරයකින් සීමා කළ නොහැක) - මහජන ආරක්ෂාව, මහජන සාමය, සෞඛ්‍යය, සදාචාරය හෝ වෙනත් පුද්ගලයින්ගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීමට අවශ්‍ය වූ විට ආදී වශයෙන් වූ විශේෂිත අභිමතාර්ථයන් කිහිපයක් සඳහා තම ආගම හෝ ඇදහීම ප්‍රකට කිරීමට හෝ ප්‍රකාශ කිරීමට ඇති නිදහස නීතිය විසින් සීමා කිරීමකට බඳුන් කළ හැකිය.[10]

## අනෙකුත් අයිතිවාසිකම් සමග FoRB හි අන්‍යෝන්‍ය රඳා පැවැත්ම

FoRB රික්තයක් තුළ භුක්ති විඳිය නොහැකි අතර අනෙකුත් මානව හිමිකම් භුක්ති විඳීම සමග එය අන්‍යෝන්‍ය වශයෙන් රඳා පවතී. ප්‍රකාශනයේ නිදහස (FoE) යනු FoRB හි පූර්ණ සහ නිදහස් ක්‍රියාකාරිත්වය සමග සමීප සබඳතාවක් ඇති එවැනි අයිතියක් වන අතර විශේෂයෙන් එය බාහිරව ප්‍රකට කිරීම, FoRB භුක්ති විඳීම සමග ඡේදනය වන අතර ඒ පිළිබඳව මෙම වාර්තාවේ මූලික අවධානය යොමු වේ.

## මූලික මානව අයිතිවාසිකමක් ලෙස අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස (FoE)

ජාත්‍යන්තරව, UDHR සහ ICCPR යන දෙකම යටතේ FoE ආරක්ෂා කර ඇත.[11] මෙම අයිතිය මගින් සෑම කෙනෙකුටම තමන්ගේ ම අදහස් දැරීමට සහ බියකින් හෝ බාධාවකින් (රජයෙන්, සංවිධානවලින් හෝ වෙනත් පුද්ගලයින්ගෙන්) තොරව ඒවා ප්‍රකාශ කිරීමට නිදහස පවතින බව සහතික කරනු ලබයි. කතා කිරීම, ලිවීම, මුද්‍රණය කිරීම හෝ ඩිජිටල් මාධ්‍ය භාවිතා කිරීම වැනි ඕනෑම ක්‍රමයක් හරහා තොරතුරු සහ අදහස් සෙවීමට, ලබා ගැනීමට සහ බෙදා ගැනීමට ඇති අයිතිය ද එයට ඇතුළත් වේ. ආගමික අදහස් ප්‍රකාශ කිරීම ඇතුළුව පුළුල් පරාසයක ප්‍රකාශනයකට මෙම අයිතිය අදාළ වේ. එබැවින්, එය විශ්වාසය දරන්නාට කම්පනය, තරහ හෝ රිදවීමක් ඇති කරන්නක් ලෙස සලකනු ලැබුව ද, ආගමික ඇදහීම් හෝ අදහස් විවේචනය කිරීම මෙම නිදහස යටතේ ආරක්ෂා කෙරී ඇත.[12] **මානව හිමිකම් සම්මතයන් පවතින්නේ පුද්ගලයන් ආරක්ෂා කිරීමට මිස කිසිදු ඇදහීම් පද්ධතියක් ආරක්ෂා කිරීම වෙනුවෙන් නොවීම මීට හේතුව යි.**[13] මෙහි දී වැදගත් කරුණ වන්නේ, ප්‍රකාශනයේ නිදහස මගින් සියලු ම ආකාරයේ මතවාදයන් - එනම් ජනප්‍රිය හෝ පුළුල් ලෙස පිළිගත් ඒවා පමණක් නොව, මතභේදාත්මක හෝ අහිතකර යැයි හැඟෙන ඒවා ද ආරක්ෂා කරනු ලැබීමයි.

## FoE සම්බන්ධයෙන් වන රාජ්‍ය බැඳීම්

තම පුරවැසියන්ගේ FoE මත තනි පුද්ගලයින් හෝ සංවිධාන ඇතුළු ඕනෑම පාර්ශ්වයකින් සිදු වන්නා වූ අත පෙවීම් වලින් ඔවුන් ආරක්ෂා කිරීම සඳහා රාජ්‍යයන් වගකිව යුතුය. මෙයින් අදහස් කරන්නේ කිසිවෙකු සතු තම අදහස් ප්‍රකාශ කිරීමේ හෝ තොරතුරු බෙදා ගැනීමේ

හැකියාව අසාධාරණ ලෙස සීමා නොකරන බවට රාජ්‍යය සහතික විය යුතු බවයි.[14]

### අවසර ලත් සීමාවන්

කෙසේ වෙතත්, මෙම අයිතිය නිරපේක්ෂ නොවන අතර අන් අය වෛරය හෝ ප්‍රචණ්ඩත්වය කෙරෙහි පොළඹවා නොගැනීමේ යුතුකම සහ වගකීම ද එයට සමගාමී ව ගමන් කරන අතර නියම කෙරෙන අරමුණු සඳහා අවශ්‍ය පරිදි නීතියෙන් සීමා කිරීම් සිදු කළ හැකිය.[15]

නීතියෙන් සපයා ඇති සීමාවන් ICCPR විසින් නිදහස් භාෂණය මත පනවා ඇති අතර ඒවා පහත අවස්ථාවන් සඳහා අවශ්‍ය වනු ලබයි:

(අ) අන් අයගේ අයිතිවාසිකම් හෝ කීර්ති නාමයට ගරු කිරීම සඳහා
(ආ) ජාතික ආරක්ෂාව හෝ මහජන සාමය හෝ මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම සඳහා

ඊට අමතරව, වෙනත් කරුණු අතර, වෙනස්කොට සැලකීම, එදිරිවාදීකම හෝ ප්‍රචණ්ඩත්වය උසිගන්වන ආගමික වෛරය නීතියෙන් තහනම් කළ යුතු බව ICCPR මගින් දක්වා ඇත.[16] **මානව හිමිකම් කමිටුවේ අදහස වී ඇත්තේ, එවැනි උසිගැන්වීමක් ලෙස සැලකෙන කථනය සඳහා වන ඕනෑම සීමාවක්, නිදහස් කථනයට අදාළ අවසර ලත් සීමාවන්ට ද අයත් විය යුතු**[17] බව වන අතර එමගින් නිදහස් කථනය මත ඇති සීමාවන් සහ උසිගැන්වීම් තහනම් කිරීම අතර ඇති අවිවාදිත සම්බන්ධය පෙන්නුම් කරන බවයි.[18] පුද්ගලයෙකුගේ FoE මත පැනවෙන ඕනෑම සීමාවක් මගින් එම අයිතිය ද අනතුරේ හෙළීමට ඉඩක් නොමැති බව ද එම කමිටුව විසින් සටහන් කර ඇත.[19] ICCPR හි දක්වා ඇති අවසර ලත් හේතුවක් වෙනුවෙන් සීමාවක් පැනවීම ප්‍රමාණවත් සාධාරණීකරණයක් නොවන බවත්, එම ඉලක්කය ආරක්ෂා කිරීම සඳහා එකී සීමා කිරීම සැබවින්ම අවශ්‍ය විය යුතු බවත් මානව හිමිකම් කමිටුව පැහැදිලි කර ඇත. 'අවශ්‍යතාවය' පිළිබඳ මෙම අදහස මගින් එකී සීමා කිරීම සමානුපාතික විය යුතු බව ද අදහස් කරයි - එනම්, එම ඉලක්කය ආරක්ෂා කිරීමට සත්‍ය ලෙසම අවශ්‍ය ප්‍රමාණයට වඩා එකී සීමාවන් බල පැවැත්විය නොහැක යන්න යි.

## 1.2 දේශීය නීති සම්පාදනය

ශ්‍රී ලංකාව ICCPR අනුමත කර ඇති අතර, FoRB සහ FoE යන දෙකොටස ම ආරක්ෂා කිරීම සඳහා ජාත්‍යන්තර නීතිය යටතේ තමන්ගේ ඇති කැපවීම තහවුරු කර ඇත. කෙසේ වෙතත්, ද්වෛතවාදී රටක් වීම හේතුකොට ගෙන,[20] හුදෙක් එසේ අනුමත කළ පම න් ජාත්‍යන්තර සම්මුතියේ අන්තර්ගතය දේශීය වශයෙන් බලාත්මක කළ හැකි වන්නේ නැත. එබැවින්, පහත දැක්වෙන කොටස මගින් FoRB සහ FoE යන දෙකටම අදාළ වන දේශීය නීතිමය විධිවිධාන කෙටියෙන් සලකා බලනු ඇත.

### ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන විශ්ලේෂණය කිරීම

#### FoRB හි ව්‍යවස්ථාමය ආරක්ෂාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන වගන්තිය යටතේ, ආගමක් හෝ ඇදහීමක් පිළිගැනීමට යම් අයෙකුට ඇති අභ්‍යන්තර නිදහස (එය නීතියෙන් කිසිදු සීමාවකට යටත් නොවේ) ට අදාළව සහ 14 (1) (ඉ) වගන්තිය යටතේ අයෙකුගේ ආගම ප්‍රකට කිරීමේ බාහිර නිදහසට අදාළ වන ලෙස ශ්‍රී ලංකාව තුළ FoRB හඳුනාගෙන ඇත.

#### ආගම ප්‍රකට කිරීම පිළිබඳ සීමාවන්

ජාත්‍යන්තර නීති රාමුව හා සමානව ම, බාහිර ප්‍රකට කිරීම ද නීතියෙන් නිශ්චිතව දක්වා ඇති අභිමතාර්ථයන් සඳහා සීමාවන්ට යටත් විය හැකිය.[21] ICCPR මෙන් නොව, ශ්‍රී ලංකාව විසින් "පොදු සුභසාධනය" සඳහා සහ ජාතික ආරක්ෂාව සඳහා පවා එකී සීමාවන්ට අවසර දෙනු ලබයි[22] - එය ජාත්‍යන්තර ප්‍රමිතීන් මගින් ඉඩ ලබා නොදෙන්නකි.[23] මෙම පුළුල් සීමාවන් නිසා ආගමික පොලිස්කරණයක් නිරන්තරයෙන් සිදුවෙමින් පවතින අතර, එහිදී බලධාරීන් බොහෝ

විට මුල්පෙළේ ආගමික කණ්ඩායම්වල පීඩනයට ප්‍රතිචාර දක්වන්නේ සුළු ජාතීන් හට අවාසිදායක වන අන්දමකටය.[24]

## ආගමික ප්‍රකාශනය පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණ අර්ථ නිරූපණය

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ආගම ප්‍රකාශ කිරීමේ නිශ්චිත ආකාර හතරක් පමණක් - නමස්කාරය, පිළිපැදීම, පුහුණු කිරීම සහ ඉගැන්වීම - ආරක්ෂා කරන බව ශ්‍රේෂ්ඨාධිකරණය මෑතකදී තීන්දු කළ අතර, මෙය නීතියෙන් ආරක්ෂා කර ඇති අසංක්ෂිප්ත ආගමික ප්‍රකාශන ලැයිස්තුවක් බවත් පැවසීය. අභ්‍යන්තර විශ්වාසය යන්න නිරපේක්ෂ වුවත්, බාහිර ආගමික ප්‍රකාශන අනෙක් අයට බලපෑම් කළ හැකි බවත්, එබැවින් එය නියාමනය කිරීමකට බඳුන් විය හැකි බවත් අධිකරණය තවදුරටත් සඳහන් කළේය. බාහිර ආගමික ප්‍රකාශනය 14 (1) (අ) (ප්‍රකාශනයේ නිදහස) හෝ 14 (1) (ඉ) (ආගමික හෝ ඇදහීමේ නිදහස ප්‍රකට කිරීම) යන වගන්තිය යටතේ වැටිය යුතු බවත්,[25] 14(1)(ඉ) වගන්තිය යටතේ ආගමක හෝ ඇදහීමක බාහිර ප්‍රකට කිරීමක් ලෙස සුදුසුකම් නොලබන හැසිරීමක්, (මුද්‍රිත) ප්‍රකාශනයක් හරහා වුවද 14(1)(අ) ව්‍යවස්ථාව යටතේ ආරක්ෂිත භාෂණය ලෙස නැවත අර්ථකථනය කළ නොහැක.[26]

## FoE සම්බන්ධයෙන් වන ව්‍යවස්ථාපිත ආරක්ෂාවන් සහ සීමාවන්

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් FoE ආරක්ෂා කරන නමුත්[27] වාර්ගික හෝ ආගමික සමගිය, පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අපහාස කිරීම, අපහාසය සහ උසිගැන්වීම වැනි හේතූන් මත යම් යම් සීමාවන්ට ඉඩ සලසයි.[28] මෙයින් අපහාස කිරීම සහ වරදකට පෙළඹවීම ICCPR විසින් FoE මත අවසර ලත් සීමාවන් ලෙස පිළිගනු ලබන අතර ම,[29] අනෙකුත් කාරණා කිසිවක් එලෙස සීමාවක් කිරීම සඳහා හේතූන් ලෙස ICCPR විසින් පිළිගනු නොලැබේ.[30] ජනප්‍රිය අදහස් පමණක් නොව අහිතකර හෝ කරදරකාරී ලෙස සමාජය විසින් හඳුනා ගන්නා අදහස් ද නිදහස් භාෂණය විසින් ආවරණය කෙරෙන බව ශ්‍රේෂ්ඨාධිකරණය පවසා තිබේ.[31]

## සමානාත්මතාවයණී වෙනස්කොට නොසැලකීම සහ බුද්ධාගමේ විශේෂිත තත්ත්වය

තමන්ගේම අයිතිවාසිකම් සහ නිදහස භුක්ති විඳීමේදී අන් අයගේ අයිතිවාසිකම් සහ නිදහසට ගරු කිරීම ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නියම කර සිටී.[32] එපමණක් නොව, 12 වන වගන්තිය සැමට සමානාත්මතාවය සහතික කරන අතර ජාතිය, ආගම, භාෂාව, කුලය, සමාජ භාවය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය මත පදනම්ව වෙනස්කොට සැලකීම තහනම් කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සියලුම ආගම් ආරක්ෂා කළද, එය බුද්ධාගමට විශේෂ තත්වයක් ලබා දෙන අතර බුද්ධ ශාසනය ප්‍රවර්ධනය කරන ලෙස රාජ්‍යයට නියම කර සිටියි.[33] මෙම වගන්තිය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට පටහැනි වන අතර, ඒවායේ සඳහන් වන්නේ එක් ආගමකට වරප්‍රසාදිත ස්ථානයක් ලබා දීම - හෝ බහුතර ආගමක් තිබීම - මානව හිමිකම් සීමා කිරීමට හෝ අනෙකුත් ආගමික කණ්ඩායම් හෝ නොඇදහිලිවන්තයන්ට වෙනස්කොට සැලකීමට භාවිතා කළ නොහැකි බවයි.[34] විශේෂයෙන්ම, එය පුළුල් ලෙස විවාදයට ලක්ව ඇති කරුණක් වනවා සේම ඇතැම් අවස්ථාවල බලධාරීන් විසින් එය බෞද්ධ අවශ්‍යතා සඳහා යොදාගැනෙන අතර, සුළුතර ආගමික ප්‍රජාවන්ට එරෙහි අපහාසාත්මක ප්‍රකාශනයන් පිළිබඳ බොහෝ විට විමර්ශනය නොකෙරේ.[35]

## පුළුල් විධායක බලතල සහ දුර්වල ආරක්ෂක විධිවිධාන

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තම ආගම හෝ ඇදහීම ප්‍රකට කිරීමේ අයිතිය ආරක්ෂා කළද, අන්‍යාගමනය කිරීම, ආගම මාරු කිරීම සහ ආගමික වන්දනා ස්ථාන ගොඩනැගීම වැනි ක්‍රියාකාරකම් වලදී සුළුතර ආගමික කණ්ඩායම් තවමත් සීමාවන්ට මුහුණ දෙති.[36] එක් ප්‍රධාන සාධකයක් වන්නේ මූලික නිදහස සීමා කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රජයට ලබා දී ඇති පුළුල් බලතලයි. භාෂණයේ නිදහස සීමා කිරීමේදී එම සීමාවන් 'නීතිය මගින් පැනවිය යුතු' බවත් ඒවා 'අත්‍යවශ්‍ය' විය යුතු

බවත් අවධාරණය කරන ICCPR මෙන් නොව,[37] ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අපේක්ෂා කරන්නේ අදාළ සීමාවන් 'නීතියෙන් නියම කර තිබීම' පමණක් වන අතර එහිදී එම සීමා පැනවීමේ අත්‍යවශ්‍යතාවය ඔප්පු කිරීමේ අවශ්‍යතාවයක් පැන නොනගී.[38] "නීතිය" යන්නට මහජන ආරක්ෂක ආඥා පනත යටතේ විධායකය විසින් සකස් කරන ලද හදිසි නීති රෙගුලාසි ද ඇතුළත් වන අතර, ඒවා බොහෝ විට සැලකිය යුතු පාර්ලිමේන්තු විවාදයකින් තොරව සම්මත වේ. මින් අදහස් වන්නේ, ජාතික ආරක්ෂාව හෝ මහජන සාමය සුරැකීම යන කරුණු සාධාරණීකරණයන් ලෙස පොදුවේ ඉදිරිපත් කරමින්, විධායක නියෝග හරහා අයිතිවාසිකම් සීමා කිරීමට රජයට හැකියාව පවතින බවයි.[39]

එහි ප්‍රතිඵලයක් වශයෙන්, අයිතිවාසිකම් සීමා කිරීම සඳහා රජයට පුළුල් අභිමතයක් හිමි වන අතර, නිදහසේ තම ආගම ඇදහීමට සහ ප්‍රකාශ කිරීමට උත්සාහ කරන පුද්ගලයන්ට මෙය සැලකිය යුතු අභියෝගයන් මතු කරයි.

## ICCPR පනත

### ICCPR පනතේ බලාත්මක කිරීම සහ විෂය පථය

ICCPR පනත (මෙම කොටසේ අරමුණු සඳහා මින් ඉදිරියට 'පනත' ලෙස හඳුන්වනු ලැබේ), 2007 දී පනවන ලද අතර, එය සිදු කරන ලද්දේ පවතින නීති යටතේ හඳුනාගෙන නොමැති, ICCPR ඇතැම් වගන්ති බලාත්මක කිරීමේ අරමුණ ඇතිව බව කියනු ලැබේ.[40] ඒ අනුව, පනතට ICCPR හි 20 වන වගන්තිය ඇතුළත් කර ඇති අතර, එමගින්, වෙනත් කරුණු අතර, වෙනස්කොට සැලකීමකට, එදිරිවාදිකමකට හෝ ප්‍රචණ්ඩත්වයට පෙළඹවීමක් ඇති වන ආකාරයේ ආගමික වෛරය පැතිරවීම, ඕනෑම තැනැත්තෙකු සඳහා දණ්ඩනීය වරදක් බවට පත් කර ඇත.[41] එවැනි වරදක් කිරීමට උත්සාහ කිරීම, ආධාර කිරීම සහ අනුබල දීම සහ තර්ජනය කිරීම ද මෙම වගන්තිය යටතේ වරදක් වන අතර,[42] වරදකරුවෙකු කරනු ලැබුවහොත් වසර දහයක් දක්වා බරපතල වැඩ සහිත සිර දඬුවමක් නියම වනු ඇත.[43]

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සන්දර්භය සහ ව්‍යවස්ථාදායක හිඩැස්

ICCPR හි 20 වන වගන්තිය ඇතුළත් කිරීම දෙස බැලිය යුත්තේ, FoE සඳහා වන අයිතිවාසිකම මෙන්ම ඒ සඳහා පැනවිය හැකි සීමාවන් දැනටමත් පිළිගෙන ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක සන්දර්භය තුළ සිට වන අතර එම ව්‍යවස්ථාපිත රාමුව ජාත්‍යන්තර නීතිය යටතේ ලබා දී ඇති රැකවරණයට වඩා පටු පරාසයක පවතින්නකි. FoE සඳහා ඇති සීමාවන් සහ උසිගැන්වීම් තහනම් කිරීම අතර ඇති සමීප සම්බන්ධතාවය සඳහා ඇති ජාත්‍යන්තර පිළිගැනීම සැලකිල්ලට ගෙන, දේශීය නීතියේ නීතිමය රික්තයක් නිර්මාණය කරන, වෙනස්කොට සැලකීම, එදිරිවාදිකම හෝ ප්‍රචණ්ඩත්වය සඳහා පෙළඹවීමක් වන ආගමික වෛරය තහනම් කිරීම එයට ඇතුළත් කරන අතර ම, FoE හි සම්පූර්ණ විෂය පථය සහ එහි අවසර ලත් සීමාවන් ඇතුළත් කිරීමට මෙම පනත අසමත් වේ.[44]

### ජාත්‍යන්තරව පිළිගත් ආරක්ෂක විධිවිධාන නොමැති වීම

වෛරී ප්‍රකාශන නඩු තීරණය කිරීමේදී, පනත මගින් ජාත්‍යන්තරව පිළිගත් නීත්‍යනුකූලභාවය, අත්‍යවශ්‍යතාවය සහ සමානුපාතිකත්වය පිළිබඳ කොටස් තුනකින් යුත් පරීක්ෂණය ඇතුළත් කර නොමැති අතර, ජාත්‍යන්තර නීතිය යටතේ පිළිගත් "උසිගැන්වීමේ" සීමාව පැහැදිලිව ප්‍රකාශ නොකරයි. ශ්‍රී ලංකාව තුළ වෛරී ප්‍රකාශ සහ උසිගැන්වීම් පාලනය කරන නෛතික රාමුවේ සංගතිකභාවය සහ නීතිමයභාවය තවදුරටත් පලුදු කිරීමට මෙකී පැහැර හැරීම හේතු වේ.

### පනත අනිසි ලෙස භාවිතා කිරීම සහ මූලික අයිතිවාසිකම් කෙරෙහි ඇති බලපෑම

පනත යටතේ වෙනස්කොට සැලකීමට, එදිරිවාදිකමට සහ ප්‍රචණ්ඩත්වයට උසිගැන්වීම අපරාධයක් ලෙස සලකනු ලැබුවද, බහුතර ජනතාවගේ ඇදහීම්වලට එල්ල විය හැකි විවේචන හෝ අපහාස වලින් ඒවා ආරක්ෂා කිරීම සඳහා

අනුප්‍රාප්තික රජයන් විසින් පනත ක්‍රියාත්මක කර ඇත. එනම් උසිගැන්වීම් වලින් ඔවුන් හට ආරක්ෂාව සැලසීම වෙනුවට,[45] එය විරුද්ධ මත තලාපෙලා දැමීමට සහ සුළුතර ආගමික ප්‍රජාවන් නිහඬ කිරීමට මෙවලමක් බවට පත් කිරීම[46] ඔස්සේ එකී නීතියේ මූඛ්‍ය පරමාර්ථය ම පරාජය කෙරී ඇත.[47] එමනිසා මෙම පනත උත්ප්‍රාසාත්මක ලෙස, සිතීමේ හෝ මතයක් දැරීමේ නිදහස, හෘද සාක්ෂියේ නිදහස සහ ආගමික හෝ ඇදහීමේ නිදහස සීමා කිරීම සඳහා භාවිතා කරන මර්ධනකාරී මෙවලමක් බවට පත්ව තිබේ.

### අධිකරණ අර්ථකථනයක හිඟකම

පනත යටතේ සමහර අත්අඩංගුවට ගැනීම් සිදුකර ඇතත්,[48] එය බලාත්මක කිරීමෙන් පසු දශක දෙකකට ආසන්න කාලයක් තුළ අවසන් කළ බවට වාර්තා වී ඇති නඩු තීන්දු හෝ නඩු විභාග යන්ගෙ හිඟයක් පවතී. වාර්ගික හෝ ආගමික වෛරය ඇවිස්සීම සම්බන්ධයෙන් ගොනු කර ඇති එකම චෝදනා පත්‍රය අධිකරණ අර්ථකථනයකින් තොරව විසඳන ලදී.[49] (මෑත වසරවල ICCPR යටතේ සිදු වූ සැලකියයුතු අත්අඩංගුවට ගැනීම් සම්බන්ධයෙන් මෙම වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ තවදුරටත් සාකච්ඡා කෙරේ).

### නීතිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වන නිර්දේශ

නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් ICCPR පනතේ 3 වන වගන්තිය වැරදි ලෙස භාවිතා කිරීම ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) විසින් ඉස්මතුකොට දක්වා ඇත. මෙම ගැටළුව විසඳීම සඳහා, පනත අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීමේ අරමුණින්, පනත නිවැරදිව යෙදීම පිළිබඳව පොලිස් නිලධාරීන්ට අනිවාර්ය පුහුණුවක් ලබා දීම HRCSL විසින් නිර්දේශ කර ඇත.[50] මීට පෙර එම පනත යටතේ අත්අඩංගුවට ගෙන විමර්ශනය කරන ලද නතාෂා එදිරිසූරිය විසින් ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සම අවසානයේ දී, ICCPR පනත යටතේ අනාගතයේදී නීති විරෝධී අත්අඩංගුවට ගැනීම් වැළැක්වීම සඳහා මාර්ගෝපදේශ අඩංගු නව චක්‍රලේඛයක් සියලුම පොලිස් නිලධාරීන්ට නිකුත් කරන බවට පොලිස්පතිවරයා විසින් සහතික වීම, ධනාත්මක කරුණක් ලෙස සැලකිය හැකි ය. (බලන්න: 3.1).

## දණ්ඩ නීති සංග්‍රහය

දණ්ඩ නීති සංග්‍රහයේ 291අ සහ 291ආ වගන්ති මගින් ආගමික හැඟීම්වලට රිදවන බවට සැලකෙන ප්‍රකාශන නියාමනය කරනු ලබයි. 291අ වගන්තිය මගින් සැලකිල්ලට ගන්නේ ආගමික හැඟීම් රිදවීමේ ඒකාන්ත චේතනාවෙන් වචන උච්චාරණය කිරීම වන අතර, යම් පන්තියක ආගමට හෝ ආගමික විශ්වාසයන්ට නින්දා කිරීමෙන් එකී පන්තියේ ආගමික හැඟීම් කෙලෙසීම අදහස් කොට ඒකාන්තයෙන් කරනු ලබන ද්වේෂසහගත ක්‍රියා 291ආ වගන්තියෙන් ආමන්ත්‍රණය කරනු ලබයි. ඊට අමතරව, ඇතැම් අවස්ථාවලදී, වෛරී කථනය සම්බන්ධ නඩු පැවරීම සඳහා 120 වන වගන්තිය භාවිතා කර ඇත. සාමූහික ලෙස ගත්කල, මෙම විධිවිධාන මගින් ශ්‍රී ලංකාවේ ආගමික ප්‍රකාශනය පාලනය කරන ප්‍රධාන දණ්ඩ නීති සංග්‍රහ රාමුව සංස්ථාපනය වේ.

### ආගමික හැඟීම් රිදවීම සම්බන්ධ වැරදි (291අ සහ 291ආ වගන්ති)

දණ්ඩ නීති සංග්‍රහයේ 291අ සහ 291ආ යන වගන්ති දෙකම පදනම් වී ඇත්තේ, ආගමික හැඟීම්වලට නිගරු කිරීමේ හෝ ඒවා අවමානයට පත් කිරීමේ චේතනාන්විත සහ ද්වේෂසහගත අභිප්‍රාය තිබිය යුතුය යන අවශ්‍යතාවය මතය.[51] ශ්‍රී ලංකාවේ මෙකී නීති වලට සමානව කෙටුම්පත් කර ඇති විධිවිධාන අර්ථකථනය කිරීමේදී ඉන්දියානු අධිකරණ විසින් දිගින් දිගටම කියා සිටියේ හුදෙක් අපහාසාත්මක බව, අපවාදාත්මක භාෂාව හෝ ආගම විවේචනය කිරීම ප්‍රමාණවත් නොවන බවයි - එනම් එකී හැසිරීම මගින් ආගමික වරදක් ඇති කිරීමට, වෛරය උසිගැන්වීමට හෝ ප්‍රචණ්ඩත්වය ඇවිස්සීමට පූර්වමර්ශිත සහ මූලික අභිප්‍රායක් පිළිබිඹු කළ යුතුය.[52] මේ අර්ථයෙන් ගත් කල, මෙකී විධිවිධානයන් දෙකම ඔස්සේ ආගමික

ඇදහීම් පරීක්ෂාවට ලක් වීමෙන් හෝ විරුද්ධ මත වලින් ආරක්ෂා කිරීමට වඩා බරපතල හානියක් වැළැක්වීම අරමුණු කර ගෙන ඇත. බුද්ධාගමට අපහාස කළ බවට චෝදනා එල්ල වූ ශ්‍රී ලාංකික ප්‍රහසන ශිල්පියෙකු සම්බන්ධ නඩුවකදී කොළඹ මහාධිකරණය මෑතකදී 291අ සහ 291ආ වගන්තිවල යෙදවීම පිළිබඳ සලකා බැලීය (බලන්න: 3.1). අධිකරණය තීන්දු කළේ හුදෙක් අපහාසාත්මක වීම පමණක් වරදක් සංස්ථාපනය නොකරන බවත්, අදාළ ප්‍රකාශය මෙම විධිවිධානවල විෂය පථයට ඇතුළත් වීමට නම් එය චේතනාන්විත මෙන්ම ද්වේෂසහගත එකක් විය යුතු බවත්ය.[53]

කෙසේ වෙතත්, 291අ සහ 291ආ වගන්තිවල පුළුල් වචන භාවිතය විසින් එම වගන්ති වැරදි ලෙස භාවිතයේ යෙදවීමට ඉඩ සලසයි. ප්‍රකාශයක් මගින් ප්‍රචණ්ඩත්වය ඇවිස්සීම හෝ හානියක් සිදුකිරීමට එය සමීපව සම්බන්ධ වීම යන අවස්ථාවලදී පමණක් එය වරදක් ලෙස සැලකීම වැදගත් වේ.[54] එවැනි සීමාවන් නොමැති වූ විට, මෙම විධිවිධාන නීත්‍යනුකූල අදහස් ප්‍රකාශ කිරීම් මර්දනය කිරීමට යොදාගත හැකි අතර, එමගින් විශේෂයෙන්ම සුළුතර කණ්ඩායම්වලට සහ විරුද්ධ මත දරන්නන්ට බලපෑමක් එල්ල වේ. ඒ අනුව, ඒවා බලාත්මක කිරීම සඳහා ඉතා ප්‍රවේශමෙන් සිදු කළ යුතු සන්දර්භීය විශ්ලේෂණයක් අවශ්‍ය වන අතර, සිවිල් සමාජ කණ්ඩායම් විසින් ඒවා සමාලෝචනය කිරීමට හෝ අවලංගු කිරීමට ඉල්ලා ඇත්තේ ඒවා FoRB හෝ FoE මත අසාධාරණ සීමාවන් පනවන්නේ නැති බව සහතික කර ගැනීම වෙනුවෙන් වේ.[55]

## විරුද්ධත්වය ඇවිස්සීම සම්බන්ධ වරද (120 වගන්තිය)

120 වන වගන්තියේ වචන භාවිතය, පොදු නීතියේ ඇති රාජ්‍යද්‍රෝහීත්වය (රාජ්‍යයක අධිකාරියට එරෙහිව කැරලි ගැසීමට මිනිසුන් පොළඹවන හැසිරීම හෝ කථනය) පිළිබඳ වරදට සමාන වන අතර ශ්‍රී ලංකාව තුළ එය රාජ්‍යය විවේචනය කරන අයට එරෙහිව අත්අඩංගුවට ගැනීම, රජයට එරෙහිව එල්ල වන විරුද්ධ මත සහ සාමකාමී විවේචන මර්දනය කිරීම සඳහා භාවිතා කර ඇත.[56] එමෙන්ම, විවිධ ප්‍රජාවන් අතර අසමගියක් ඇති කිරීමට හේතු විය හැකි යැයි සැලකෙන ප්‍රකාශ සිදු කළ පුද්ගලයින්ට එරෙහිව ද මෙය භාවිතා කර ඇත.[57] ශ්‍රී ලාංකික නඩු තීන්දුවක් මගින් අවධාරණය කර ඇත්තේ 'මිනිසුන් ප්‍රචණ්ඩත්වයට පොළඹවා ගැනීමේ චේතනාව' හෝ 'මහජන කැළඹීමක් ඇති කිරීමේ චේතනාව' වරදෙහි අත්‍යවශ්‍ය අංගයක් වන අතර, එම වගන්තියේ සාරය පවතින්නේ පුද්ගලයන්ගේ අපහාසාත්මක ස්වභාවය තක්සේරු කිරීමට වඩා, එසේ පැවසුවේ යැයි චෝදනාවට ලක්වූ එකී වචන, ප්‍රචණ්ඩකාරී හෝ නොහික්මුණු හැසිරීම් වල යෙදීමට පොළඹවන්නේද යන්න තීරණය කිරීම තුළ බවයි.[58]

සමස්ත විධිවිධානයෙහි අඩංගු භාෂාව අපැහැදිලි සහ පුළුල් බවත්, එය "අනවශ්‍ය යටත් විජිත යුගයෙන් ඉතිරි වූ ශේෂයක්" බවත් තර්ක ඉදිරිපත් වී ඇති අතර සැබවින්ම අත්‍යවශ්‍ය සහ අදාළ අවස්ථාවලදී හැරෙන්නට ප්‍රකාශනයේ නිදහසට වැට බැඳීම තහනම් කරන ICCPR යටතේ විශේෂයෙන්ම ශ්‍රී ලංකාව සතු ජාත්‍යන්තර නීතිමය බැඳීම් උල්ලංඝනය වන බවටද තර්ක ඉදිරිපත් වී තිබේ.[59] විවේචකයින් විසින් නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් තුළ මෙවැනි වරදක ඇති අවශ්‍යතාවය පිළිබඳව ප්‍රශ්න කර ඇති අතර එය හදිසි සමාජ අවශ්‍යතාවයක් ඉටු නොකරන බවත්, විරුද්ධ මත මර්දනය කිරීම සඳහා අනුප්‍රාප්තික රජයන් විසින් මෙම විධිවිධානය හිතුවක්කාරී ලෙස භාවිතා කරන බවටත් චෝදනා එල්ල වී තිබේ.[60]

## වරණීය බලාත්මක කිරීම සහ දඬුවම් නොලැබ සිටීමේ සංස්කෘතිය

මෙම විධිවිධාන අහෝසි කරන ලෙස ඉල්ලීම් ඉදිරිපත් වුවද, ඇතැම් රජයන් විසින් විවේචන නොතකා ඊට සමාන, නව වෛරී ප්‍රකාශ විධිවිධාන යෝජනා කර ඇති අතර,[61] තවත් සමහර රජයන් අවධානය යොමු කර ඇත්තේ පොලිස් නියෝග සහ නීතිය වරණීය ලෙස ක්‍රියාත්මක කිරීම හරහා පවතින සීමා කිරීම් බලාත්මක කිරීමට ය.[62] මෙම දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධානයන්, පොලිස් ආඥාපනත සමග එකාබද්ධ වූ විට, මහජන සාමය හෝ ස්ථාවරත්වය

අනතුරේ වැටෙන අවස්ථාවලදී ක්‍රියාත්මක වීමට පොලිසියට පුළුල් බලතල ලබා දෙයි.[63] කෙසේ වෙතත්, අලුත්ගම, ගින්තොට සහ දිගන යන ප්‍රදේශවල මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගත් කැරලි වලදී, නීතියේ වරණීය යෙදවුම පෙන්නුම් කරමින් බහුතර ප්‍රජාවට අයත් වූ චූදිත අපරාධකරුවන්ට එරෙහිව පියවර ගැනීමට පොලිසිය අපොහොසත් විය. පුළුල් හා අපැහැදිලි වචන සහිත නීති සන්දර්භයක් තුළ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් වරණීය ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම, දඬුවම් නොලැබීමේ සංස්කෘතියට දායක වන අතර, එමගින් FoRB උල්ලංඝනයන්හි ප්‍රධාන අපරාධකරු බවට රාජ්‍යය පත් කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස FoE සීමා කිරීම් සඳහා ද පහසු මගක් නිර්මාණයවෙයි. නීතිය ක්‍රියාත්මක නොකොට සිටීම සහ එය වරණීය ලෙස යෙදවීම සම්බන්ධයෙන් පොලිසියට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩු කිහිපයක් ගොනු කෙරී ඇත.[64]

### පුළුල් ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාවය

1883 දී පනවන ලද දණ්ඩ නීති සංග්‍රහය බහුවිධ සංශෝධනවලට භාජනය වී ඇති නමුත්, වෛරී ප්‍රකාශනය සහ ආගමික ප්‍රකාශනයට අදාළ විධිවිධාන පුළුල් ලෙස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කරන ලද අඛණ්ඩ ඉල්ලීම් බොහෝ දුරට නොසලකා හැර ඇත. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් සමග සමකාලීන සමාජ අවශ්‍යතා පෙළගැස්වීම සහතික කිරීම සඳහා, දැනට පවතින විධිවිධාන නැවත සමාලෝචනය කර ප්‍රතිසංස්කරණය කළ යුතුය.

## ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA)

### PTA නීතිගත කිරීම සහ එහි අපේක්ෂිත අරමුණ

ත්‍රස්තවාදයට එරෙහිව සටන් කිරීම සඳහා තාවකාලික නීති සම්පාදනයක් ලෙස මුලින් අදහස් කරන ලද ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ නීති රාමුවේ කොටසක් ලෙස පැවතුන අතර, විරුද්ධවාදීන් සහ රාජ්‍යයට තර්ජනයක් ලෙස සැලකෙන ඕනෑම අයෙකු ඉලක්ක කර ගැනීම සඳහා එය අඛණ්ඩව භාවිතා කෙරී ඇත. එහි අපරාධයන් නිර්දේශ කර ඇති පුළුල් සහ උභයාර්ථවාචී ආකාරය නිසා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බරපතළ විවේචනයට ලක් වී ඇත.[65]

### උභයාර්ථතාව සහ නීතිමය නිශ්චිතභාවයක් නොමැතිකම

PTA හි 2(1) (ඌ) වගන්තිය[66] මගින්, වරදක් අර්ථකථනය කරන ආකාරය පිළිබඳ නීතිමය නිශ්චිතභාවයක් ඉතිරි නොකරමින් එකී වරද විස්තර කර ඇති පුළුල් හා උභයාර්ථවාචී ආකාරය නිසා විශේෂයෙන් එය විවේචනයට ලක්ව ඇති අතර, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත බලාත්මක කළ දා සිට ජාත්‍යන්තර ප්‍රජාවගේ විවේචන දිගින් දිගටම ආකර්ෂණය වීමට එම වගන්තිය එක් ප්‍රධාන හේතුවකි.[67]

### ප්‍රකාශනයේ නිදහසට සහ සුළුතර ප්‍රජාවන් හට එහි ඇති බලපෑම

2(1) (ඌ) වගන්තියේ පුළුල් විෂය පථය මගින් මාධ්‍යවේදීන්ට සහ දේශපාලන විරුද්ධවාදීන්ට ඇතුළුව රජයට එරෙහිව පැමිණෙන විවේචන මර්දනය කිරීමේ මෙවලමක් ලෙස එම පනත භාවිතා කිරීමට හැකියාව ලබා දී ඇති අතර,[68] සුළුතර ප්‍රජාවන්ට එරෙහිව අත්තනෝමතික ලෙස එය බලාත්මක කිරීමට පහසුකම් සපයා ඇත. නිදසුනක් ලෙස, 2019 පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව, සැලකිය යුතු පිරිසක් - ප්‍රධාන වශයෙන් මුස්ලිම් ප්‍රජාවන්ගෙන් සැදුම්ලත් - ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගෙන රඳවා තබා ගන්නා ලදී.

### අඛණ්ඩ යෙදවීම සහ බලාත්මක කිරීමේ පිළිවෙත්

2024 වසරේදී පාලන ප්‍රතිසංස්කරණ[69] සඳහා වූ මහජන කැපවීම් සමග නව ජනාධිපතිවරයකු සහ රජයක් තේරී

පත් වුවද, PTA තවදුරටත් බලාත්මකව පවතී. ගාසා තීරයේ ඊශ්‍රායල හමුදා ක්‍රියාමාර්ග හෙළා දකින ස්ටිකරයක් පළ කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් තරුණ මුස්ලිම් ජාතික මොහොමඩ් රුස්ඩි රඳවා තබා ගැනීම ඇතුළුව පනත යටතේ සිදුවන අත්අඩංගුවට ගැනීම් දිගින් දිගටම සිදුවෙමින් පවතී.[70] පසුව HRCSL විසින් තීන්දු කළේ එසේ අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම ඔහුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බවයි - රුස්ඩිගේ අදහස් පුද්ගලික සහ ආගමික විශ්වාසයන් තුළ මුල් බැස ඇති බවත්, එබැවින් සිතීමේ, හෘද සාක්ෂියේ සහ ආගමික නිදහස සහතික කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන වගන්තිය යටතේ එය ආරක්ෂා වී ඇති බවත්ය.[71] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ ඕනෑම අත්අඩංගුවට ගැනීමකට හෝ රඳවා තබා ගැනීමකට පෙර නිසි නීතිමය සමාලෝචන ක්‍රියා පටිපාටි ස්ථාපිත කිරීම සහ විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා අත්අඩංගුවට ගැනීමේ කුවිතාන්සි අඛණ්ඩව නිකුත් කිරීම එම කමිටුව මගින් තවදුරටත් නිර්දේශ කර ඇත.[72]

## ප්‍රතිසංස්කරණ ප්‍රයත්න සහ නිර්දේශයන්

වසර ගණනාවක් පුරා නව ත්‍රස්ත විරෝධී නීති මගින් PTA ප්‍රතිස්ථාපනය කිරීමට උත්සාහයන් කිහිපයක් ගෙන තිබුණද, එම යෝජිත නීතිවල තවමත් ප්‍රමාණවත් පරීක්ෂාවන් සහ සමතුලිතතාවන් නොමැති බැවින්, ඒවා සම්මත වුවහොත් අවභාවිතයට ඉඩකඩ පවතී. අධිකරණ අමාත්‍යාංශය විසින් 2025 දෙසැම්බර් මස ප්‍රකාශයට පත් කරන ලද නවතම පනත් කෙටුම්පත වන "ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත" (PSTA) තුළ,[73] ත්‍රස්තවාදය පිළිබඳ අතිශය පුළුල් නිර්වචනයක් තවදුරටත් ඇතුළත් කර ඇති අතර, එමගින් දේශපාලන ක්‍රියාකාරීත්වය සහ විරුද්ධ මත ප්‍රකාශ කිරීම අපරාධමය වරදක් ලෙස සැලකීමේ හැකියාවක් පවතී.[74] ජාත්‍යන්තර සම්මතයන් යටතේ එවැනි ක්‍රියාවන් ත්‍රස්තවාදයක් ලෙස පිළි නොගත්තද, ත්‍රස්තවාදය යන්නෙහි නිර්වචනය ආගමික හෝ සංස්කෘතික ස්ථාන ඇතුළුව[75] පොදු හෝ පෞද්ගලික දේපළවලට බරපතල හානි සිදු කිරීම දක්වා පුළුල් කර ඇත. බහුතරය නොවන ප්‍රජාවන් අසමානුපාතික ලෙස ඉලක්ක කර ගනිමින් නීතිය වරණීය ලෙස ක්‍රියාත්මක කිරීමේ ඉතිහාසය හමුවේ මෙය විශේෂයෙන්ම කනස්සල්ලට කරුණක් වන අතර, මෙවැනි අපැහැදිලි සහ අතිශය පුළුල් විධිවිධාන සුළුතර ආගමිකයන්ගේ නීත්‍යනුකූල හා සාමකාමී ආගමික කටයුතු, සීමා කිරීමට හෝ අපරාධයක් ලෙස සැලකීමට භාවිතා කිරීමේ අවදානම මින් ඉහළ යයි. දැනට පවතින නීතියට සමානව, රඳවා තබා ගැනීමේ බලතල අත්තනෝමතික ලෙස ක්‍රියාත්මක කිරීමට මෙම පනත් කෙටුම්පත මගින් ඉඩ සලසන අතර, නීතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම්වල නිරත වීමට හමුදාවට බලය ලබා දෙයි - PTA යටතේ බලතල ක්‍රියාත්මක කිරීමේදී පොලිසියට සහ හමුදාවට ඇති ප්‍රශ්නකාරී වාර්තාව සමග විමසා බැලීමේදී මෙය ඉතා සැලකිලිමත් විය යුතු තත්ත්වයක් බව පෙනේ. විශේෂයෙන් සුළුතර ප්‍රජාවන් සම්බන්ධයෙන්, පුළුල් විධායක බලතල සහ දුර්වල ආරක්ෂණ විධිවිධාන මගින් යෝජිත නීතිය අනිසි ලෙස භාවිතා කිරීමකට තවදුරටත් ගොදුරු වන අතර[76] වත්මන් ස්වරූපයෙන් එය බලාත්මක කළහොත් අවසානයේ එමගින් FoRB සහ FoE හි නිදහස් ක්‍රියාකාරීත්වයට තර්ජනයක් එල්ල කෙරේ.

රුස්ඩි නඩුවේදී මානව හිමිකම් කොමිසම විසින් දක්වා ඇති නිර්දේශවල ඉස්මතු කර ඇති පරිදි, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත බලාත්මක වන තුරු, ආගමික ප්‍රකාශනය ඇතුළුව ජාත්‍යන්තර නීතිය යටතේ FoE සඳහා නීත්‍යනුකූලව අවසර දී ඇති සාධාරණ, අවශ්‍ය සහ සමානුපාතික සීමාවන් මතක තබා ගනිමින් එය බලාත්මක කරන බව සහතික කිරීම සඳහා රාජ්‍යය විසින් පැහැදිලි මාර්ගෝපදේශ සහ පරාමිතීන් ස්ථාපිත කිරීම වැදගත් වේ.[77]

## මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත

### මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත බලාත්මක කිරීම සහ එහි ප්‍රකාශිත අරමුණු

2024 පෙබරවාරි මාසයේදී කඩිනම් ක්‍රියාවලියක් හරහා ඉතාම සුළු විවාදයකින් පසුව බලාත්මක කරන ලද මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත (OSA)[78] අන්තර්ජාල පරිශීලකයින් ආරක්ෂා කිරීම සඳහා මෙවලමක් ලෙස ඉදිරිපත් කරන ලද නමුත්, ප්‍රායෝගිකව එය මාර්ගගත භාෂණයන්ට දැඩි සීමාවන් පනවන අතර "ආගමික ප්‍රකාශනය" ඇතුළුව ස්වයං-වාරණය දිරිමත් කරමින් රාජ්‍ය නිරීක්ෂණයන් වැඩි කරයි.

### මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව සතු බලතල

මෙම පනත මගින් ජනාධිපතිවරයා විසින් පත්කරන, මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ කොමිෂන් සභාව නිර්මාණය කරන අතර (OSC) තහනම් කරන ලද ප්‍රකාශ මොනවාදැයි අර්ථ නිරූපණය කිරීමට[79] සහ අන්තර්ගතයන් ඉවත් කිරීමට[80] නියෝග කිරීමට හැකි පුළුල් බලතල එය සතුව පවතී. එහි එන "අසත්‍ය ප්‍රකාශ" සහ "චේතනාව" පිළිබඳ පවතින අපැහැදිලි නිර්වචනයන් නීත්‍යනුකූලභාවය, සුජාතභාවය, අවශ්‍යතාවය සහ සමානුපාතිකත්වය පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලීමට අපොහොසත් වේ.[81]

### අන්තර්ජාල ප්‍රකාශනය අපරාධයක් ලෙස සැලකීම සහ අධිකරණ අධීක්ෂණයක හිඟකම

ප්‍රමාණවත් අධිකරණ අධීක්ෂණයකින් තොරව අපරාධ නඩු පැවරීමට හෝ ඒ සඳහා නිර්දේශ කිරීමට OSC හට බලය පවරා ඇති අතර, එමගින් අසමානුපාතික දඬුවම් පැමිණවීමේ අවදානමක් මෙන්ම විවේචන, විවරණ හෝ උපහාසාත්මක ප්‍රකාශ ඇතුළු නීත්‍යනුකූල ප්‍රකාශනයන් අපරාධයක් ලෙස සැලකීමේ අවදානමක් ද නිර්මාණය වේ.[82] මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ සිය විශේෂ නිර්ණය කිරීමේ දී ශ්‍රේෂ්ඨාධිකරණය නිරීක්ෂණය කළේ, එම පනත් කෙටුම්පතේ අඩංගු වැරදි කිහිපයක් දැනටමත් සෘජුව හෝ වක්‍රව දණ්ඩ නීති සංග්‍රහය තුළ පවතින නමුත්, ප්‍රමාණවත් සාධාරණීකරණයකින් තොරව මෙම නව පනත මගින් එම වැරදි සඳහා සැලකිය යුතු ලෙස දැඩි දඬුවම් නියම කර ඇති බව යි.[83] එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්වරයා මෑතකදී ශ්‍රී ලංකාවේ සිදු කළ සංචාරයකින් අනතුරුව මෙයට සමාන ප්‍රශ්නාර්ථයක් මතු කර ඇත.[84]

### ආගමික ප්‍රකාශනයට සහ සුළුතර ප්‍රජාවන්ට එල්ල වන අවදානම්

15 සහ 16 වගන්ති මගින් පිළිවෙළින් "ආගමික රැස්වීම්වලට බලපාන අසත්‍ය ප්‍රකාශ" සහ "ආගමික හැඟීම්වලට නිග්‍රහ කිරීම" සම්බන්ධයෙන් දඬුවම් පමුණුවන අතර, ඒවායේ පවතින පුළුල් සහ විෂය මූලික වචන භාවිතය හේතුවෙන් සුළුතර ප්‍රජාවන්ට විශේෂයෙන් එය අවදානම් සහගත වේ. ශ්‍රී ලංකාවේ පවතින වර්ගීය නීතිය ක්‍රියාත්මක කිරීමේ ඉතිහාසය සැලකිල්ලට ගත්කල, මෙම විධිවිධාන මගින් විරුද්ධ මතධාරීන් මර්දනය කිරීමට සහ ආන්තිකකරණය වූ කණ්ඩායම් ඉලක්ක වීමට හැකියාවක් පවතී. අන්තර්ගතයන් ඉවත් කිරීමට එරෙහිව පැහැදිලි අභියාචනා ක්‍රියාවලියක් නොමැති අතර,[85] මෙම පනත යටතේ සිදු කළ පළමු අත්අඩංගුවට ගැනීම රජයේ නිලධාරීන් විවේචනය කිරීම සම්බන්ධයෙන් සිදු වුවකි[86] - එමගින් මෙම පනත අවභාවිත වීමට ඇති හැකියාව මනාව පෙන්නුම් කරයි.[87]

OSA මගින් පරිශීලක දත්ත වෙත ප්‍රවේශ වීමට රාජ්‍යයට ඇති හැකියාව පුළුල් කිරීම හරහා පෞද්ගලිකත්වය තවදුරටත් අඩාල කරන අතර,[88] නිර්නාමිකභාවය මත යැපෙන අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට මෙයින් තර්ජනයක් එල්ල වේ.[89] සමස්තයක් වශයෙන් ගත් කල, මෙම පනත අපැහැදිලි භාෂා විලාසයක් භාවිතා කරන අතර, පුළුල් බලතල ලබා දෙමින් ආරක්ෂණ විධිවිධාන හිඟකමකින් හෝ සමානුපාතික බවකින් තොරව ක්‍රියාත්මක වන්නකි.

### සංශෝධන ක්‍රියාවලිය සහ අවිනිශ්චිත ප්‍රතිසංස්කරණ ගමන් මග

පනත සමාලෝචනය කිරීමට සහ යෝජිත සංශෝධන පිළිබඳ මහජන ප්‍රතිචාරයන් ඇතුළත් කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුගේ සභාපතිත්වයෙන් යුත් බහු-ආංශික කමිටුවක් රජය විසින් පත් කර ඇති අතර,[90] එම සංශෝධන මගින් පැන නැගී ඇති ගැටලුවලට මානව හිමිකම් පිළිබඳ දෘෂ්ටිකෝණයෙන් ප්‍රමාණවත් විසඳුම් ලබා දෙන්නේ ද යන්න ඉදිරියට දැකබලා ගැනීමට හැකි වෙනු ඇත.[91]

## 1.3 නිගමනය

එබැවින්, ශ්‍රී ලංකාව තුළ FoRB සහ FoE සඳහා වඩවඩාත් සීමාකාරී පරිසරයක් නිර්මාණය කිරීමට පවතින නීතිමය රාමුව දායක වී ඇති බව පැහැදිලිය. දුර්වල බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන් සහ ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් සඳහා පවතින ප්‍රමාණවත් නොවන ආරක්ෂාව හේතුවෙන්, සුළුතර ප්‍රජාවෝ, විරුද්ධ මතධාරීහු සහ ප්‍රධාන ප්‍රවාහයේ මතවාදයන්ට අභියෝග කරන පිරිස් තවදුරටත් දැඩි අවදානමකට මුහුණ දෙති.





# 2 වන පරිච්ඡේදය

## 2. ප්‍රකාශනයේ නිදහස (FoE) සහ ආගමික් ඇදහීමේ හෝ විශ්වාසයක් දැරීමේ නිදහස (FoRB) අතර අභිසාරීතාව පිළිබඳ අභියෝග

මානව හිමිකම් යනු විශ්වීය (සෑම කෙනෙකුටම අදාළ වන), අභාජ්‍ය (කොටස් වශයෙන් ක්‍රියාත්මක කළ නොහැකි), අන්‍යෝන්‍ය පරායත්ත (හුදෙකලාව භුක්ති විඳිය නොහැකි) සහ අන්තර් සම්බන්ධිත (එක් අයිතිවාසිකමක් තවත් අයිතිවාසිකමකට වඩා වැදගත් ලෙස සැලකිය නොහැකි) ඒවා වේ.[92] සමහර විට එක් අයිතිවාසිකමක් ආරක්ෂා කිරීම සඳහා තවත් අයිතිවාසිකමක් කැප කළ යුතු බවට තර්ක කරනු ලැබුව ද, මානව හිමිකම්වල පවතින අන්තර් සම්බන්ධිත ස්වභාවය අනුව එක් අයිතිවාසිකමක් යටපත් කිරීමෙන් තවත් අයිතිවාසිකමක් පූර්ණ ලෙස සාක්ෂාත් කර ගත නොහැකිය.[93]

FoE සහ FoRB එකිනෙක සමග ගැටෙන බවට පොදු වැරදි මතයක් ඇත - විශේෂයෙන්ම පුද්ගලයෙකු ඉතා තදින් විශ්වාස කරන ආගමික මතයන් සහ විශ්වාසයන්ට

අභියෝග කිරීමට හෝ අපහාස කිරීමට අදහස් ප්‍රකාශ කිරීම භාවිතා කරන විට, හෝ බහුතරයට තර්ජනයක් ලෙස සැලකෙන ප්‍රකාශ සම්බන්ධයෙන් මෙවැනි මතයක් පැන නගී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, FoRB කෙරෙහි ඇති ගෞරවය තහවුරු කිරීම සඳහා FoE සීමා කළ යුතු යැයි සිතනු ලැබේ. කෙසේ වෙතත්, පුද්ගලයෙකුගේ ආගම හෝ විශ්වාසය ඇදහීමට සහ එය ප්‍රකාශ කිරීමට අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස අත්‍යවශ්‍ය වන අතර එබැවින්, FoRB සහ FoE යනු අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් වන සහ සමීපව සම්බන්ධ වූ අයිතිවාසිකම් වන්නා සේම, පුද්ගලයන්ගේ මෙන්ම ප්‍රජාවන්ගේ ද අනන්‍යතාවය ආරක්ෂා කිරීමට එවා උපකාරී වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, FoE මත පනවන ඕනෑම සීමා කිරීමක්, FoRB පූර්ණව සහ නිදහස්ව ක්‍රියාවට නැංවීම ද සීමා කරනු ඇත.[94] එබැවින්, සියලුම ආගම් හෝ ඇදහීම් කෙරෙහි ගෞරවය තහවුරු කිරීමට උත්සාහ කිරීමේදී පවතින අභියෝගය වන්නේ, FoE ක්‍රියාත්මක කිරීමේදී ඔවුන්ගේ ආගම හෝ ඇදහීම පදනම් කරගනිමින් වෙනත් පුද්ගලයෙකුට එරෙහිව වෙනස්කොට සැලකීම, වෛරය හෝ ප්‍රචණ්ඩත්වය ඇවිස්සීම සිදු නොවන බව සහතික කිරීමයි.[95]

මෙම පරිච්ඡේදය මගින් මෙකී මූලික ස්වාධීනත්වයන් ද්විත්වයෙහි අභිසාරීතාවයේදී මතුවන අභියෝග පිළිබඳව සලකා බලනු ඇති අතර, එවායේ අනුපූරකභාවය සහ අන්තර් සම්බන්ධිතභාවය තහවුරු කිරීම සඳහා මෙම නොසන්සුන්කාරී තත්ත්වයන් සමනය කරගත හැකි ආකාරය පිළිබඳවද අවධානය යොමු කරනු ඇත.

## 2.1 වෛරී කථනය

FoE සහ FoRB අතර අභිසාරීතාවයේ දී මතුවන ප්‍රධාන අභියෝගයක් නම් වෛරී කථනය යි. "වෛරී කථනය" සඳහා විශ්වීය වශයෙන් පිළිගත් අර්ථ දැක්වීමක් නොමැති අතර, බොහෝ නීති මගින් අවධානය යොමු කරනු ලබන්නේ නිශ්චිතවම සහ පටු ලෙස අර්ථ දක්වා ඇති හානිකර කථනයන් වර්ග පිළිබඳව පමණි. අපැහැදිලි නීතිමය අර්ථ දැක්වීමක් මගින් කුමන ආකාරයේ කථනයන් වාරණය කළ යුතුද යන්න තීරණය කිරීමට රජයන්ට වුවමනා ප්‍රමාණයටත් වඩා අභිමත බලයක් හිමිවේ.[96] කෙසේ වෙතත්, මෙම නීතිවල පවා "වෛරය" හෝ "උසිගැන්වීම" ලෙස සැලකිය හැක්කේ කුමක්ද යන්න තීරණය කිරීම වැනි යම් විෂයබද්ධ වූ විනිශ්චයන් ප්‍රමාණයක් අන්තර්ගත වේ. වෛරය කරා උසිගැන්වීමක් යනු කුමක්ද යන්න එහි සන්දර්භය සහ එල්ල වන අපහාසය මත තීරණය වුවද, අපහාසාත්මක කථනයක් පමණක් සිදු කිරීමෙන් තවත් අයෙකුගේ අයිතිවාසිකම් යටපත් වන බවට වන පොදු එකඟතාවයක් නොමැත. FoE හි පිළිගත හැකි සීමාවන් පිළිබඳව වැදගත් ප්‍රශ්න, වෛරී කථනය විසින් මතු කරයි. ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ, කථනය නීති විරෝධී (වරදක්) බවට පත්වන්නේ එය ප්‍රචණ්ඩත්වය උසිගැන්වීමට හේතු වන විටදී ය. උඵ, අපහාසාත්මක හෝ විවේචනාත්මක අදහස් දැක්වීම් අප්‍රසන්න විය හැකි වුවද, එවා අපරාධමය වැරදි ලෙස නොසලකන අතර එවා ඉවසා දරා සිටීමට හැකියාව තිබිය යුතුය. අනෙකාගේ අයිතිවාසිකම් සහ නිදහසට හානි පමුණුවන කථනයන් පමණක් සීමා කළ යුතු අතර, එය ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

අනුදැනිය හැකි මට්ටමේ අපහාසයක් සහ තහනම් කළ යුතු මට්ටමේ ආගමික වෛරය පැතිරවීමක් අතර පවතින උපරිම සීමාවන් තීරණය කිරීමේදී රාජ්‍යයන්ට යම් අභිමත බලයක් පවතින අතර, ආගමක් පිළිබඳව හුදෙක් ප්‍රකෝපකාරී හෝ අපහාසාත්මක වන කථනයන් තහනම් කිරීමට රජයන් බැඳී නැත.[97] කණගාටුවට කරුණ නම්, ඇතැම් නීති මගින් කථනය කෙරෙහි සීමා පනවනු ලබන්නේ එවායින් හානියක් සිදුවන නිසා නොව, හුදෙක් එමගින් කිසියම් කණ්ඩායමක සිත් රිදවීමකට හෝ එදිරිවාදී ප්‍රතිචාරයක් ඇති කරවීමට ඉඩ ඇති බැවිනි. මෙමගින් බලධාරීන් හට ස්වකීය විරුද්ධවාදීන්ට, දේශපාලන ප්‍රතිවාදීන්ට සහ සුළුතර කණ්ඩායම්වලට එරෙහිව මෙම නීති අනිසි ලෙස භාවිතා කිරීම පහසු කරයි.[98] වෛරී කථනය නියාමනය කිරීමට උත්සාහ කරන නීති සම්පාදනයේ පවතින මෙම ගැටලුකාරී ප්‍රවණතාව, පෙර පරිච්ඡේදයේ සාකච්ඡා

කළ පරිදි ශ්‍රී ලංකාව තුළද පැහැදිලිව දක්නට ලැබේ. වෛරී කථනය තහනම් කිරීම සඳහා සීමා පැනවීම මගින් ඇතැම් කථන ක්‍රමවේදයන් සීමා කිරීම අනිවාර්යයෙන්ම සිදු වන අතර, එය ඉතා ප්‍රවේශමෙන් සිදු නොකළහොත්, ඕනෑවට වඩා වාරණයක් සිදු වීමට සහ ප්‍රතිවිරුද්ධ මත නිහඬ කරවීමට එය හේතු විය හැක. වෛරී කථනය සීමා කිරීම මගින් සෑමවිටම අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස උල්ලංඝනය කරන බව මෙයින් අදහස් නොවන නමුත් මේ ප්‍රපංචයන් දෙක අතර නිවැරදි සමබරතාවය සොයා ගැනීම දුෂ්කර වන අතර ඒ සඳහා දැඩි සැලකිල්ලක් අවශ්‍ය වේ.[99] FoRB ඇතුළුව වෙනත් නිදහසක් ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ඝට්ටනයන් වලදී, නීත්‍යානුකූලව අනුමත කළ හැකි සීමාවන් අතර සමබරතාවය පවත්වා ගැනීම සඳහා මග පෙන්වීමක් ලෙස ICCPR භාවිතා කළ හැකි [බලන්න: 1.2] අතර, එවැනි ඕනෑම සීමා කිරීමක්, නැවත එම අයිතිවාසිකම ම අනතුරේ හෙලන්නක් නොවිය යුතු බවද මතක තබා ගත යුතුය.[100]

OHCHR හි රබාත් ක්‍රියාකාරී සැලසුම විසින්, කිසියම් කථනයක් වෙනස්කොට සැලකීමකට, එදිරිවාදීකමකට හෝ ප්‍රචණ්ඩත්වයකට උසිගන්වන සුළු එකක් බවට පත්වන්නේ කුමන මොහොතේ දැයි යන්න තීරණය කිරීම සඳහා කොටස් හයකින් යුත් පරීක්ෂණයක් සපයයි. සන්දර්භය, කථිකයා ගේ බලපෑම, ඔවුන්ගේ චේතනාව, අන්තර්ගතය, පණිවිඩය කෙතරම් පුළුල් ලෙස ව්‍යාප්ත වේද යන්න සහ සිදුවිය හැකි හානියේ වියහැකියාව මෙන්ම එහි ඇති සමුපස්ථිත ස්වභාවය පිළිබඳව එම පරීක්ෂණය මගින් සොයා බලයි.[101] [102]හාස්‍යෝත්පාදක ශිල්පියෙකු කළ ප්‍රකාශයක් බුද්ධාගමට අපහාසාත්මක වන්නේ යැයි සැලකීම නිසා ICCPR යටතේ ඇයව අත්අඩංගුවට ගැනීමට අදාළ මෑතකාලීන නඩුවකදී, මහාධිකරණය විසින් මෙම පරීක්ෂණය සහ 2020 සැප්තැම්බර් මස වෛරී කථනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ උපායමාර්ගය සහ ක්‍රියාකාරී සැලසුම කෙරෙහි අවධානය යොමු කරමින් තීන්දු කළේ,[103] අදාළ ප්‍රකාශය මගින් බුද්ධාගම කෙරෙහි එදිරිවාදීකමක් දිරිමත් නොවන බවත්, එම ප්‍රකාශයන් ද්වේෂසහගත චේතනාවකින් තොරව හාස්‍යය උපදවන චේතනාවෙන් සිදු කර ඇති බවත්ය [බලන්න: 3.1]. මෙහිදී අධිකරණය වැඩිදුරටත් සඳහන් කළේ, ඇතැම් ප්‍රකාශ අපහාසාත්මක හෝ සිත් රිදවන සුළු ඒවා ලෙස සැලකිය හැකි වුවද, එම කරුණ නිසා ම පමණක් එය ICCPR හෝ දණ්ඩ නීති සංග්‍රහයේ 291අ වගන්තිය යටතේ අපරාධයක් බවට පත් නොවන බවයි.[104] යම් ප්‍රකාශයක් වෛරී කථනයක් ලෙස සැලකීමට නම්, එමගින් ඉලක්ක කරන ලද කණ්ඩායමට, අසන්නන්ගෙන් හෝ පුළුල් සමාජයෙන් එල්ල වන ක්ෂණික එදිරිවාදීකමකට හෝ ප්‍රචණ්ඩත්වයකට මුහුණ දීමට සිදුවීමේ අවදානමක් තිබිය යුතුය.

ආගමික අසහනය අයුක්ති සහගත බවට වන පොදු එකඟතාවක් පැවතුණද, අපහාසාත්මක කථනය අපරාධයක් ලෙස සැලකිය යුතුද යන්න පිළිබඳව අඛණ්ඩ විවාදයක් පවතී.[105] භාෂණය සම්බන්ධයෙන් පනවන ඕනෑම සීමා කිරීමක්, වෙනස්කොට සැලකීම, වෛරීභාවය හෝ ප්‍රචණ්ඩත්වය වැළැක්වීම වැනි අරමුණක් ඉටු කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය මෙන්ම ඊට සමානුපාතික විය යුතුය. වෛරීභාවය උසි ගැන්වීමේ මට්ටමට නොපැමිණෙන ප්‍රකාශ අපරාධමය වරදක් ලෙස නොසැලකිය යුතු වන්නේ එසේ කිරීමෙන් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට හානි සිදුවන බැවිනි. අපරාධ දඬුවම් නියම කිරීමට පෙර, වෛරීභාවය උසි ගැන්වීමක් සිදු වී තිබීම අනිවාර්ය අවශ්‍යතාවයක් විය යුතුය. ආගමකට අපහාස කිරීම සහ සැබෑ වෛරී කථනය අතර වෙනස තීරණය කිරීමේදී පවතින විෂයබද්ධ ස්වභාවය හේතුවෙන්, ආගමික විශ්වාසයන් විවේචනය කිරීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා දැඩි ලෙස දඬුවම් කිරීම වැළැක්වීම සඳහා නීති සහ අධිකරණයන් මගින් පැහැදිලි මාර්ගෝපදේශ සැපයිය යුතුය.

## 2.2 දේවාපහාසය

දේවාපහාසය යනු "දෙවියන්ට අපහාස කිරීමේ, අවඥාව පෑමේ හෝ ගෞරවයක් නොමැති බව පෙන්වන ක්‍රියාවක්" ලෙස සැලකේ.[106] ආගම සහ රාජ්‍යය සමීපව බැඳී පවතින රටවල, දේවාපහාසය බොහෝ විට දේශපාලන විවේචනයක් සහ ද්‍රෝහී ක්‍රියාවක් ලෙස සලකනු ලබන අතර,[107] එහිදී දේවාපහාස නීති මගින් ආගමික "සුජාතභාවය" ආරක්ෂා කිරීම,[108] අන්තර් ආගමික සහජීවනය සහ මහජන සාමය පවත්වාගෙන යාම අරමුණු කරගන්නා බව පවසනු ලැබේ. අවසානයේ දී, මෙම දේවාපහාස නීති ප්‍රධාන වශයෙන්ම බහුතර ආගම ආරක්ෂා කිරීමට සහ බලයේ සිටින දේශපාලන පක්ෂයට සිය දේශපාලන බලය රඳවා ගැනීමට උපකාරී වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම නීති යටතේ සුළුතර කණ්ඩායම් බොහෝ විට අසමානුපාතික ලෙස බලපෑමට ලක් වේ.[109] දේවාපහාස නීති බොහෝ විට අපැහැදිලි වන අතර, එනිසා ඒවා අවභාවිත කිරීම පහසු වන අතර, විශේෂයෙන් දේශපාලන හේතු මත භාවිතා කරන විට, මෙම නීති අසාධාරණ ලෙස ක්‍රියාත්මක වීමට ඉඩ පවතී.[110]

මානව හිමිකම් දෘෂ්ටිකෝණයකින් බලන කල, දේවාපහාස නීති මගින් FoRB හෝ FoE යන දෙකම ආරක්ෂා නොකරන අතර, එම නීති අහෝසි කළ යුතුය.[111] FoRB මගින් පුද්ගලයන්ට ඕනෑම අදහසක් හෝ විශ්වාසයක් දැරීමට ඇති අයිතිය සහතික කරයි - එම අදහස් අනෙක් අය දේවාපහාසයක් ලෙස දුටුව ද එය එසේම වන අතර FoE මගින් එම අදහස් ප්‍රසිද්ධියේ බෙදා ගැනීමට හැකි බවට සහතික කරනු ලබයි. එය ප්‍රචණ්ඩත්වය උසි ගැන්වීමක් නොවන තාක් කල්, පුද්ගලයින් හට ඔවුන් දේවාපහාසයක් ලෙස දකින දේ විවේචනය කිරීමට ද අයිතියක් ඇත. එබැවින්, දේවාපහාස නීති ඇතුළුව ආගම්වලට අගෞරව කිරීම තහනම් කරන පොදු සීමාවන් පැනවීම, සාමාන්‍යයෙන් මානව හිමිකම් නීතිය සමග සහ විශේෂයෙන්ම ICCPR සමග ඝට්ටනයක් ඇති කරයි.[112] මීට ඇති එකම ව්‍යතිරේකය වන්නේ, යම් කථනයක් මගින් පැහැදිලිවම වෙනස්කොට සැලකීම, වෛරය හෝ ප්‍රචණ්ඩත්වය උසි ගැන්වීම වන අතර, එවැනි ප්‍රකාශයන් ICCPR හි 19(3) හෝ 20(2) වගන්ති යටතේ සීමා කළ හැකි වන නමුත් එය එක් එක් සිද්ධියට අදාළ කරුණු මත පදනම්ව තීරණය කළ යුතුය. මානව හිමිකම් මගින් ආරක්ෂා කරනු ලබන්නේ පුද්ගලයන් මිස අදහස් හෝ විශ්වාස පද්ධතීන් නොවේ. පුද්ගලික ආගමික හැඟීම් හෝ සමාජ සහජීවනය පවත්වා ගැනීම වෙනුවෙන් යැයි කරනා හේතු දැක්වීම්, මූලික ස්වාධීනත්වයන් සීමා කිරීම සඳහා වන වලංගු හේතු නොවේ. කිසිදු ආගමක් හෝ ආගමික සංකේතයක් විවේචනයෙන් හෝ උපහාසයෙන් මුක්ත විය යුතු නැත.[113] දේවාපහාසය තහනම් කිරීම මගින් ඇතැම් පිරිසකගේ ඇදහීම් ආරක්ෂා විය හැකි වුවද, එය නියත ලෙසම තවත් පිරිසකගේ ඇදහීම් සීමා කිරීමට හේතු වේ. මෙම දේවාපහාස නීති මගින් ආරක්ෂා කෙරන්නේ පුද්ගලයා මිස පුද්ගලයා දරන ආගමික අදහස් හෝ සංකේත නොවන නිසා ඒවා FoRB උල්ලංඝනය කිරීමක් වේ. FoRB ක්‍රියාවට නැංවීම යටතට "ආගමික හැඟීම්" යන්න ඇතුළත් නොවන අතර, මානව හිමිකම් යටතේ ඒවාට ආරක්ෂාව සැපයීම ගැන සහතික වීමක් සිදු නොකරයි.[114] එබැවින්, දේවාපහාස නීති මගින් බොහෝ විට සිදු වන්නේ FoRB ආරක්ෂා වීමට ප්‍රතිවිරුද්ධ දෙයක් වන අතර,[115] දේවාපහාස නීති පවතින රටවල ආගම පදනම් කරගත් සමාජ ගැටුම් වැඩි වශයෙන් ඇති වේ.[116] එබැවින් සුළුතර කණ්ඩායම්වලට එරෙහිව වැඩි වශයෙන් වෙනස්කොට සැලකීමට සහ ආගම පදනම් කරගත් මැර ප්‍රචණ්ඩත්වයන් වර්ධනය වීමට මෙම නීති සෘජුවම බලපායි.

තවද, දේවාපහාස නීති යනු FoE මත පනවනු ලබන නීත්‍යනුකූල නොවන සීමා කිරීම් වන අතර එම නිදහස මගින් අන් අයගේ සිත් තැවුලට හේතුවන ප්‍රකාශ ලෙස සලකන ඒවා ද ඇතුළුව පුළුල් පරාසයක විහිදුණු ප්‍රකාශනයන් ආරක්ෂා කරනු ලබයි.[117] ආගම් ආරක්ෂා කිරීමට වඩා අවධානය යොමු විය යුත්තේ, පුද්ගලයන්ට එරෙහිව වෛරය හෝ ප්‍රචණ්ඩත්වය උසි ගැන්වීමට එරෙහිව ආරක්ෂාව සැලසීම කෙරෙහි ය.[118] එබැවින්, FoRB ආරක්ෂා කිරීම සඳහා FoE සීමා කළ යුතුය යන තර්කය

නිවැරදි නොවේ.

ප්‍රති ත්‍රස්ත නීතිවලට අමතරව, ශ්‍රී ලංකා නීති පද්ධතිය තුළ දේවාපහාස නීති ලෙස ක්‍රියාත්මක වන ඇතැම් විධිවිධාන අන්තර්ගත වන අතර,[119] ආගමික හැඟීම්වලට අපහාස කිරීම හෝ හානි කිරීමේ චේතනාවෙන් කරනු ලබන ප්‍රකාශනයන් අපරාධමය වරදක් ලෙස සලකනු ලබන දණ්ඩ නීති සංග්‍රහයේ 290, 290අ, 291අ සහ 291ආ වගන්තිවලට (මෙම වාර්තාවේ 1 වන පරිච්ඡේදයේ සාකච්ඡා කර ඇති) අමතරව, ICCPR පනත ද දේවාපහාස නීතියක් ලෙස භාවිත කරනු ලැබේ.

## 2.3 ප්‍රචාරණය සහ අන්‍යාගමිකකරණය

බොහෝ ආගම් තම අනුගාමිකයන්ට ඔවුන්ගේ ඇදහීම් අන් අය සමග බෙදා ගැනීමට දිරිගන්වයි.[120] එබැවින්, ලොව පුරා බොහෝ බැතිමතුන් සඳහා තමන්ගේ ඇදහීම් දැරීමට ඇති අයිතිය සහ එම ඇදහීම් අන් අය සමග බෙදා ගැනීමට ඇති අයිතිය සමග එකිනෙකට වෙන් කළ නොහැකි ලෙස බැඳී පවතී. මෙය FoRB සහ FoE අතර අභිසාරිතාවක් මෙන්ම ආතතියක් ඇති කරන කරුණක් වන අතර, ආගමික හැරවීම් පිළිබඳ පවතින මුල් බැසගත් බිය සහ බහුතරයේ පැවැත්මට හා ආරක්ෂාවට එල්ල විය හැකි තර්ජනයන් පිළිබඳ සංකල්පය හේතුවෙන් මෙය අඛණ්ඩ අභියෝගාත්මක තත්ත්වයක් නිර්මාණය කර ඇත.[121]

දේශපාලන, ආගමික සහ දේශීය ප්‍රජා නායකයන් ඇතුළු විවිධ ක්‍රියාධරයින් විසින් අන්‍යාගමිකකරණය සීමා කරන ලෙස හෝ තහනම් කරන ලෙස ඉල්ලා ඇති අතර, සාමාන්‍යයෙන් එසේ ඉල්ලා සිටින්නේ ජාතික හෝ ප්‍රාදේශීය මට්ටමින් සිටින ආගමික බහුතරය හෝ රාජ්‍යයේ අනුග්‍රහය ලබන ආගම් ආරක්ෂා කිරීමේ අරමුණෙනි. එවැනි නීති මගින් අපේක්ෂා කරන්නේ ප්‍රධාන කණ්ඩායමේ ආගමික සහ දේශපාලනික බලපෑම තහවුරු කර ගැනීම වන අතර, සුළුතර ආගම් වර්ධනය වීම තුළින් එම කණ්ඩායම් සමාජීය හෝ දේශපාලනික බලයක් අත්කර ගනු ඇතැයි ද, එමගින් ස්වකීය අධිකාරී බලයට අභියෝගයක් එල්ල වනු ඇතැයි ද යන බිය රාජ්‍යයන් තුළ පවතී. FoRB හෝ FoE සීමා කිරීම සඳහා, ජාතික අනන්‍යතාවයට හෝ නීතියට බැඳී පවතින විශේෂිත ආගමික සම්ප්‍රදායක් ආරක්ෂා කිරීම වලංගු සහගත පදනමක් නොවේ. සමාජ සහජීවනය හෝ සහජීවනය පවත්වා ගැනීම ද ඒ සඳහා වලංගු පදනමක් නොවේ. අසහනකාරී අවස්ථාවන්හිදී, රාජ්‍යය විසින් කළ යුත්තේ මෙම අයිතිවාසිකම් කප්පාදු කිරීම නොව, ඉවසීම සහ අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීමයි.[122]

අන්‍යාගමිකකරණය සම්බන්ධයෙන් පනවන සීමාවන් ගැටලු සහගත වන්නේ, ඒවා අසමානුපාතික ලෙස සුළුතර ආගම් ඉලක්ක කර ගන්නා බැවින් සහ බොහෝ විට අත්තනෝමතික ලෙස ක්‍රියාවේ යොදවමින් නීත්‍යනුකූල ක්‍රියාකාරකම් රැසක් සීමා කරන බැවිනි. එමගින් තොරතුරු ලබාදීමට මෙන්ම තොරතුරු ලබාගැනීමට ඇති අයිතිය ආරක්ෂා කරන FoE උල්ලංඝනය වේ. එවැනි නීති මගින් පුද්ගලයන්ව අනවශ්‍ය පෙළඹවීම්වලින් ආරක්ෂා කරන බවට රාජ්‍යයන් විසින් ප්‍රකාශ කළ හැකි වුවද, සාමාන්‍ය සමාජීය බලපෑම්වලට නිරාවරණය වීමෙන් පුද්ගලයන්ව ආරක්ෂා කිරීම FoE මගින් සිදු නොවන බව සැලකිල්ලට ගැනීම වැදගත් වේ.[123] අන් අයව පොළඹවා ගැනීමේ අරමුණින් සිදු කරන බලහත්කාරී නොවන මිෂනාරි හෝ දේශනා කිරීමේ ක්‍රියාකාරකම් ඇතුළුව, පුද්ගලයෙකුට තම ඇදහීම් ප්‍රකට කිරීමට ඇති අයිතිය FoRB මගින් ආරක්ෂා කරනු ලබන අතර, මෙකී සීමා කිරීම් මගින් එහි බාහිර භාවිතය ද උල්ලංඝනය වේ.[124] ආගම වලට හැරවීම වැළැක්වීමට උත්සාහ කරන අන්‍යාගමිකකරණ නීති සහ අනෙකුත් ක්‍රියාමාර්ග මගින් FoRB හි අභ්‍යන්තර භාවිතය ද උල්ලංඝනය කරනු ලබන අතර, එම භාවිතය නිරපේක්ෂ, සීමා කළ නොහැකි එකක් වේ - මන්දයත් පුද්ගලයෙකුට තම විශ්වාසයන් වෙනස් කිරීම හෝ අත්හැරීම වැළැක්විය නොහැකි අතර, පුද්ගලයාගේ තේරීම් වෙනුවට තමන්ගේ තේරීම් ආදේශ කිරීමට රාජ්‍යයට නොහැකි බැවිනි.[125]

ශ්‍රී ලංකාව තුළ, ආගම් ප්‍රචාරණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලව ආරක්ෂා වී නොමැත. ශ්‍රී ලංකාවේ

අධිකරණයන් විසින් තීන්දු කර ඇත්තේ, අන් අයව ආගමට හරවා ගැනීමේ අර්ථයෙන් ආගමක් ප්‍රචාරණය කිරීමේ අයිතියක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර නොමැති බවයි.[126] කෙසේ වෙතත්, මෑතකාලීන අධිකරණ තීන්දු මගින් පැහැදිලි කර ඇත්තේ තමාගේ ආගම පැතිරවීම හෝ අන් අයව ආගමට හරවා ගැනීමට උත්සාහ කිරීම අපරාධමය වරදක් නොවන බවත්, ඒ මත පදනම්ව අත්අඩංගුවට ගැනීම හෝ අපරාධමය වගකීමක් පැවරීම සාධාරණීකරණය කළ නොහැකි බවත්ය.[127] [බලන්න: 1.2]

2020 වසරේ සිදුකළ මෙරට සංචාරයෙන් අනතුරුව, එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු විසින් නිරීක්ෂණය කළේ සුළුතර කණ්ඩායම්-විශේෂයෙන්ම යෙහෝවාගේ සාක්ෂිකරුවන්, එවැන්ජලික ක්‍රිස්තියානි භක්තිකයන් සහ මුස්ලිම්වරුන්, ආගමික පරිවර්තනයන් මගින් බහුතර ආගමික ආධිපත්‍යයට තර්ජනයක් එල්ල වන බවට පවතින බිය හෝ එම පරිවර්තනයන් සදාචාර විරෝධී පෙළඹවීම් හරහා සිදුවන බවට පවතින මතයන් හේතුවෙන් පැන නගිනා එදිරිවාදීකමකට මුහුණ දෙන බවයි.[128] සිංහල-බෞද්ධ නායකත්වයෙන් යුත් ව්‍යාපාර ජාතික කතිකාව තුළ ප්‍රමුඛත්වය ගත්තද, ප්‍රාදේශීය මට්ටමේ බහුතරවාදී ගතිකත්වයන් ද දක්නට ලැබෙන අතර, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල වෙසෙන සෙසු ආගමික ප්‍රජාවන් සඳහා අඛණ්ඩ අභියෝග මතු කරමින්, එම ප්‍රදේශවල බිම්මට්ටමින් 'සිව සේනා' වැනි හින්දු ජාතිකවාදී කණ්ඩායම් නැගී එමින් සිටියි.[129] සාරාංශයක් ලෙස ගත්කල, ආගමික ප්‍රචාරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අත්දැකීම් මගින් පෙන්නුම් කරන්නේ බුද්ධාගම සමග රජය පවත්වාගෙන යන සමීප සබඳතාව සහ සියලු දෙනාටම ආගමික නිදහස ලබාදීමට ඇති ව්‍යවස්ථාපිත පොරොන්දුව අතර පවතින ගැටුම වන අතර, මෙමගින් විවිධත්වයෙන් යුත් බහු-ආගමික සමාජයක් තුළ FoRB සහ FoE අන්තර්ජේදනය වීමේදී ඇතිවන සංකීර්ණ ස්වභාවය මනාව පෙන්නුම් කරයි.

## 2.4 ආගමික වන්දනා ස්ථාන ලියාපදිංචි කිරීම

වන්දනා ස්ථානයක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම, FoRB ප්‍රකට කිරීමේ මූලික අංගයකි.[130] එසේ වුවද, ශ්‍රී ලංකාව තුළ ඇතැම් ආගමික සුළුතර කණ්ඩායම්වලට, විශේෂයෙන්ම කුඩා ක්‍රිස්තියානි කණ්ඩායම්වලට මෙය තවදුරටත් දුෂ්කර කාර්යයක්ව පවතී. අනිවාර්ය අනුමැතිය ලබාගත යුතු බවට සඳහන් වන පරිපාලන චක්‍රලේඛ මගින්, රාජ්‍යය විසින් වන්දනා ස්ථාන ලියාපදිංචි කිරීම වරින් වර සීමා කරනු ලැබ ඇත. 2022 වසරේදී, රජය විසින් පෙර පැවති චක්‍රලේඛයන් ප්‍රතිස්ථාපනය කරමින් සහ ඒවා තවදුරටත් පුළුල් කරමින් නව චක්‍රලේඛයක් නිකුත් කරන ලද අතර,[131] ඒ අනුව, නව වන්දනා ස්ථාන ලියාපදිංචි කිරීමට හෝ ඉදිකිරීමට පෙර අමාත්‍යාංශයේ අවසරය ලබා ගැනීම සියලුම ආගමික කණ්ඩායම් සඳහා දැන් අනිවාර්ය කර ඇත. 15(7) වගන්තිය යටතේ නීත්‍යානුකූල බලයක් නොමැති වුවද, නිවෙස් කේන්ද්‍ර කරගත් වන්දනාමාන කටයුතු නතර කරන ලෙස නියෝග කිරීමට බලධාරීන් මෙය භාවිතා කර ඇත.[132] 2024 වසරේදී නිකුත් කරන ලද රාජ්‍ය නොවන සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීමේ) පනත් කෙටුම්පත මගින් අනිවාර්ය ලියාපදිංචිය තවදුරටත් තහවුරු කරන අතර, එම සංවිධාන රජයේ ප්‍රතිපත්ති සමග අනුගත විය යුතු බවටද නියම කරයි.[133] කෙසේ වෙතත්, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව විධිමත් මෙන්ම අවිධිමත් සංගම් ද පිළිග ැනීමට නීතිය බැඳී සිටී - ඒ අනුව, සංවිධානයක් ලියාපදිංචි කිරීම අනිවාර්ය අවශ්‍යතාවයකට වඩා ස්වේච්ඡාවෙන් සිදුකරන්නක් ලෙස සැලකේ.[134] විධිමත් ලියාපදිංචියේ දී නීතිමය, සමාජීය, සංස්කෘතික හෝ ආගමික බාධාවලට මුහුණ දෙන පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට මෙය ඉතා වැදගත් වේ. සිවිල් සමාජයේ විශාල කොටසක් බැහැර කිරීම, රජයට අධික පාලන බලයක් ලබා දීම සහ ගැටලුකාරී හෝ විරුද්ධවාදී ලෙස සලකනු ලබන කණ්ඩායම් මර්දනය කිරීමට පහසුකම් සැලසීම හරහා අනිවාර්ය ලියාපදිංචිය මගින් සමාග මයේ නිදහස දුර්වල කරනු ලබයි.[135]

එබැවින්, අනිවාර්ය ලියාපදිංචිය යනු නිදහසේ සංගමයක් ලෙස එක්වීමට ඇති අයිතිය සහ සාමූහිකව රජයේ ප්‍රතිපත්ති විවේචනය කිරීමට හෝ ඒවාට එරෙහි වීමට ඇති අයිතිය සමග නොගැළපෙන්නකි.

විශේෂයෙන්ම, ලියාපදිංචිය අනිවාර්ය නොවන බව තහවුරු කරමින්, ජාතික ක්‍රිස්තියානි එවැන්ජලික සන්ධානය (NCEASL) විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම (RTI) පිළිබඳ ඉල්ලීම් කිහිපයකට ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිචාර ලැබී ඇත.[136] එබැවින්, මෙම ස්ථාවරය පරිපාලන චක්‍රලේඛවල පැහැදිලිව පිළිබිඹු වීම සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් විසින් එය අඛණ්ඩව අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ.

## 2.5 නිගමනය

FoE සහ FoRB යනු එකිනෙකට පටහැනි අයිතිවාසිකම් නොව, ඒවා මානව හිමිකම්වල විශ්වීය, අභාජ්‍ය, අන්‍යෝන්‍ය වශයෙන් රඳා පවතින සහ එකිනෙකට සම්බන්ධ ස්වභාවය තුළ මුල් බැසගත්, එකිනෙක අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් කරන්නා වූ අයිතිවාසිකම් බව මෙම පරිච්ඡේදය මගින් පෙන්වා දී ඇත. එබැවින්, FoRB ආරක්ෂා කිරීම සඳහා FoE සීමා කළ යුතුය යන මතය වැරදි සහගතය - ප්‍රායෝගිකව ගත් කල, අදහස් ප්‍රකාශනය කිරීම සීමා කිරීම මගින් බොහෝ විට සිදු වන්නේ ආගමික හෝ ආගමික නොවන විශ්වාසයන් දැරීමට, ප්‍රකාශ කිරීමට සහ බෙදා හදා ගැනීමට ඇති හැකියාවටම හානි පැමිණවීමයි.

වෛරී කථනය, දේවාපහාසය, අන්‍යාගමිකකරණය සහ වන්දනා ස්ථාන නියාමනය කිරීම යන කරුණු පරීක්ෂා කිරීමේදී, රාජ්‍යයන් බොහෝ විට නීතියෙන් අවසර දී ඇති සීමාවන් ඉක්මවා කටයුතු කරන ආකාරය පැහැදිලි වේ. වෙනස්කොට සැලකීම, එදිරිවාදීකම හෝ ප්‍රචණ්ඩත්වය සඳහා පෙළඹවීම වැළැක්වීම පිණිස ඇතැම් සීමා පැනවීම් සාධාරණීකරණය කළ හැකි වුවද, හුදු අමනාපය පළ කිරීම, විවේචනය කිරීම හෝ සාමකාමී ආගමික ප්‍රකාශනයන් සාපරාධී ක්‍රියාවන් ලෙස සැලකීම FoE සහ FoRB යන දෙකම උල්ලංඝනය කිරීමක් වන අතර, මෙය සුළුතර කණ්ඩායම්වලට අසමානුපාතික ලෙස හානි පමුණුවනවා සේම ප්‍රතිවිරුද්ධ මතයන් නිහඬ කිරීමේ අවදානමක් ද ඇති කරයි. විශේෂයෙන්ම, දේවාපහාස නීති මගින් පුද්ගලයන්ට වඩා ඇදහීම් ආරක්ෂා කරනු ලබන අතර, ඒවා මානව හිමිකම් මූලධර්ම සමග නොගැළපේ.

ICCPR සහ රබාත් ක්‍රියාකාරී සැලැස්ම ඇතුළු ජාත්‍යන්තර ප්‍රමිතීන් මේ සම්බන්ධයෙන් පැහැදිලි මගපෙන්වීමක් සපයයි: ඕනෑම සීමා කිරීමක් නීත්‍යනුකූල, අත්‍යවශ්‍ය සහ සමානුපාතික විය යුතු අතර, එමගින් අදාළ අයිතිවාසිකමේ මූලික හරයට හානි නොවිය යුතුය. ශ්‍රී ලංකාවේ අත්දැකීම් මගින් ඉස්මතු කරන්නේ, අපැහැදිලි නීති සහ බහුත්වවාදයේ නාමයෙන් බහුතරයේ අවශ්‍යතාවලට ප්‍රමුඛතාව ලබා දෙන පරිපාලන පාලන තන්ත්‍රයන්ගේ ඇති භයානකකමයි. තිරසාර ආගමික සහජීවනය ළඟා කර ගත හැක්කේ වාරණය මගින් නොව, සැබෑ හානිකර උසි ගැන්වීම් සම්බන්ධයෙන් ක්‍රියා කරන අතරතුර විවෘත ප්‍රකාශනය ආරක්ෂා කිරීමෙන් වන අතර, එමගින් මෙකී අයිතිවාසිකම් ද්විත්වයේම අනුපූරක හා සමාන භුක්ති විඳීම සහතික කිරීමෙනි.





# 3 වන පරිච්ඡේදය

මෙම පරිච්ඡේදය මගින් ආගමික හෝ විශ්වාස කිරීමේ නිදහස (FoRB) සහ ප්‍රකාශනයේ නිදහස (FoE) යන අයිතිවාසිකම් එකිනෙක අන්තර්ඡේදනය වන විට, ඒවා වැරදියට වටහා ගැනීම හෝ උල්ලංඝනය කිරීම නිසා පැන නගින ආතතීන් පිළිබඳව ගවේෂණය කරනු ලබයි. මෙම විශ්ලේෂණය සඳහා 2023 සිට 2025 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවෙන් වාර්තා වූ වෛරී කථනය, ආගමික ප්‍රචාරණය සහ දේවාපහාසය පිළිබඳ චෝදනා කේන්ද්‍ර කරගත් සිදුවීම් සහ විශේෂඥ සම්මුඛ සාකච්ඡා උපයෝගී කර ගනු ලබයි.

## 3.1 ආගම ආරක්ෂා කිරීම, මිනිසුන් ආරක්ෂා කිරීම

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් මගින්, පුද්ගලයෙකුට තම ආගම සාමකාමීව[137] භාවිතයේ යෙදවීමට ඇති අයිතිය ආරක්ෂා කිරීම සහතික කරනු ලබයි. මෙයට ඇදහිල්ලක් දැරීමට ඇති නිදහස හා එය පිළිපැදීම, වන්දනාමාන කිරීම, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සහ ඉගැන්වීම මගින් එය ප්‍රකට කිරීමට ඇති නිදහස ඇතුළත් වේ [බලන්න: 1.1].

මෙම ආරක්ෂණ විධිවිධාන මගින් පුද්ගලයන් සුරක්ෂිත කිරීමට අදහස් කළද, ඒවායින් ආගම හෝ ආගමික සංකේත විවේචනයට ලක්වීම වළක්වනු නොලැබේ.[138] කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව තුළ "ආගමික හැඟීම්" ආරක්ෂා කිරීම සඳහා විවිධ දේශීය නීති නිතර භාවිත කිරීම හෝ වැරදි ලෙස අර්ථකථනය කිරීම නිසා මෙම සීමා මායිම් අපැහැදිලි වී ඇත.[139] මීට අමතරව, බුද්ධාගම සහ රාජ්‍යය අතර පවතින සමීප සබඳතාවය බොහෝ විට - දේශපාලන අරමුණු මත - බුද්ධාගමට අපහාස වන බවට සැලකෙන ප්‍රකාශයන් සාපරාධීකරණය කෙරෙන උත්සාහයන් කෙරෙහි බලපා ඇත.

### හාස්‍යයණී උපහාසය හෝ ආගමට අපහාස කිරීම

2023 මැයි මාසයේදී, සජීවී හාස්‍යෝත්පාදක ශිල්පිනී නතාෂා එදිරිසූරිය සිය ප්‍රසංගයක් අතරතුර බුද්ධාගමට අපහාස කළ බවට එල්ල වූ චෝදනා මත අත්අඩංගුවට ගන්නා ලදී. 2007 අංක 56 දරන ICCPR පනතේ 3 වන වගන්තිය (වෙනස්කොට සැලකීම, එදිරිවාදිකම හෝ ප්‍රචණ්ඩත්වය සඳහා උසි ගැන්වීම), දණ්ඩ නීති සංග්‍රහයේ 120, 291 අ සහ 291 ආ වගන්ති (විරුද්ධත්වය ඇති කිරීම සහ ආගමික හැඟීම්වලට රිදවීම පිළිබඳව) සහ පරිගණක අපරාධ පනතේ 6 වන වගන්තිය යටතේ ඇය සම්බන්ධයෙන් විමර්ශනය කරන සිදුකරන ලදී.[140]

ඇයට ඇප ලබා දීමෙන් 'මහජන කැළඹීමක්' ඇති විය හැකි බව පවසමින්

මුලින්ම ඇප ප්‍රතික්ෂේප වූ අතර, ඒ හේතුවෙන් 2023 ජූලි මාසය දක්වා ඇය රක්ෂිත බන්ධනාගාරගතව සිටියාය.[141] පසුව, මෙම නඩුව 2024 ජූනි මාසයේදී ලබා දුන් සන්ධිස්ථානගත නඩු තීන්දුවක් මගින් නිෂ්ප්‍රභ කරන ලදී.[142] මෑතකදී, එනම් 2026 පෙබරවාරි මාසයේදී, ඇයව නීතිවිරෝධී ලෙස අත්අඩංගුවට ගැනීමට එරෙහිව ගොනු කරන ලද මූලික අයිතිවාසිකම් පෙත්සමක් විභාග කර අවසන් කරන ලදී.[143]

ඇය අත්අඩංගුවට ගැනීම පිටුපස තිබූ අභිප්‍රාය පිළිබඳව සාකච්ඡා කරමින් එදිරිසූරිය පැහැදිලි කළේ, ඇය බුදුදහමට අපහාස කිරීම හරහා "ආගම් අතර ප්‍රචණ්ඩත්වය උසි ගැන්වීමට උත්සාහ කළ" නිසා එය සිදු කළ බව මතුපිටින් පෙනෙන්නට තිබුණද, ඇත්ත වශයෙන්ම එය එල්ල වූයේ ලිංගිකත්වය පිළිබඳ ඇය කළ විවෘත ප්‍රකාශයන් ඉලක්ක කර ගනිමින් බවයි. ඇය මෙම පසුබිම විග්‍රහ කරමින්, ලිංගික අතවර, ලිංගික අධ්‍යාපනය සහ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය (GBV) යන ක්ෂේත්‍රවල තමන් නියැලී සිටින ක්‍රියාකාරීත්වය පිළිබඳව විස්තර කළ අතර, එහිදී "ලිංගික අතවර ගැන කතා කිරීමට පෙර ලිංගිකත්වය ගැන කතා කිරීම" යන ඇයගේ ප්‍රවේශය සිය හාස්‍යෝත්පාදක නිර්මාණ සඳහා පදනම් වූ ආකාරය ද ඇය පැහැදිලි කළාය.[144]

අප්‍රේල් 01 වන දින පවත්වන ලද එම ආන්දෝලනාත්මක ඉදිරිපත්කිරීමේ දී ද, එදිරිසූරිය විසින් බෞද්ධ බාලිකා විද්‍යාලයක ශිෂ්‍යාවන් මුහුණ දෙන ලිංගික අත්දැකීම් සහ කන්‍යාභාවයට ලබා දී ඇති වැදගත්කම පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය. ඇය වැඩිදුරටත් පැහැදිලි කළේ, **ලිංගිකත්වය පිළිබඳව ඇය කළ අදහස් දැක්වීම් අපරාධමය වරදක් ලෙස සැලකිය නොහැකි බැවින්, ඇයට එරෙහිව බුදුදහමට අපහාස කිරීමේ චෝදනාව එල්ල කිරීමට ඇය බුදුන් වහන්සේ පිළිබඳව සඳහන් කළ කොටස යොදාගත් බවයි.** මෙම කොටසේදී ඇය බුදුන් වහන්සේ ජීවත් වූ සමයේ විසූ මවක හෝ පියෙකු තම දරුවා සිද්ධාර්ථ කුමාරයා සමග හෝ බුදුන් වහන්සේ සමග සසඳන ආකාරය අනුකරණය කරමින් ශ්‍රී ලාංකික දෙමාපියන්ගේ පවතින තරඟකාරී ස්වභාවය උපහාසයට ලක් කළාය. ["අර සුද්ධෝදනගේ ළමයා [බුදුන් වහන්සේ] ඉපදුණු දවසේම ඇවිදලා... එකට මේ ගොල්ලෝ වඩාගත්තම බෙල්ල කඩාගෙන වැටෙනවා.."][145]

මෙම වාක්‍යයන් ඔස්සේ ඇයව ඉලක්ක කිරීම මගින් **එවකට පැවති රජයේ දේශපාලන න්‍යාය පත්‍රයට වාසියක් අත්වූ බව** එදිරිසූරිය පැහැදිලි කළ අතර එම රජය 'අරගලයෙන්. පසුව සිය දේශපාලන අදාළත්වය පවත්වා ගැනීමට සහ "කැපී පෙනීමට" දැඩි උත්සාහයක නිරත වෙමින් සිටි බව ඇය පෙන්වා දුන්නාය.[146] ඇය බෞද්ධයකු වුවද, පුවත්පත් සාකච්ඡා හරහා ඇය "බුදුදහමට අපහාස කරන" ක්‍රිස්තියානි කාන්තාවක ලෙස වැරදි ලෙස හඳුන්වා දුන් ආකාරය ඇය සිහිපත් කළාය.

**බොහෝ විට 'බහුතර ප්‍රජාව සැනසීමට' සහ ඇත්ත වශයෙන්ම ඔවුන් නොසන්සුන්තාවයක් ඇති කිරීමෙන්** වළක්වා ගැනීමට' එවැනි නීති භාවිතා කරන සහ අවභාවිත කරන ආකාරය පිළිබඳව එදිරිසූරියගේ නඩුව කදිම නිදසුනකි.[147] ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව (HRCSL) විසින් එම අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශනවලදී, එය "හුදු පැමිණිල්ලක් මත පමණක් සිදු කළ නීතිවිරෝධී ක්‍රියාවක්" බව අනාවරණය විය.[148] එකී පැමිණිලිකරුට "සමාජය අභිප්‍රේරණය කිරීමට බලය ඇති" පමණින්ම අයෙකු අත්අඩංගුවට ගැනීම විමර්ශකයෙකුගේ කාර්යය නොවන බව අවධාරණය කළ කොළඹ මහාධිකරණයේ ඇප නියෝගය මෙයින් මනාව පිළිඹිබු වේ.[149]

මෙම සොයාගැනීම් මගින් 'බෞද්ධ තොරතුරු මධ්‍යස්ථානය' (BIC)[150] වැනි සංවිධානවල බලපෑම සහ අත්අඩංගුවට ගැනීමට සෘජුවම මැදිහත් වූ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය වැනි රාජ්‍ය ආයතනවල බලපෑම අනාවරණය කරයි.[151] ශක්තික සත්කුමාර නඩුවේදී ද පැමිණිලිකරුවෙකු[152] ලෙස කටයුතු කර ඇත්තේ BIC බව පෙනීගොස් තිබේ. 2019 අප්‍රේල් මාසයේදී සත්කුමාරව අත්අඩංගුවට ගනු ලැබුවේ මෙම නීති යටතේම වන අතර, ඒ සඳහා පදනම් වූයේ සමලිංගිකත්වය යන තේමාවන්

අන්තර්ගත වූ සහ හිටපු බෞද්ධ භික්ෂුවක සම්බන්ධ වී තිබීමට ඉඩ ඇති ලිංගික අපයෝජනයක අවස්ථාවක් පිළිබඳව වක්‍රව ඉඟි කළ ඔහුගේ සාහිත්‍ය නිර්මාණය 'බුද්ධාගමට අපහාසාත්මක' බවට වූ තර්කයයි.[153]

**මුලදී එවැනි ප්‍රතිචාරයක් ඇති නොකළ ඉදිරිපත් කිරීමක් සම්බන්ධයෙන්, කෝපය සහ ආගමික වෛරය සැලසුම්සහගතව මෙහෙයවීම සඳහා** තෙවන පාර්ශවයන් විසින් ඉටු කළ කාර්යභාරය එදිරිසූරියගේ නඩුවේදී ද පැහැදිලි විය.

මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා වූ සැලසුම් සහගත ප්‍රයත්නයක් එදිරිසූරිය විසින් විස්තර කෙරුණු අතර, එහි නායකත්වය දීමට සිංහල ජාතිකවාදී ඩෑන් ප්‍රියසාද්ව[154] යොදාගෙන තිබුණි. මෙහි උපක්‍රමය ලෙස ඇයගේ රංගනයේ කොටස් සන්දර්භයකින් තොරව ඉදිරිපත් කරනු ලැබූ මාධ්‍ය සාකච්ඡාවක් සහ ඇයගේ ඉදිරිපත් කිරීමේ සංස්කරණය කරන ලද, නොමග යවන සුළු තත්පර 90ක වීඩියෝ දර්ශනයක් අන්තර්ජාලය ඔස්සේ සංසරණය කිරීම ඇතුළත් විය. සන්දර්භයෙන් බැහැරව බලන කල, එම වීඩියෝව බුද්ධාගමට අපහාස වන අයුරින් ව්‍යංගාර්ථයන්ගෙන් පිරී පවතින බවක් පෙනෙන්නට තිබුණි. බුද්ධාගමට අපහාස වී ඇති බව පවසමින් මාධ්‍ය සාකච්ඡාවේදී පවත්වන ලද ආවේගශීලී කතා ද ඉන් අනතුරුව අන්තර්ජාලය ඔස්සේ බෙදා හරින ලද අතර, එය මහජනයා කුපිත කිරීමට හේතු විය. එදිරිසූරිය විසින් නිරීක්ෂණය කරනු ලැබූ පරිදි, වඩාත් වැදගත් කරුණ නම්, දින කිහිපයකට පසු එම මාධ්‍ය සාකච්ඡාවේ වීඩියෝව ඉවත් කර තිබීමයි. එමගින් ඩෑන් ප්‍රියසාද් සමග පැවති සම්බන්ධය මකා දැමුණු අතර, එයින් ඇති වූ කෝපය ඇයගේ ඉදිරිපත් කිරීමට එරෙහිව ස්වයංසිද්ධව පැන නැගුණු ප්‍රතිචාරයක් ලෙස නව අර්ථකථනයක් ලබා දෙන ලදී.[155]

එම නිසා, එදිරිසූරියගේ ප්‍රකාශයන් ICCPR **පනතේ 3 වන වගන්තිය ක්‍රියාත්මක කිරීමේදී සැලකිල්ලට ගත යුතු, රබාත් ක්‍රියාකාරී සැලැස්ම මගින් නියම කර ඇති ඉහළ දේහලියන්ට අනුකූල නොවන බව තීරණය විය.[156]** ඇයගේ සමීපතම ප්‍රේක්ෂකයන් ඇයට ධනාත්මක ලෙස පමණක් ප්‍රතිචාර දැක්වූ අතර,[157] ඒ සම්බන්ධයෙන් සිදු කළ විමර්ශනවලදී හෙළි වූයේ "බෞද්ධ ප්‍රජාව කෙරෙහි කිසිදු එදිරිවාදීකමක්" නොතිබූ බවත්, ඇයගේ අදහස් දැක්වීම් "හාස්‍යය සහ වින්දනය සඳහා වූ අරමුණින්" පමණක් සිදු කර ඇති බවත්ය.[158] මුල් ඉදිරිපත් කිරීමෙන් මාසයකට වැඩි කාලයකට පසුව එල්ල වූ බුද්ධාගමට අපහාස කිරීමේ චෝදනා සහ එල්ල කරන ලද තර්ජන ඇතුළු සිදුවීම් කාලරේඛා පෙළගැස්ම විසින්[159] මෙම සොයාගැනීම් තවදුරටත් තහවුරු කරයි.

## සංසන්දනාත්මක ආගම්, ආගමික අපහාසය හෝ වෛරී සම්ප්‍රචාරණය?

හාස්‍යය සහ උපහාසය යන විශයපථයන්ගෙන් ඔබ්බට ගොස් බැලුවිට, ආගමික දේශකයින්ට ද ආගම සම්බන්ධයෙන් ඔවුන් කළ ප්‍රකාශයන් හේතුවෙන් මේ හා සමාන නීතිමය ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදු වී ඇති බැව් පෙනේ.

2023 දෙසැම්බර් මාසයේදී, එම වසරේම අප්‍රේල් මාසයේ පැවැත්වූ දේශනයකදී බුදුන් වහන්සේට සහ අනෙකුත් ආගමික ශාස්තෘවරුන්ට අපහාසයක් වන අයුරින් සිදුකළ ප්‍රකාශ සම්බන්ධයෙන් පාස්ටර් ජෙරම් ප්‍රනාන්දු අත්අඩංගුවට ගන්නා ලදී.[160] හින්දු භක්තිකයන් සතුන්ට වැඳුම්පිදුම් කිරීම හෑල්ලුවට ලක් කරමින් කළ ප්‍රකාශ සහ බුදුන් වහන්සේ 'ඇත්ත වශයෙන්ම සොයමින් සිටියේ යේසුස් වහන්සේවයි' යනුවෙන් කළ ප්‍රකාශයන් ද කෝපයක් ඇති කිරීමට හේතු විය. ඔහුට එරෙහිව ICCPR පනතේ 3 වන වගන්තිය සහ දණ්ඩ නීති සංග්‍රහයේ 291 ආ වගන්තිය යටතේ චෝදනා එල්ල විය.

**පාස්ටර් ප්‍රනාන්දුගේ සිද්ධිය "බහුතර ප්‍රජාව සතුටු කිරීම" සඳහා ඇති කඩිමුඩිය තවදුරටත් පැහැදිලි කරයි.[161]** සීඅයිඩී ය ක්‍රියාත්මක වූයේ පැමිණිලි කිහිපයක් පදනම් කරගෙන වන අතර, විශේෂයෙන්ම බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ මූලිකත්වයෙන් යුත් නව භික්ෂු පෙරමුණ සහ පාර්ලිමේන්තු මන්ත්‍රී උදය ගම්මන්පිල මහතාගේ නායකත්වයෙන් යුත් පිවිතුරු හෙළ

උරුමය විසින් කරන ලද පැමිණිලි ඒ අතර ප්‍රමුඛ වේ.[162] ප්‍රධාන පාර්ශ්වයන් විසින් එල්ල කරන ලද චෝදනා මධ්‍යයේ, එවකට ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ද මැදිහත් වෙමින් මේ පිළිබඳව වහාම පරීක්ෂණයක් පවත්වන ලෙස නියෝග කළේය.[163]

**කෙසේ වෙතත්, පාස්ටර් ප්‍රනාන්දුගේ ප්‍රකාශයන් කෙරෙහි මහජන අවධානය යොමු කිරීමට සහ පරීක්ෂණ කිරීමට බලපෑම් කිරීමට වෙනත් අසම්බන්ධිත සාධක ද හේතු වී ඇති බව පෙනේ.** මුදල් විශුද්ධිකරණය පිළිබඳ චෝදනා මධ්‍යයේ ඔහුගේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් වෙනම පරීක්ෂණයක් ආරම්භ කළද,[164] ඔහුගේ සාම්ප්‍රදායික නොවන ක්‍රියාකාරකම් පිළිබඳව එල්ල වූ විවේචන ද පරීක්ෂණ හැඩගැස්වීමට හේතු වී ඇත. මීට පාස්ටර් ප්‍රනාන්දුගේ පෞද්ගලික ප්‍රචාරණය කෙරෙහි දක්වන දැඩි උනන්දුව සහ 'සමෘද්ධි සුභාරංචිය. දේශනා කිරීම කෙරෙහි යොමු කෙරුණු අවධානය ද ඇතුළත් වේ.[165]

තමා "කිසිදු වරදක් කර නැති" බව පවසමින්, නමුත් තම වචනවලින් යමෙකුගේ "හැඟීම්වලට රිදීමක් ඇති වූයේ නම්" ඒ පිළිබඳව කණගාටු වන බවට පාස්ටර් ප්‍රනාන්දු ඉදිරිපත් කළ කොන්දේසි සහිත සමාව අයැදීම[166] මගින් ඔහුගේ නඩුවට කිසිම උපකාරයක් සිදු නොවීය. 2026 ජනවාරි මාසය වන විටත්, ඔහුගේ ආන්දෝලනාත්මක ප්‍රකාශ සහ මුදල් විශුද්ධිකරණය සම්බන්ධ චෝදනා පිළිබඳ නඩු විභාග වෙමින් පවතින නමුත්, ඇප කොන්දේසියක් ලෙස පනවා තිබූ විදෙස් ගමන් තහනම 2025 මාර්තු මාසයේදී ඉවත් කරන ලදී.[167]

**එදිරිසූරියගේ නඩුවේදී මෙන්ම, පාස්ටර් ප්‍රනාන්දුගේ දේශනය ද ICCPR පනතේ 3 වන වගන්තිය යෙදවීම සඳහා අවශ්‍ය වන ඉහළ දේහලිය සපුරා ඇති බවක් පෙනෙන්නට නැත.** නීතිඥ තිෂ්‍ය වේරගොඩ මෙම නඩුව සම්බන්ධයෙන් පුවත්පත් සාකච්ඡාවකදී සඳහන් කරන පරිදි, යම් ප්‍රකාශයක් "වගකීම් විරහිත" වූ පමණින්ම නීතිය ක්‍රියාත්මක කළ නොහැක.[168] පාස්ටර් ප්‍රනාන්දුගේ ප්‍රකාශයන් අනුවණ ලෙස ඉදිරිපත් කෙරී ඇති අතර, එමගින් වසර ගණනාවක් පැරණි විශ්වාසයන් සුළු කොට තකා ඇති බව පෙනී ගියද, ඔහුගේ අභිප්‍රාය[169] වී ඇත්තේ ආගම් අතර සංසන්දනයක් සිදු කරමින් ක්‍රිස්තියානි ධර්මයේ උත්තරීතර භාවය වෙනුවෙන් තර්ක කිරීම බව පෙනේ. මෑතකදී මාධ්‍ය වෙත ලබා දුන් සම්මුඛ සාකච්ඡාවකදී ඔහු කියා සිටියේ, ඔහුගේ "අභිප්‍රාය වූයේ අනෙකුත් ලබ්ධීන් වලට... ඔවුන්ගේ චින්තනය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සුභාරංචියට එතරම් දුරස් නොවන බව පෙන්වා දීම" බවයි.[170] තවද, ඔහුගේ ඉලක්කගත ශ්‍රාවකයන්ගෙන් ලැබුණේ ධනාත්මක ප්‍රතිචාරයක් පමණක් බව මාධ්‍ය වාර්තා මගින් පෙන්නුම් කරන අතර[171], එමගින් ආසන්න අනතුරක් සිදුවීමේ අවදානමක් නොමැති හෝ එය ඉතා අවම බව අඟවනු ලබයි.[172]

**එදිරිසූරිය සහ පාස්ටර් ප්‍රනාන්දු යන දෙදෙනාගේම නඩු, ප්‍රචණ්ඩත්වය උසි ගැන්වීමට හේතුවන ප්‍රකාශවලින් ප්‍රජාවන් ආරක්ෂා කිරීමේ මූලික අරමුණ ඇතිව සකස් කරන ලද ICCPR පනතේ 3 වන වගන්තිය, ඒ වෙනුවට ව්‍යාජ දේවාපහාස නීතියක් ලෙස භාවිත කර ඇති ආකාරය පිළිබඳව කදිම නිදසුන් වේ.[173]** ඇයගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට HRCSL විසින් කරන ලද නිගමනයකින් පසුව, එදිරිසූරිය 2024 සැප්තැම්බර් මාසයේදී ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ නඩුවක් ගොනු කළ නමුත්, සමාව අයැදීමක් සිදු කිරීම සහ ICCPR පනත යටතේ අත්අඩංගුවට ගැනීමේ ක්‍රියාපටිපාටීන් ප්‍රතිසංස්කරණය කිරීම යන කොන්දේසි මත පදනම්ව එම නඩුව ඇය විසින් සමථයකට පත් කෙරිණ. 2026 පෙබරවාරි 19 වන දින සිදු වූ සාධනීය වර්ධනයක් ලෙස, ICCPR පනත යටතේ අනාගතයේදී සිදුවිය හැකි නීති විරෝධී අත්අඩංගුවට ගැනීම් වැළැක්වීම සඳහා වන මාර්ගෝපදේශ ඇතුළත් නව චක්‍රලේඛයක් සියලුම පොලිස් නිලධාරීන් වෙත නිකුත් කරන බවට සහතිකයක් ලබා දෙන ලදී. තවද, ඇයට සිදු වූ "මානසික සහ චිත්තවේගීය පීඩාව" මෙන්ම ඇයගේ "කීර්තිනාමයට සහ ගෞරවයට" සිදු වූ හානිය සම්බන්ධයෙන් අදාළ අත්අඩංගුවට ගැනීම සිදුකළ නිලධාරියා ඇගෙන් සමාව අයැද සිටියේය.[174]

**මෙම නඩු දෙකෙන්ම පැහැදිලි වන්නේ, දේවාපහාසයක් සිදු වුයේ යැයි කියනු ලබන අවස්ථාවලදී නඩු පැවරීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ 291ආ වගන්තිය භාවිත කරන ආකාරයයි - මෙය FoRB සහ FoE පිළිබඳ මානව හිමිකම් මූලධර්ම සමග ගැටෙන විධිවිධානයකි.** කෙසේ වෙතත්, නීති විශාරද ආචාර්ය ගෙහාන් ගුණතිලක පෙන්වා දෙන පරිදි, දණ්ඩ නීති සංග්‍රහයේ 291ආ වගන්තිය යටතේ 'යහපත් චේතනාවෙන් යුතුව නඩු පැවරීම' සහ 'දුෂ්ට චේතනාව ඔප්පු කිරීම' එතරම් පහසු නොවේ.[175] මෙය එදිරිසූරිය නඩුවේ මහාධිකරණ තීන්දුව සමග ප්‍රතිරාව නංවන්නකි. එහි සඳහන් වුයේ "යම් ක්‍රියාවක් දුෂ්ට චේතනාවකින් තොරව හිතාමතා කළ එකක් විය හැකි අතර, එය හිතාමතා නොකළද දුෂ්ට චේතනාවෙන් යුක්ත විය හැකිය... (සහ) වරදක් අර්ථ ගැන්වීම සඳහා අවශ්‍ය වන්නේ එම කරුණු දෙකම (හිතාමතා කිරීම සහ දුෂ්ට චේතනාව) පැවතීමයි."

**එදිරිසූරියගේ නඩුවේදී දණ්ඩ නීති සංග්‍රහයේ 291ආ වගන්තිය වැරදි ලෙස භාවිත කර ඇති අතර, පාස්ටර් ප්‍රනාන්දු සම්බන්ධයෙන් ද එය එලෙසම අනිසි ලෙස භාවිත කර ඇති බව පෙනී ගියද, අනෙකුත් ඇතැම් අවස්ථාවලදී එය උචිත ලෙස භාවිත කර ඇති බවක් පෙනෙන්නට තිබීම සංකීර්ණ ප්‍රශ්න මතු කරයි.**

2023 ඔක්තෝබර් මාසයේදී, සමස්ත ලංකා ජම්යතුල් උලමා සභාව (ACJU) විසින් කරන ලද පැමිණිලිවලට අනුව ක්‍රියාත්මක වු පොලිස් පරිගණක අපරාධ කොට්ඨාසය,[176] ඉස්ලාම් දහමට අපහාස වන අයුරින් ප්‍රකාශ නිකුත් කිරීම සහ ජාතික හා ආගමික සමගියට හානි කිරීම යන චෝදනා මත ජ්‍යෝතීර්වේදී ඉන්දික තොටවත්ත ව අත්අඩංගුවට ගත්තේය.[177] ඔහුට එරෙහිව දණ්ඩ නීති සංග්‍රහයේ 291ආ වගන්තිය යටතේ චෝදනා එල්ල කරන ලදී.[178]

නිරන්තරයෙන් ඉස්ලාම් දහම ඉලක්ක කරගනිමින් ආගමික ශාස්තෘවරුන්ට අපහාස කිරීමේ ඉතිහාසයක් ඇති අයෙකු ලෙස තොටවත්ත ව හඳුනාගෙන ඇත.[179] මෙම සිදුවීමේදී, ඔහු මුහම්මද් නබිතුමා ඉලක්ක කරගනිමින් උද්වේගකර භාෂාවක් භාවිතා කරමින් සමාජ මාධ්‍ය පෝස්ටුවක් පළ කර ඇති අතර, එහිදී එතුමා ට "අසාමාන්‍ය ලිංගික ආශාවන්" ඇති බවට නැවත නැවතත් චෝදනා කර තිබුණි.[180]

ඔහුගේ අත්අඩංගුවට ගැනීමෙන් සති දෙකකට පසු, තොටවත්ත විසින් ඉදිරියේදී ආගමික අපහාස සිදු කිරීමෙන් වැළකී සිටිය යුතු යන කොන්දේසිය මත ඔහුව ඇප මත මුදා හරින ලදී.[181] චූදිතයා සිය ප්‍රකාශය පිළිබඳව කණගාටුව පළ කර එය ඉල්ලා අස්කර ගන්නේ නම්, මිත්‍රශීලී සමථයකට එළඹීමට පැමිණිලිකරු එකඟතාවය පළ කර තිබුණද, තොටවත්ත සමාව අයැදීම ප්‍රතික්ෂේප කර සිය ස්ථාවරය වෙනස් නොකර සිටින බැවින් නඩුව විභාගය සඳහා ඉදිරියට ගෙන යනු ලැබේ.[182]

**මෙම නඩුවේදී දණ්ඩ නීති සංග්‍රහයේ 291ආ වගන්තිය යෙදීම උචිත බව පෙනී ගියද - විශේෂයෙන්ම තොටවත්තගේ ඉතිහාසය සහ සමාව අයැදීම ප්‍රතික්ෂේප කිරීම සැලකිල්ලට ගත් විට - FoRB මගින් ආරක්ෂා කරනු ලබන්නේ මිනිසුන් මිස ආගම්, පුද්ගලයන් හෝ සංකේත නොවේ.**

ආගමක් පිළිබඳව කරනු ලබන ප්‍රකාශයක් කෙතරම් අපහාසාත්මක වුවද, එම ආගම අදහන පුද්ගලයන්ට එම ප්‍රකාශය කළ පුද්ගලයාට දඬුවම් පමුණුවන ලෙස ඉල්ලා සිටීමට වලංගු අයිතියක් මානව හිමිකම් නීතිය යටතේ නොමැති බවත්, එවැනි වරදකරුවන් කිරීම් "FoRB ලැබූ ජයග්‍රහණයක් ලෙස සැලකිය නොහැකි" බවත් ආචාර්ය ගුණතිලක තර්ක කරයි.[183] ආචාර්ය ගුණතිලක මෙම නිරීක්ෂණයන් සිදු කළේ, 2024 මාර්තු මාසයේදී ආවේගශීලි භික්ෂුවක වන බොදුබල යේ ඥානසාර හිමියන් 291ආ යටතේ වරදකරු කරනු ලැබීමට ප්‍රතිචාර වශයෙනි. 2016 වසරේ කුරුණෑගල බෞද්ධ විහාරස්ථානයක පැවැති ප්‍රවෘත්ති සාකච්ඡාවකදී මුස්ලිම් විරෝධී ප්‍රකාශ සිදු කිරීම සම්බන්ධයෙන් කොළඹ මහාධිකරණය විසින් ඥානසාර හිමියන්ට දඬුවම් නියම කරන ලදී. ආගමික හැඟීම්වලට පලුදු කළ බවට එල්ල වු චෝදනාවලට අදාළව, ඔහුගේ ප්‍රකාශ "චේතනාන්විත සහ ද්වේෂසහගත"

බව විනිසුරුවරයා තීන්දු කළේය. 2025 ජනවාරි මාසයේදී, ඉදිරිපත් කරන ලද ප්‍රතිශෝධන පෙත්සමකට අනුව, උන්වහන්සේට මාස නවයක සිර දඬුවමක් නියම වූ අතර පෙබරවාරි මාසයේදී ඇප ලබා දෙන ලදී.[184]

**පූජ්‍ය ඥානසාර හිමියන් සම්බන්ධ සිදුවීම් හරහා ශ්‍රී ලංකාවේ වෛරී කථනය පිළිබඳ නීති ක්‍රියාත්මක කිරීමේදී පවතින වරණීය සහ ගැටලුකාරී ස්වභාවය තවදුරටත් අනාවරණය වේ.** මුස්ලිම්වරුන් ඇතුළු සුළුතර ජාතීන්ට එරෙහිව ව්‍යාපාර රැසකට නායකත්වය දීම සම්බන්ධයෙන් ඥානසාර හිමියන් කුප්‍රකට වී තිබේ. 2024 මාර්තු මාසයේ ලබා දුන් වරදකරු කිරීමේ තීන්දුවේදී 291ආ වගන්තිය නිවැරදිව යොදාගෙන තිබුණද, එම විධිවිධානය තවමත් මානව හිමිකම් මූලධර්මයන් සමග නොගැළපෙන තත්ත්වයක පවතී. කෙසේ වෙතත්, 2014 ජුනි සහ 2018 මාර්තු මාසවලදී අවම වශයෙන් මුස්ලිම් විරෝධී කෝලාහල දෙකක් වත් උසි ගැන්වීම සම්බන්ධයෙන් පූජ්‍ය ඥානසාර හිමියන්ට එරෙහිව නඩු පැවරීම සඳහා ICCPR පනතේ 3 වන වගන්තිය කිසිවිටෙකත් ක්‍රියාත්මක නොවීම විශේෂත්වයකි.[185] **ICCPR පනතේ 3 වන වගන්තිය බොහෝ විට ව්‍යාජ-දේවවාපහාස නීතියක් ලෙස අනිසි ලෙස භාවිතා කළ ද, එය පනතේ අපේක්ෂිත අරමුණ වෙනුවෙන් ක්‍රියාත්මක කර නොමැත.**

**කෙසේ වෙතත්, තොටවත්තගේ නඩුව මගින් කිසියම් ප්‍රජාවක් ඉලක්ක කිරීමේ චේතනාවෙන් යුතුව ආගම භාවිතා කරමින් සිදු කරනු ලබන කථනයන් සම්බන්ධයෙන් යම් යම් ප්‍රශ්නාර්ථයන් මතු කරයි.**

FoE සීමා කිරීම සම්බන්ධයෙන් පවතින ගැටලු සහ ඒ සඳහා "සීමා ඉර ඇඳීමේ අපහසුතාව" පිළිගන්නා අතරම, මෙම නඩුව මූලික වශයෙන් ඉදිරිපත් කළේ "විරෝධතාවයේ එක් ආකාරයක්" ලෙස බව පැමිණිලිකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥ ශිරාස් නූර්දීන් අවධාරණය කළේය. තොටවත්තට දඬුවම් කිරීම වෙනුවට පීඩාවට පත් මුස්ලිම් ජනතාවගේ ගැටලු කෙරෙහි අවධානය යොමු කරවීම තම අරමුණ වූ බවත් ඔහු පැහැදිලි කළේය.[186]

වැඩිදුරටත් කරුණු පැහැදිලි කරමින් නූර්දීන් පෙන්වා දුන්නේ, ඉස්ලාම් දහමට එල්ල වන අඛණ්ඩ ප්‍රහාර සම්බන්ධයෙන් නිසි පියවර නොගතහොත්, ඒ තුළින් රජය අසාධාරණ ලෙස කටයුතු කරන බවට මුස්ලිම් ප්‍රජාව තුළ සහ විශේෂයෙන්ම තරුණ පරපුර තුළ ඇති විය හැකි වැරදි වැටහීම හේතුවෙන් දීර්ඝකාලීන බලපෑමක් ඇති විය හැකි බවයි. තමන්ගේ ප්‍රවේශය පිළිබඳව පැහැදිලි කරමින් නූර්දීන් පැවසුවේ, යුක්තිය ඉටුකර ගත හැකි බව ඔප්පු කර පෙන්වමින්, එහි ස්පර්ශනීය ප්‍රතිඵල දැකීමට මුස්ලිම් ප්‍රජාවට අවස්ථාව සැලසීමට තමන්ට අවශ්‍ය වූ බවයි. පරිපාලනමය යුක්තිය පසිඳලීම මගින් මෙම දුක්ගැනවිලි විසඳීමට ප්‍රමාණවත් පියවර ගත්තේ නම්, "සහරාන් වැනි පුද්ගලයන්[187] බිහි නොවනු ඇති" බව හෙතෙම නිරීක්ෂණය කළේය.[188]

මෙම ගැටලුව සම්බන්ධයෙන් අදහස් දක්වමින්, **ආගමික විවේචනය වැදගත් වුවද, එහිදී චේතනාව සහ සන්දර්භය තක්සේරු කිරීම මගින් සමතුලිතතාවයක් පවත්වා ගත යුතු බව සම්මුඛ සාකච්ඡා වලදී අවධාරණය වූ අතර, විශේෂයෙන්ම ආගමකට එල්ල කරන ප්‍රහාරයක් සහ ආගම හරහා ප්‍රජාවකට එල්ල කරන ප්‍රහාරයක් අතර වෙනස හඳුනා ගැනීම මෙහිදී අත්‍යවශ්‍ය වේ.**[189] මුස්ලිම් ප්‍රජාව ඉලක්ක කරගනිමින් සිදුකෙරෙන වෛරී කථනයන් සම්බන්ධයෙන් අදහස් දක්වමින් ආචාර්ය ගුණතිලක සඳහන් කළේ, "වෛරය පතුරුවන්නට අවශ්‍ය පුද්ගලයන්... ප්‍රජාව කෙරෙහි ඇති තම වෛරය ආගමික විශ්වාසයන් පදනම් කරගත් රාමුවක් තුළ සැකසීමට ඉතා දක්ෂ" බවයි. ප්‍රජාව දක්ෂ ලෙස ඉලක්ක කරගන්නා අතරතුර ප්‍රතිපත්තිමය තර්ක මග හැර යාම සඳහා "සංකේතාත්මක භාෂාවක්" භාවිතා කරන්නේ කුමන අවස්ථාවලදී ද යන්න හඳුනාගැනීමේ වැදගත්කම ඔහු වැඩිදුරටත් අවධාරණය කළේය.[190]

## 3.2. ආගම ප්‍රකට කිරීම සහ එහි ප්‍රචාරණය පිළිබඳ දේශපාලනය

රාජ්‍ය මට්ටමින් මෙන්ම ප්‍රජා මට්ටමින් ද නීත්‍යනුකූල අදහස් ප්‍රකාශ කිරීමේ සීමාවන්, ආගම ප්‍රචාරණය කිරීමේ හෝ අන්‍යාගමිකකරණය කිරීමේ ක්‍රියාවන්ට හෝ එවැනි ක්‍රියාවන් ලෙස සැලකෙන දේට එල්ල වන ප්‍රතිරෝධය තුළින් ද නිරීක්ෂණය කළ හැකිය [බලන්න: 2.3]. ශ්‍රී ලංකාව තුළ "වන්දනා කිරීම, පිළිපැදීම, ප්‍රගුණ කිරීම සහ ඉගැන්වීම මගින් තම ආගම හෝ ඇදහීම" ප්‍රකට කිරීමට ඇති අයිතිය ආරක්ෂා කර ඇත. කෙසේ වෙතත්, චින්තනයේ නිදහස මෙන් නොව, මෙම අයිතිය නිරපේක්ෂ අයිතියක් නොවන අතර, බලහත්කාරකම් පවතින අවස්ථාවලදී හෝ "ජාතික ආරක්ෂාව, මහජන සාමය හෝ මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම" වෙනුවෙන් සීමා කළ හැකිය [බලන්න: 1.2.]. ආචාර්ය ගුණතිලක පැහැදිලි කරන්නේ, පුද්ගලයෙකු වෙනත් ආගමකට හැරවීමට එත්තු ගැන්වීමේ ක්‍රියාව ඇතැම් ආගම්වල 'ඉගැන්වීම' හෝ 'පිළිපැදීම' යන දේවධර්මීය මූලධර්මවලට අයත් විය හැකි බව වන අතර එය පුද්ගලයෙකුට තම ආගම 'ප්‍රකට කිරීමට ඇති අයිතියේ ' කොටසක් ලෙස සැලකේ.[191]

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය රාමුව මගින් තමන්ගේ ආගම ප්‍රකට කිරීමේ අයිතිය තහවුරු කර තිබුණද, **එමගින් ආගමක් ප්‍රචාරණය කිරීම සඳහා මූලික අයිතිවාසිකමක් අදහස් නොවන බවත්, එය සියලු ම ආගම්වලට සමානව හිමිවන අයිතියක් නොවන බවත් අධිකරණ අර්ථ නිරූපණයන්ගෙන් ගම්‍ය වේ.[192] කෙසේ වෙතත්, 2025 මැයි මස ලබා දුන් තීන්දුවකින් යළිත් තහවුරු කරන ලද පරිදි, ආගම ප්‍රචාරණය කිරීමේ ක්‍රියාව පමණක් ගත්කල එය අපරාධමය වරදක් නොවේ.[193]**

**ආගම ප්‍රචාරණය කිරීම අපරාධමය වරදක් ලෙස නම් කර නොමැති වුවද, ආගම ප්‍රචාරණය කිරීමේ අයිතිය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පවතින අපැහැදිලිතාවත්, ආගමික පිරිස් අඩුවීම සහ සමාජ-සංස්කෘතික ආධිපත්‍යයට එල්ල වන තර්ජන පිළිබඳව ඇති වී තිබෙන බියත් හේතුවෙන් මෙයට එරෙහිව පවතින ප්‍රතිරෝධය දිරිමත් වී ඇත.[194]** 2024 වසරේදී ජාතික සාම මණ්ඩලය (NPC) විසින් පවත්වන ලද සමීක්ෂණයකට අනුව, බෞද්ධ, හින්දු සහ රෝමානු කතෝලික ප්‍රජාවන් නියෝජනය කළ ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 50% කට වඩා වැඩි පිරිසක් පෙන්වා දී ඇත්තේ තම ආගමට අහිතකර ලෙස බලපාන අයුරින් අන්‍යාගමිකකරණය සිදුවන බවයි.[195] ප්‍රධාන වශයෙන් අන්‍යාගමිකකරණය සඳහා වගකිව යුත්තේ "සමහර ක්‍රිස්තියානි කණ්ඩායම්" සහ - ඊට අඩු මට්ටමකින් - මුස්ලිම්වරුන් බව ඔවුහු පෙන්වා දුන්හ.

මෙම ස්ථාවරය, ක්‍රිස්තියානි භක්තිකයන්ට එරෙහිව සිදුවන බියගැන්වීම් සහ ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් NCEASL ආයතනය සතු ලේඛනගත වාර්තා මගින් තවදුරටත් හෙළි වේ. 2025 වසරේදී, පල්ලිවලට සහ ක්‍රිස්තියානි මධ්‍යස්ථානවලට එරෙහිව එල්ල වූ විරෝධතා සම්බන්ධ බොහෝ සිදුවීම්වලට, ආගමට හරවා ගත් පිරිස් සහ ආගමට හරවා ගැනීම් පිළිබඳ ගැටලු පැහැදිලිවම හේතු වී තිබුණි. තවද, ක්‍රිස්තියානි ආගමික කටයුතුවලට විරුද්ධ වීම, වන්දනා ස්ථාන පිහිටුවීම, පොදු සාමය කඩවන බවට වන පැමිණිලි සහ වන්දනා ස්ථාන 'ලියාපදිංචි ' කරන ලෙස සිදුකරන ඉල්ලීම් පිටුපස ඇති ප්‍රධාන හේතුවක් ලෙස, ආගමට හරවා ගැනීම් පිළිබඳව පවතින භීතිකාව පවතින බව මෑතකාලීන අධ්‍යයනයන් මගින් අවධාරණය කෙරේ [බලන්න: 2.4].[196]

2025 ජනවාරි මාසයේදී, කොළඹ, සීතාවක ප්‍රදේශයේ පිහිටි පල්ලියකට පැමිණි බෞද්ධ භික්ෂූන් වහන්සේලා, පල්ලියේ සියලුම කටයුතු නතර කරන ලෙස ඉල්ලා සිටි අතර එහි දේවගැතිවරයාට අන්‍යාගමිකකරණය කිරීමේ චෝදනා එල්ල කළහ. පොලිසියේ ඉල්ලීම පරිදි දෙපාර්ශ්වයම සාමකාමී එකඟතාවයකට පැමිණියද, පසුව එක් භික්ෂූන් වහන්සේ නමක් දේවගැතිවරයාට පවසා ඇත්තේ ඔවුන් ඔහුට එරෙහිව නීතිමය පියවර ගන්නා බවයි.[197]

පෙබරවාරි මාසයේදී සිදු වූ එවැනිම සිදුවීමකදී, මට්ටක්කුලිය ප්‍රදේශයේ ශාඛාවක් පවත්වාගෙන යන ජාත්‍යන්තර

ක්‍රිස්තියානි සංවිධානයක් විසින් මෙහෙයවනු ලබන යාඥා මෙහෙයන් නතර කරන ලෙස බෞද්ධ භික්ෂූන් වහන්සේලා ඉල්ලා සිටි අතර, එහි කාර්ය මණ්ඩලයට අන්‍යාගමිකකරණ චෝදනා එල්ල කළහ. කෙසේ වෙතත්, පොලිස් පරීක්ෂණයේදී භික්ෂූන් වහන්සේලා සිය පැමිණිල්ල පොදු සාමය කඩකිරීමක් දක්වා වෙනස් කළ අතර, එහිදී පොලිසිය ප්‍රකාශ කළේ යාඥා මෙහෙයන් නැවැත්වීමට තමන්ට නොහැකි වුවද, ලැබී ඇති පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශනය කරන බවයි.[198] 'මහජන සාමය' යන පදනම මත "ආගම ප්‍රකට කිරීම" සීමා කළ හැකි බැවින්, ඒ පිළිබඳව විමර්ශනය කිරීමට පොලිසියට අයිතියක් ඇති බව මෙහිදී විශේෂයෙන් සඳහන් කල යුතු කරුණකි.

**මෙම සිදුවීම් දෙකේදීම පොලිසිය ඉතා බුද්ධිමත් ලෙස ප්‍රතිචාර දක්වා ඇති බව පෙනී යාම අගය කළ යුත්තකි. සාකච්ඡාවකදී අදහස් දක්වමින්, කොළඹ ප්‍රදේශයේ සේවය කරන එවැන්ජලික දේවගැතිවරයෙකු ද පොලිසිය ඇතුළු ප්‍රාදේශීය බලධාරීන් සමග වඩා හොඳ සබඳතාවක් පවත්වා ගැනීමේ වැදගත්කම යෝජනා කළේය.** ඔහු ප්‍රකාශ කළේ තම පල්ලිය එම ප්‍රදේශයේ දිගුකාලීනව පැවතීම හේතුවෙන් ක්‍රමයෙන් පිළිගැනීමට ලක්ව ඇති බවත්, දැන් ප්‍රාදේශීය බලධාරීන් විසින් ආගමික නායකයන් වෙනුවෙන් කැඳවනු ලබන රැස්වීම් සඳහා නිරන්තරයෙන්ම තම පල්ලියටද ආරාධනා ලැබෙන බවත්ය.[199]

2025 වසර තුළ කොළඹින් වාර්තා වූ සිදුවීම් මගින් තවදුරටත් පෙන්නුම් කරන්නේ, බොහෝ විට ආගමට හරවා ගැනීම් පිළිබඳ බිය නිසා ඇතිවන, ප්‍රජා මූලිකව ඉදිරිපත් කෙරෙන, 'ලියාපදිංචි කිරීම් පිළිබඳ ඉල්ලීම් සම්බන්ධයෙන් පොලිසියේ ප්‍රතිචාරවල යහපත් වර්ධනයක් පවතින බවයි. සමහර ප්‍රාදේශීය බලධාරීන් සහ පොලිසිය තවමත් පල්ලි ලියාපදිංචි කිරීම අනිවාර්ය බව පවසා සිටියද, 'ලියාපදිංචිය' සම්බන්ධ නෛතික තත්ත්වය පිළිබඳව පොලිසිය තුළ වර්ධනය වෙමින් පවතින දැනුවත්භාවය සහ නීතියට අනුකූලව කටයුතු කිරීමට ඔවුන්ගේ ඇති වැඩි කැමැත්ත මෑතකාලීන සිදුවීම් මගින් පෙන්නුම් කරයි. කොළඹ, මොරටුව ප්‍රදේශයේ පල්ලියකට එරෙහිව ප්‍රදේශවාසීන්ගෙන් එල්ල වූ විරෝධය සහ ලියාපදිංචි වන ලෙස එල්ල වූ බලපෑම හමුවේ පොලිසිය අවධාරණය කළේ, ලියාපදිංචි වීමේ තීරණය අනිවාර්ය නොවන බවත්, පල්ලියක කටයුතු හෝ සාමකාමී රැස්වීමක් නැවැත්වීමට පොලිසියට බලයක් නොමැති බවත්ය.[200]

කෙසේ වෙතත්, උතුරු පළාතෙන් ලැබෙන වාර්තා එතරම් දිරිගන්වන සුළු නැත. කිතුනු සහ මුස්ලිම් ප්‍රජාවන්ට එරෙහිව සිව සේනා වැනි හින්දු මූලධර්මවාදී කණ්ඩායම්වලින් එල්ල වන සක්‍රීය විරෝධය, ප්‍රාදේශීය බලධාරීන් කෙරෙහි තවදුරටත් බලපෑම් ඇති කරයි. 2025 ජූලි මාසයේදී යාපනය පුරා ප්‍රදර්ශනය කෙරුණු 'ඒබ්‍රහමික ආධිපත්‍යය අවසන් කරමු සහ ශිවභූමිය (ශිව දෙවියන්ගේ දේශය) නැඟී සිටිනු'[201] යනුවෙන් සඳහන් වූ පෝස්ටර් මගින් එම කලාපයේ සුළුතර ආගම් කෙරෙහි පවතින විරෝධය සහ දැනටමත් ප්‍රචලිතව පවතින ජාතික-ආගමික නොසන්සුන්තාව මැනවින් පිළිබිඹු විය. උතුරේ සහ දකුණේ පවතින නොසන්සුන්තා හමුවේ පොලිසිය දක්වන මෙම අසංගත ප්‍රතිචාරය, රජයේ ප්‍රතිපත්ති සහ ප්‍රවේශයන් ප්‍රාදේශීය බලධාරීන් වෙත කාර්යක්ෂමව සන්නිවේදනය කිරීමට අපොහොසත් වීම පිළිබඳ පුළුල් සංඥාවක් ලෙස සැලකිය හැකිය.[202]

2025 අප්‍රේල් මාසයේදී යාපනය ශාන්තිපුරම් ප්‍රදේශයේ කලයිමගල් ක්‍රීඩාංගණයේ පැවති කිතුනු රැස්වීමකට, "බලහත්කාරයෙන් ආගමට හරවා ගැනීම්" සිදු කරන බවට චෝදනා කරමින් පොලිසිය විසින් බාධා පමුණුවන ලදී. සිව සේනා සංවිධානය විසින් කරන ලද පැමිණිල්ලකට අනුව බලධාරීන් මෙලෙස කටයුතු කළ අතර, තරුණ හින්දු සිසුන් භාවිතා කරන ක්‍රීඩාංගණයක මෙම රැස්වීම පැවැත්වීම මගින් ආගමික ගැටුම් ඇවිලවිය හැකි බවටද ඔවුහු තර්ක කළහ. පසුව සිදු කරන ලද ප්‍රශ්න කිරීම්වලදී, ආගමට හැරීම සඳහා මූල්‍යමය දිරිගැන්වීම් ලබා දෙන බවට එල්ල වූ චෝදනා දේවගැතිවරයා විසින් ප්‍රතික්ෂේප කරන ලදී.[203]

අතීතයේදී, 'අශීලාචාර ලෙස ආගමට හැරවීම්' අපරාධමය

වරදක් බවට පත් කිරීම සඳහා නීති ගෙන ඒමට උත්සාහයන් තිබුණද[204] ඒවා සාර්ථක නොවූ අතර, යම් ආගමකට හැරවීමක් 'අශීලාචාර ' ලෙස අර්ථකථනය කළ හැකි වුවද එය වැළැක්වීමට **දැනට කිසිදු නෛතික ප්‍රතිපාදනයක් නොමැත.** ශ්‍රී ලංකාව තුළ 'අශීලාචාර ලෙස ආගමට හැරවීම් ' පිළිබඳ සාකච්ඡා මූලමය දිරිගැන්වීම් කෙරෙහි කේන්ද්‍රගත වී තිබුණද, **එම යෙදුමේ හි පවතින විෂයබද්ධ ස්වභාවය නිසා එය විවිධ අර්ථකථනයන්ට විවෘත වී ඇති අතර මෙලෙස ආගමට හැරවීම් සම්බන්ධයෙන් පනවනු ලබන නෛතික සීමාවන් තුළ පවතින නෛසර්ගික අනතුර මෙයින් මැනවින් පැහැදිලි වේ.**

2021 වසරේදී ද මෝනිං පුවත්පත සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී, එවකට බුද්ධශාසන අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කපිල ගුණවර්ධන මහතා, මූල්‍ය ආධාර ලබා දීමෙන් හෝ අධ්‍යාපනය වැනි සේවාවන් සඳහා ප්‍රවේශය ලබා දීම මගින් සිදු කරනු ලබන ආගමට හැරවීම් පිළිබඳව සඳහන් කරමින්, 'අශීලාචාර ලෙස ආගමට හැරවීම් ' මැඩපැවැත්වීම සඳහා නෛතික රාමුවක අවශ්‍යතාව අවධාරණය කළේය.[205] කෙසේ වෙතත්, කොළඹ අගරදගුරු මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණන් වැනි අනෙකුත් පාර්ශ්වයන් පෙන්වා දෙන්නේ, ඇතැම් ක්‍රිස්තියානි දේවගැතිවරුන් විසින් "මිනිසුන් මුහුණ දෙන විවිධ ගැටලු" අවස්ථාවක් කරගනිමින්, අධිස්වාභාවික අත්දැකීම් හරහා ඔවුන්ව ආගමට හැරවීමට උත්සාහ කිරීම 'අශීලාචාර ' බවයි.[206]

**කිතුනුවන් ඇතුළු ආගමික කණ්ඩායම් අතර පවතින සමාජ සේවා වගකීම විසින්, මූල්‍ය දිරිගැන්වීම් සහ ආගමට හැරවීම් පිළිබඳ ගැටලුවට තවත් සංකීර්ණ ස්ථරයක් එක් කරනු ලබයි.** එවැන්ජලික දේවගැතිවරුන් දෙදෙනෙකු සමග පැවැත්වූ ඉලක්කගත කණ්ඩායම් සාකච්ඡාවකදී (FGD) හෙළි වූයේ, 'අශීලාචාර ලෙස ආගමට හැරවීම් ' පිළිබඳ චෝදනා අත්තනෝමතික ලෙස යොදාගත හැකි ආකාරය සහ ඕනෑම ආකාරයක ක්‍රියාකාරකමක් සීමා කිරීම සඳහා ඒවා භාවිතා කළ හැකි ආකාරයයි.[207] කොළඹ ප්‍රදේශයේ දේවගැතිවරයෙකු බෙදාගත් අදහස්වලට අනුව, පල්ලියේ සාමාජිකයන් නොවන පුද්ගලයින් පවා නිතිපතා ඔවුන්ගෙන් සහය පතා පැමිණෙන අතර, ඔවුන් සිදුකරන සමාජ සේවා කටයුතු හේතුවෙන් ප්‍රජාව තුළ පිළිගැනීමට ලක්වීමට එය බොහෝ විට උපකාරී වේ. මෙහිදී පුණ්‍ය කටයුතු ආගමට හැරවීමේ මාධ්‍යයක් ලෙස භාවිත නොකළද, බොහෝ විට එය එලෙස ම අර්ථකථනය කෙරිණි.

**ඇතැම් කණ්ඩායම් විසින් ආගමට හැරවීම සඳහා මූල්‍යමය දිරිගැන්වීම් භාවිතා කරන බවට - නිවැරදිව හෝ වැරදි ලෙස - චෝදනා එල්ල විය හැකි වුවද, පුද්ගලයෙකු ආගමට හැරීම සඳහා අභිප්‍රේරණය කරන හේතුව එම පුද්ගලයාගේ පෞද්ගලික රුචිකත්වයට අදාළ කරුණක් ලෙස පැවතිය යුතුය.** පුද්ගලයෙකුගේ ඇදහිල්ල කෙරෙහි එල්ල වන සාමූහික අයිතිවාසිකම් ප්‍රකාශ කිරීම් විවේචනය කරන ආචාර්ය ගුණතිලක, දේශපාලන වාසි ලබා ගැනීම හෝ විවාහය වැනි කරුණු මත පදනම් වූ 'ආධ්‍යාත්මික නොවන ආගමට හැරවීම්වල 'සමස්ත පරිසර පද්ධතියක් ' ම පවතින බව පෙන්වා දෙන අතර, සමාජය විසින් ඇතැම් අභිප්‍රේරණයන් වරණීය ලෙස තෝරා බේරාගෙන දැඩි විමර්ශනයට ලක් කරන අතරතුර තවත් සමහරක් නොසලකා හරින ආකාරය මෙයින් හෙළි කරයි.

## 3.3 මාර්ගගත FoE සහ FoRB

**මෙම සිදුවීම් බොහොමයක පැහැදිලිව පෙනෙන කරුණක් වන්නේ, FoRB සහ FoE යන කලාපයන් තුළ පැන නගින ආතතීන් තීව්‍ර කිරීම උදෙසා සමාජ මාධ්‍ය සහ අන්තර්ජාලය ඉටු කර ඇති භූමිකාවයි.**

**උදාහරණයක් ලෙස,** Hashtag Generation සහ NCEASL **විසින් එක්රැස් කර විශ්ලේෂණය කරන ලද දත්ත මගින් හෙළිවන්නේ, ආගම ප්‍රචාරණය කිරීම සම්බන්ධයෙන් භීතිය වැපිරීම සහ වැරදි තොරතුරු ප්‍රචාරණය කිරීම සඳහා විවිධ මාර්ගගත ආඛ්‍යානයන් සංඛ්‍යාවක් ගොඩනගා ඇති බවයි.** මීට 2025 ජූලි මාසයේදී සමාජ මාධ්‍ය ඔස්සේ පළ වූ, ලාභ ප්‍රයෝජන තකා ආගමට

හරවාගන්නා බවට කිතුනුවන් වෙත එල්ල කළ චෝදනා මෙන්ම, බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යවරයා කතෝලික පල්ලියේ සහාය ඇතිව බුද්ධශාසන අමාත්‍යාංශය අහෝසි කිරීමට සහ බුද්ධාගම විනාශ කිරීමට උත්සාහ කරන බවට කළ අභූත චෝදනා ද ඇතුළත් වේ.[208]

**එසේම, වෛරය ව්‍යාප්ත කිරීම සඳහා සමාජ මාධ්‍ය දිගින් දිගටම ඉටුකරන භූමිකාව ද මෙහිදී පැහැදිලිව පෙනෙන්නට තිබේ.**[209] මාර්ගගත අවකාශය තුළ වෛරය පැතිරීමේ බලපෑම ගැන සාකච්ඡා කරමින් එදිරිසූරිය ප්‍රකාශ කළේ, එම සිදුවීමෙන් පසු තමන් එල්ල වන ප්‍රහාර හමුවේ තමාගේ සිතේ සාමය නැති වී තමා තුළ කටුකත්වයක් ගොඩනැගීමට ඉඩ නොතබනු වස්, සමාජ මාධ්‍ය භාවිතයෙන් තාවකාලිකව ඉවත් වූ බවයි.[210] මේ වසර පුරා දක්නට ලැබෙන අන්තර්ජාල ප්‍රවණතාවලින් පෙනී යන්නේ මුස්ලිම් ප්‍රජාව දිගින් දිගටම ඉලක්ක කිරීමක් සිදුවන බව වන අතර, ඇතැම් පෝස්ටු මගින් සියලුම මුස්ලිම්වරුන් "මරා දැමිය යුතු" බවට ප්‍රකාශ කරමින් ප්‍රචණ්ඩත්වය උසි ගැන්වීමට උත්සාහ කර ඇති බවද පෙනී යයි.[211]

**තවද, පාස්ටර් ප්‍රනාන්දු සහ එදිරිසූරියගේ සිදුවීම් මගින් ඩිජිටල් යුගය තුළ කථනයේ පවතින චංචල ස්වභාවය මනාව පැහැදිලි කරයි.** පාස්ටර් ප්‍රනාන්දුගේ ප්‍රකාශයන් සම්බන්ධයෙන් එල්ල වූ ප්‍රසිද්ධ විවේචන පිළිබඳව සාකච්ඡා කරමින්, FGD හි එවැන්ජලික දේවගැතිවරුන් පෙන්වා දුන්නේ, ඔහුගේ අදහස් ඔහු ඉදිරියේ සිටි සෘජු ශ්‍රාවක පිරිස ඉක්මවා අන්තර්ජාලයට පිවිසීමත් සමග ගැටලු පැන නැගුණු ආකාරයයි. ඩිජිටල් යුගය තුළ, දේවගැතිවරුන් වඩාත් ප්‍රවේශමෙන් කටයුතු කළ යුතු බවත්, පුළුල් ප්‍රජාවගෙන් එල්ල විය හැකි දැඩි විරෝධතා පිළිබඳව කල්තියා අවබෝධ කරගත යුතු බවත් ඔවුහු අවධාරණය කළහ.[212]

**මාර්ගගතව අන්තර්ගතයන් ප්‍රචාරණය කිරීම, කිතුනු දේවගැතිවරුන් අතර පවා අහිතකර තරඟකාරිත්වයක් සහ ගැටුම් ඇති වීමට හේතු වී ඇති ආකාරය FGD හි දී වැඩිදුරටත් අනාවරණය විය.** එක් දේවගැතිවරයෙකු පවසා සිටියේ තමාට සහ තම සභාවේ සාමාජිකයන්ට, ලිංගික අතවර චෝදනා සහ අපරාධ කල්ලි සමග සම්බන්ධතා පවත්වන බවට වූ පදනම් විරහිත චෝදනාවලට මුහුණ දීමට සිදු වූ බවයි. කිතුනු ප්‍රජාවගේ ඇතැම් කොටස් විසින් සමාජ මාධ්‍ය වගකීම් විරහිත ලෙස භාවිත කිරීම පෙන්වා දුන් ඔහු, හානිකර කථනයන් සීමා කිරීම සඳහා නීති අවශ්‍ය බව තර්ක කළ අතර, එවැනි පියවරක් මගින් FoE ආරක්ෂා කරන අතරම, ගෞරවනීය ආගමික සංවාදයක් පවත්වා ගැනීමට ද එය උපකාරී වන බව ඔහු වැඩිදුරටත් පැවසීය.[213]

**කෙසේ වෙතත්, ප්‍රචණ්ඩත්වය උසි ගැන්වීමේ දේහලිය ඉක්මවා නොයන මාර්ගගත අන්තර්ගතයන් ඇතුළු අදහස් ප්‍රකාශ කිරීම් සම්බන්ධයෙන් පනවන නීතිමය සීමාවන්, වරණීය ලෙස මෙහෙයවීමට හෝ ක්‍රියාත්මක කිරීමට හැකියාවක් පවතී.** දැනට සංශෝධනය වෙමින් පවතින මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාව පිළිබඳ පනත (OSA) මගින්,[214] දණ්ඩ නීති සංග්‍රහයේ 291 අ සහ 291 ආ වගන්තිවලට වඩා දැඩි සීමාවන් පැනවෙන බව එත්තු ගොස් ඇත. "ආගමික හැඟීම්වලට නිගරු කිරීමේ ඒකාන්ත සහ ද්වේෂසහගත අදහස ඇතිව" කරනු ලබන ප්‍රකාශ අපරාධමය වරදක් ලෙස දක්වමින් OSA හි 16 වැනි වගන්තිය මගින්, දණ්ඩ නීති සංග්‍රහයේ 291 ආ වගන්තිය පිළිඹිබු වේ. කෙසේ වෙතත්, OSA යටතේ අදාළ ප්‍රකාශය 'අසත්‍ය' එකක් විය යුතු බවට වන අතිරේක අවශ්‍යතාවක් ද ඇතුළත් කර ඇත. OSA සම්බන්ධයෙන් පවතින ප්‍රධානතම ගැටලුවක් වන්නේ, 'අසත්‍ය' ප්‍රකාශ පිළිබඳ අර්ථ නිරූපණය ඇතුළුව එහි ඇති නිර්වචන අපැහැදිලි සහ අතිශය පුළුල් ඒවා වීමයි [බලන්න: 1.2]. ආචාර්ය ගුණතිලක පෙන්වා දෙන පරිදි, මෙවැනි නිර්වචනයක් - ආනුභවික පරීක්ෂාවට හෝ තර්කයට හසු නොවනද දේවධර්මීය කරුණු සඳහා ආදේශ කිරීම දෙගුණයකින් ගැටලු සහගත වන අතර, එමගින් නීතිය කෙතරම් පහසුවෙන් අත්තනෝමතික අර්ථකථනයන්ට ලක්විය හැකිද යන්න තවදුරටත් අනාවරණය වෙයි.[215]

## 3.4 'බියසුළු වීමේ ආවරණය' සහ සිවිල්-සමාජ ප්‍රතිචාරය

**යුක්ති සහගත අදහස් ප්‍රකාශ කිරීම් සඳහා පනවන සීමාවන් පුද්ගලයාට බලපාන අතරම, එහි ප්‍රතිවිපාක වඩාත් දුරදිග යන බලපෑම් ඇති කිරීමට සමත් වෙයි.**

පාස්ටර් ප්‍රනාන්දු සම්බන්ධයෙන් ඇප පනතේ 14 වැනි වගන්තිය බලපාන ආකාරය පිළිබඳව සාකච්ඡා කරමින්, නීතිඥ නුර්ඩීන් පෙන්වා දුන්නේ ඔහු ඇප මත සිටින කාලය තුළ පවත්වනු ලබන ඉදිරි දේශනයක් මගින් "ආගමික හැඟීම් තුවාල කරන" බවට පෙනුණහොත්, එය ඔහුගේ ඇප නියෝගය අවලංගු කිරීමට හේතු විය හැකි බවයි. මෙම සන්දර්භය තුළ ඇප පනත ක්‍රියාත්මක කිරීම මගින් පුද්ගලයෙකුගේ ක්‍රියාකාරීත්වය සත්‍ය ලෙසම "අඩපණ කිරීමට" හැකි බව ඔහු කියා සිටියේය.[216]

එදිරිසූරිය සම්බන්ධයෙන් ගත් කල, මෙම සිදුවීම ඇයව "යටපත් කර දැමීමට" හේතු විය. තමා තුළ කථන ආබාධයක් වර්ධනය වූ බවත්, "හාස්‍යය සඳහා තම තුළ තිබූ සහජ අනුකූලතාව" තමාට අහිමි වූ බවත් ඇය විස්තර කළාය. ප්‍රසිද්ධියේ පෙනී සිටීම පිළිබඳ ඇයට අලුතින් ඇති වූ බියක් ගැන ඇය පැවසූ අතර, ඇයගේ ඉදිරිපත් කිරීම් සහ ඒවායින් තම පවුලට ඇති විය හැකි බලපෑම පිළිබඳව ඇයට ඕනෑවටත් වඩා පරීක්ෂාකාරී වීමට සිදු වූ බවද ප්‍රකාශ කළාය. ඇය තවදුරටත් සඳහන් කළේ, මීට පෙර තමන්ව දිරිමත් කළ මිතුරන් නිහඬ ප්‍රතිපත්තියක් අනුගමනය කළ බවත්, සමකාලීන කලාකරුවන් ද තම නිර්මාණ සම්බන්ධයෙන් "වඩාත් සවිඥානික" වූ බවත්ය.[217]

**ඇදහීම මූලික කොටගත් කණ්ඩායම් ඇතුළු සිවිල් සමාජයට, නීත්‍යනුකූල අදහස් ප්‍රකාශ කිරීම් සඳහා පනවන සීමාවන්ට එරෙහිව ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම මගින් රාජ්‍යයට නිවැරදි සංඥා නිකුත් කිරීමේ තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ හැකිය.**[218] නිහඬතාවය, ප්‍රමාද වූ හෝ ඇල්මැරුණු ප්‍රතිචාර බොහෝ විට සලකනු ලබන්නේ නිහඬ එකඟතාවයක් ලෙසිනි.[219]

ක්‍රියාකාරීන් විසින් නිරීක්ෂණය කළ පරිදි, එදිරිසූරිය සහ පාස්ටර් ප්‍රනාන්දු යන දෙදෙනාගේම සිදුවීම්වලදී පුළුල් සිවිල් සමාජයේ මැදිහත්වීම කැපී පෙනෙන ලෙස අවම මට්ටමක පැවතිණි. [220]එදිරිසූරිය විසින්, "වැටුප් නොලැබුවත් උනන්දුවෙන් කටයුතු කළ" තනි පුද්ගල ක්‍රියාකාරීන්ගේ සහයෝගය අගය කෙරුණු අතර, HRCSL හි මැදිහත්වීමද ඇය සාදරයෙන් පිළිගත්තාය. කෙසේ වෙතත්, සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය සහ සයිබර් හිරිහැර කිරීම් සම්බන්ධ ක්ෂේත්‍රවල ක්‍රියා කරන සංවිධානවලට, මැදිහත්වන ලෙස ඉල්ලීම් ඉදිරිපත් වුව ද, ඔවුන් ඒ සඳහා "ඉදිරිපත් නොවීම" පිළිබඳව ඇය විවේචනාත්මක වූවාය. ඇයව "බුද්ධාගමට නිගරු කළ" විහිළුකාරියක ලෙස දුටු බහුතර මතයට අභියෝග කිරීමට බොහෝ දෙනා බියක් හෝ මැළිකමක් දැක්වූ බව ඇයට හැඟී ගියේය.[221]

එලෙසම, පාස්ටර් ජෙරම්ගේ හැසිරීම සහ දේශනා විවේචනයට හෝ දෝෂදර්ශනයට ලක් කිරීම සාධාරණ විය හැකි වුවද, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් බැඳීම්වලට අනුව එය අපරාධමය වරදක් ලෙස සැලකීමට තරම් ප්‍රමාණවත් නොවේ. ස්ථාපිත ආගම්වලට හිමිවන එම ආරක්ෂාවන්ම පාස්ටර් ප්‍රනාන්දුගේ පූජකත්වයට ද හිමිවිය යුතුය. ඔහුගේ මෙම සිද්ධිය, FoRB යනු සාම්ප්‍රදායික ආගම්වලට හෝ 'සමාන ආයතනික ලක්ෂණ' සහිත ආගම්වලට පමණක් වෙන් වූවක් නොව, එය සියලු ආකාරයේ ඇදහීම් දක්වා විහිදී යන්නක් බව මතක් කර දීමකි.[222]

## 3.5 'අප්‍රසන්න නමුත් නීත්‍යනුකූල' කථනයට මුහුණ දීම

සිවිල් සමාජයේ භූමිකාව පිළිබඳ වෙනස්ම දෘෂ්ටිකෝණයක් ඉදිරිපත් කරමින්, ක්‍රියාකාරී සුචිත් අබේවික්‍රම මහතා අදහස් දැක්වූයේ සිවිල් සමාජය බොහෝ විට "සුළුතරවාදී" ප්‍රවේශයක් අනුගමනය කරන බවත්, එමගින් අන්තවාදී හඬවල් සඳහා ඉඩකඩක් නිර්මාණය වීමේ අවදානමක් පවතින බවත්ය. ඔහු

අවධාරණය කළේ මෙවැනි සන්දර්භයන් තුළ මධ්‍යස්ථ ආඛ්‍යානයන් ශක්තිමත් කිරීමේ වැදගත්කමයි.[223]

**එය කෙතරම් අපහාසාත්මක හෝ සිත් රිදවන සුළු වුවද, නීත්‍යනුකූල අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ආරක්ෂා කිරීමෙහි ලා සිවිල් සමාජයට තීරණාත්මක කාර්යභාරයක් පැවරී ඇත. කෙසේ වෙතත්, ඉවසීම පිළිබඳ ගැටලු මතු කරන අදහස් ප්‍රකාශ කිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ද සිවිල් සමාජයට එලෙසම වැදගත් භූමිකාවක් පැවරී ඇත.** අපරාධමය වරදක් ලෙස සැලකීමේ දේහලියට වඩා අඩු මට්ටමක පවතින, එහෙත් වර්ගවාදී නොසන්සුන්තාවන් ඇති කරන හෝ ගැටුම් ඇතිවීමේ හැකියාවක් පවතින කථනයන් [බලන්න: 1.2], 'අප්‍රසන්න වුවත් නීත්‍යනුකූල ' ප්‍රකාශ සඳහා එලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ තීරණාත්මක අවශ්‍යතාවය අවධාරණය කරයි.

**කෙසේ වෙතත්, සෑම “අප්‍රසන්න” අන්තර්ගතයකටම සෘජු ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය නොවේ; ඇතැම් අවස්ථාවලදී එවැනි ප්‍රකාශයන්ට සන්සුන්, සිහිකල්පනාවෙන් යුත් නොසැලෙන ප්‍රතිචාරයක් දැක්වීම බෞද්ධ ඉගැන්වීම් මගින් යෝජනා කරයි.** අක්කෝස සූත්‍රයේදී, බුදුන් වහන්සේ පැහැදිලි කරන්නේ කෙනෙකු කරන අපහාසයක් 'පිළිගැනීම ' ප්‍රතික්ෂේප කිරීමෙන් - එනම් එය නැවත ලබා දෙන්නා වෙතම 'පැවරීමෙන් ' - පවතින නොසන්සුන්තාවය සමනය වන ආකාරයයි [“කෝපයට පත් වූවකු දෙස බලා ඔබ කෝපයට පත් නොවන විට, ජය ගැනීමට අපහසු සටනකින් ඔබ ජයග්‍රහණය කරයි”].[224]

**කෙසේ වෙතත්, ප්‍රතිචාරයක් දැක්විය යුතු මට්ටමේ හානිකර ප්‍රකාශ සම්බන්ධයෙන්, මානව හිමිකම් ප්‍රජාව විසින් බහුවිධ ප්‍රවේශයක් අනුගමනය කිරීමට නිර්දේශ කරනු ලබයි.** උදාහරණයක් ලෙස, එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා පෙන්වා දෙන්නේ එය “සෑම ද්වේශ සහගත ක්‍රියාවක් මෙන්...එය හෙළා දැකීම, එය ප්‍රචලිත කිරීම ප්‍රතික්ෂේප කිරීම, සත්‍යය මගින් ඊට ප්‍රතිප්‍රහාර එල්ල කිරීම සහ එම ක්‍රියාවන් සිදුකරන්නන්ගේ හැසිරීම වෙනස් කිරීමට ඔවුන්ව දිරිමත් කිරීම” සිදු කළ යුතු බවයි.[225] ඩිජිටල් අවකාශය තුළ මෙම ගැටලුවට විසඳුම් සෙවීම පිළිබඳව අදහස් දක්වමින්, ක්‍රියාකාරික සමරකෝන් මහතා ඩිජිටල් සාක්ෂරතාවය සහ සමාජ මාධ්‍ය වේදිකාවල ප්‍රතිපත්ති ගෝලීය දකුණේ සන්දර්භයට ගැළපෙන පරිදි සකස් කිරීමේ අවශ්‍යතාව ඇතුළු ක්‍රමවේද රැසක් පෙන්වා දුන්නේය.[226]

**ආගමික සන්දර්භයන් තුළ, ගැටුම් ඇතිවීමේ අවදානමක් සහිත හානිකර ප්‍රකාශ පාලනය කිරීම සඳහා වන මගපෙන්වීම් කෙරෙහි අවධානය යොමු කිරීම ද වැදගත් වේ.** නිදසුනක් වශයෙන්, ආගම ප්‍රචාරණය කිරීම හේතුවෙන් පැන නගින ආතතීන්ට ප්‍රතිචාරයක් ලෙස, ක්‍රිස්තියානි ජාලයන් විසින් “පුණ්‍ය කටයුතු සහ දේශනා කිරීම් ඒකාබද්ධ කිරීමේදී, ඒවාට සවන් දෙනවාද නැද්ද යන්න තෝරා ගැනීමට ප්‍රදානලාභියා සතු නිදහසට බාධා වන අයුරින් කටයුතු කිරීමෙන් වැළකිය යුතු බවට” අනතුරු හඟවන මගපෙන්වීම් ප්‍රවර්ධනය කර ඇත.[227] මීට අමතරව, මෙම මාර්ගෝපදේශ මගින් ප්‍රදානලාභීන්ගේ පෙනෙන්නට තිබෙන අවදානමට ලක්විය හැකි ස්වභාවය,[228] පෞද්ගලිකත්වයට ඇති අයිතිය සහ දේශීය සමාජ සම්මතයන් කෙරෙහි සංවේදී වීමේ වැදගත්කම අවධාරණය කෙරේ.[229]

අප්‍රසන්න කථනය පිළිබඳව අදහස් දක්වමින්, එවැන්ජලික දේවගැතිවරුන් සමග පවත්වන ලද FGD ක දී, අනෙකුත් ආගම් පිළිබඳව කුපිත කරවනසුලු අදහස් පළ කරන දේවගැතිවරුන් සම්බන්ධයෙන් සැලකිල්ල යොමු විය. පාස්ටර් ප්‍රනාන්දුගේ සිද්ධිය සම්බන්ධයෙන් අදහස් දක්වමින්, එක් දේවගැතිවරයෙකු ප්‍රකාශ කළේ අනෙකුත් කණ්ඩායම් කෝපයට පත් කිරීමේ අවදානමක් සහිත සැසඳීම් සිදු කිරීම අනවශ්‍ය බවයි.[230] FoRB විසින් “විවිධ ආගම් සැසඳීම මගින් අර්ථයන් සෙවීමට.... සහ ප්‍රසිද්ධියේ විවේචන එල්ල කිරීමට” ඇති අයිතිය ආරක්ෂා කරන අතරම,[231] බහුත්වවාදී සමාජයක් තුළ එසේ කළ යුතු ආකාරය පිළිබඳ රාමුවක් ක්‍රිස්තියානි මූලධර්ම කේන්ද්‍ර කරගත් මාර්ගෝපදේශ මගින් සපයයි. මෙම මගපෙන්වීම් මගින් “තාර්කික, ඒත්තු ගැන්විය හැකි විවේචන සහ සහේතුක සැසඳීම්” සිදුකිරීම සඳහා ඉඩකඩ සලසන අතරම,

අනෙකුත් ආගම් වැරදි ලෙස නිරූපණය කිරීමෙන් හෝ ඒවාට අපහාස කිරීමෙන් වැළකී සිටීමේ සමතුලිතතාවයක් පවත්වා ගනී.[232]

**ආගමික ප්‍රකාශන හේතුවෙන් පැන නගින ආතතීන්ට විසඳුම් සෙවීම සඳහා මෙවැනි මගපෙන්වීම් ප්‍රවර්ධනය කිරීමට සහ අන්තර්-ආගමික සංසද වැනි වේදිකා භාවිත කිරීමට බොහෝ විට ආගමික නායකයින්ට බලගතු ස්ථානීය හැකියාවක් ඇත.** නමුත් මෙම සංසද බොහොමයක් හුදෙක් උත්සවශ්‍රීයෙන් පවත්වනු ලබන චාරිත්‍රානුකූල ඒවා ලෙසත්, අපහසු මාතෘකා මගහරින ඒවා ලෙසත් හඳුනාගෙන ඇති අතර, රාජ්‍යය මූලිකව සිදුකරන විවිධ මුලපිරීම් වල දී පවා, ස්ථාපිත ප්‍රධාන ආගම් සතු 'ආයතනික ලක්ෂණ ' නොමැති අනෙකුත් කණ්ඩායම් බොහෝ විට ඉන් බැහැර කරනු ලැබේ.[233] මෙම ගැටලුවලට විසඳුම් සෙවීම මගින්, බෙදීම් ඇති කරන සහ හානිකර වාග් මාලාවන්ට අභියෝග කිරීමට ආගමික නායකයන් දරන උත්සාහයන්ට සහයෝගයක් ලැබෙනු ඇත.[234]





# 4 වන පරිච්ඡේදය

## නිර්දේශ

ඉහත පරිච්ඡේද මගින් පැහැදිලි කර ඇති පරිදි, ශ්‍රී ලංකාව තුළ ආගමික ප්‍රකාශනයන් සම්බන්ධයෙන් පැන නැගී ඇති අභියෝගයන්, FoRB සහ FoE අතර පවතින සහජ ගැටුමක ප්‍රතිඵලයක් නොවන අතර, එම ගැටලු බොහෝ විට පැන නගින්නේ නීතිය, ප්‍රතිපත්තිය සහ භාවිතය තුළ මෙම අයිතිවාසිකම් අර්ථ නිරූපණය කරන, සීමා කරන සහ ක්‍රියාත්මක කරන ආකාරය හේතුවෙනි. ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මානව හිමිකම් සම්මතයන් සුරැකීමට, විශේෂයෙන් ICCPR ස්ථිර කිරීම හරහා විධිමත් ලෙස බැඳී සිටියද, ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ දේශීය ක්‍රියාත්මක කිරීම් අතර පවතින නිරන්තර පරතරය හේතුවෙන් සීමාකාරී වාතාවරණයක් නිර්මාණය වී ඇති අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස ආගමික සුළුතරයන්, විරුද්ධ මතධාරීන් සහ සම්මතයෙන් බැහැර වූ හෝ විවේචනාත්මක අදහස් ප්‍රකාශ කරන්නන් අසමානුපාතික ලෙස බලපෑමට ලක් වේ.
ශ්‍රී ලංකාව ආගමික ප්‍රකාශනයන් නියාමනය කිරීමේදී පවතින අපැහැදිලි, දණ්ඩනීය සහ බහුතරවාදී ප්‍රවේශයන්ගෙන් බැහැර වී, ඒ වෙනුවට පැහැදිලි, ප්‍රතිපත්තිගරුක සහ අයිතිවාසිකම් මත පදනම් වූ රාමුවක් අනුගමනය කිරීම වැදගත් වේ. බහු-වාර්ගික සහ ආගමික සන්දර්භයක් තුළ ආගමික සහජීවනය ළඟා කරගත හැක්කේ වාරණය හෝ බිය ඇති කිරීම හරහා නොව, FoRB සහ FoE යන දෙඅංශයටම සමාන ආරක්ෂාවක් ලබා දීමෙන්, ප්‍රචණ්ඩත්වය සහ උසි ගැන්වීම් සම්බන්ධයෙන්

වගවීම තහවුරු කිරීමෙන් සහ ඇදහිලිවල මෙන්ම ප්‍රකාශනයන්හි විවිධත්වය ඉවසීමෙන් සහ එයට ගෞරව කිරීම මගිනි.

මෙම අවසාන පරිච්ඡේදය මගින් ශ්‍රී ලංකාව තුළ ආගමික ප්‍රකාශනයන් සඳහා වඩාත් හිතකර සහ අයිතිවාසිකම්වලට ගරු කරන වාතාවරණයක් නිර්මාණය කිරීම අරමුණු කරගනිමින්, විවිධ පාර්ශවකරුවන් වෙනුවෙන් ඉදිරිපත් කරන ප්‍රධාන නිර්දේශ සහ ක්‍රියාකාරී කරුණු දක්වා ඇත. මෙම නිර්දේශයන් ඉදිරිපත් කරනු ලබන්නේ FoRB සහ FoE යනු විශ්වීය, අභාජ්‍ය , අන්‍යෝන්‍ය වශයෙන් යැපෙන සහ එකිනෙකට සම්බන්ධ අයිතිවාසිකම් යන අවබෝධය මත පදනම්ව වන අතර, එම අයිතිවාසිකම් ඵලදායී ලෙස භුක්ති විඳීම සඳහා නීතිමය පැහැදිලිභාවය, ආයතන කෙරෙහි විශ්වාසය ගොඩනැගීම, අයිතිවාසිකම්වලට සමාන ආරක්ෂාවක් ලැබීම, විවෘත සංවාද පැවැත්වීම මෙන්ම එකඟ නොවීම්, විවේචන සහ ඇදහිලිවල විවිධත්වය සඳහා පවතින ඉඩකඩ ආරක්ෂා කරන අතරම, පුද්ගලයන්ට සිදුවන හානි වැළැක්වීම සඳහා වූ පොදු කැපවීමක් අවශ්‍ය බවද යන අවබෝධයන් මත ඒවා ඉදිරියට ගමන් කරයි.

## නීති සම්පාදකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයින්

ශ්‍රී ලංකාව තුළ FoRB සහ FoE පාලනය වන ව්‍යවස්ථාපිත සහ ව්‍යවස්ථාදායක රාමුව, ICCPR හි 18, 19 සහ 20 වගන්ති සමඟ පෙළ ගස්වන්න. මෙයට පහත සඳහන් දෑ ඇතුළත් විය යුතුය:

» ආගමක් හෝ ඇදහීමක් වෙනස් කිරීමට ඇති අයිතිය ද ඇතුළුව, ICCPR හි 18 වන වගන්තිය යටතේ දක්වා ඇති FoRB සම්පූර්ණ විෂය පථය ඇතුළත් කිරීම සහ ඕනෑම සීමා කිරීමක් 18(3) වගන්තිය යටතේ අවසර දී ඇති කරුණුවලට පමණක් දැඩි ලෙස සීමා කිරීම.

» සියුම් ලෙස අර්ථ දක්වා ඇති සහ නීත්‍යනුකූලභාවය, අවශ්‍යතාවය සහ සමානුපාතිකභාවය යන තෙවැදෑරුම් පරීක්ෂණයට යටත්ව අවසර දිය හැකි සීමාවන් සමග ICCPR හි 19 වන වගන්තිය යටතේ හඳුනාගෙන ඇති FoE සම්පූර්ණ විෂය පථය ඇතුළත් කිරීම.

ICCPR හි 19 වන වගන්තිය (FoE සහ ඒ සඳහා අවසර දී ඇති සීමාවන්) සහ වෙනස්කොට සැලකීමට, එදිරිවාදීකමට හෝ ප්‍රචණ්ඩත්වයට උසි ගන්වන සුළු ආගමික වෛරය ප්‍රවර්ධනය කිරීම තහනම් කිරීම සම්බන්ධ 20 වන වගන්තිය, එකිනෙකට සංගත සහ අන්තර්-සම්බන්ධිත බව පිළිගැනීම.

රබාත් ක්‍රියාකාරී සැලැස්මෙහි විස්තර කර ඇති පරිදි, චේතනාව, සන්දර්භය සහ හානියක් සිදුවීමේ වියහැකියාව කෙරෙහි එහි ඇති අවධාරණය ද ඇතුළුව, ICCPR හි 20 වන වගන්තියට අනුකූලව "උසි ගැන්වීමේ" සීමාව පැහැදිලිව අර්ථ දැක්වීම සහ ප්‍රකාශ කිරීම; එමෙන්ම ICCPR පනතේ 3 වන වගන්තිය අදාළ වන්නේ වෙනස්කොට සැලකීම, එදිරිවාදීකම හෝ ප්‍රචණ්ඩත්වය සඳහා උසි ගන්වන මට්ටමේ ආගමික වෛරය ප්‍රවර්ධනය කිරීම සඳහා පමණක් බව පැහැදිලි කිරීම.

- අත්තනෝමතික හෝ වෙනස්කොට සැලකීමකට ලක්විය හැකිවන ආකාරයේ ආගමික ප්‍රකාශනයන්ට බාධා කිරීමකට ඉඩ සලසන, අපැහැදිලි සහ පමණට වඩා පුළුල් වූ සීමාවන් අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම.

    » දණ්ඩ නීති සංග්‍රහයේ 291අ, 291ආ සහ 120 යන වගන්ති අවලංගු කිරීම හෝ සැලකිය යුතු ලෙස සංශෝධනය කිරීම මගින් ආගමික හැඟීම්වලට අපහාස කිරීම සම්බන්ධයෙන් වන වැරදි ඉවත් කිරීම සහ අපරාධමය වගකීමක් පැවරීම සඳහා පැහැදිලි චේතනාවක් සහ ආසන්න හානියක් සිදුවීමේ අවදානමක් තිබීම අනිවාර්ය

කිරීම.

» ප්‍රචණ්ඩත්වයට හෝ ත්‍රස්තවාදයට පැහැදිලි සම්බන්ධයක් තිබීම අවශ්‍ය නොවන පරිදි, විවිධ ප්‍රජාවන් අතර "අසමගිය" හෝ "දුෂ්ට චේතනාවන්" ඇති කරන ප්‍රකාශ අපරාධයක් ලෙස දක්වන PTA හි 2(1)(ඌ) වගන්තිය අවලංගු කිරීම.

» පැහැදිලි නිර්වචන සහ වාස්තවික ප්‍රමිතීන් නොමැති බැවින්, අසත්‍ය ප්‍රකාශ සහ ආගමික රැස්වීම්වලට බලපාන බව කියන හෝ ආගමික හැඟීම් ප්‍රකෝප කරවන බව කියන අන්තර්ගතයන් සම්බන්ධයෙන් දඬුවම් පමුණුවන OSA හි 15 සහ 16 වගන්ති සංශෝධනය කිරීම; එසේම, අත්දැකීම් මගින් පරීක්ෂා කළ නොහැකි සහ තර්කනයෙන් ඔබ්බෙහි පවතින දේවධර්මීය කරුණු සඳහා මෙම ප්‍රතිපාදන අදාළ කිරීම මගින් එවා අත්තනෝමතික සහ පුද්ගල මූලික අර්ථකථනයන්ට ලක්වීමට විශේෂයෙන් ඉඩකඩ ඇති කරයි.

- සුළුතර ප්‍රජාවන් සහ සිවිල් සමාජය සමග විශේෂයෙන් කටයුතු කරමින්, නීති ප්‍රතිසංස්කරණ ඇතුළු ව්‍යවස්ථාදායක ක්‍රියාවලීන් අර්ථවත් මහජන උපදේශනයන්ගෙන් සමන්විත වන බව සහතික කිරීම.

## අධිකරණය

- වෛරී කථනයන් සම්බන්ධ නඩු තීන්දු ලබා දීමේදී සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූල වන පරිදි දේශීය නීතිමය ප්‍රතිපාදන අර්ථ නිරූපණය කිරීමේදී, ICCPR යටතේ එන උසි ගැන්වීමේ දේහලියන් අධිකරණය විසින් චේතනාන්විත සහ සංගත භාවයකින් යුතුව ඇතුළත් කරගත යුතුය.
- FoRB සහ FoE පිළිබඳ අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් මෙන්ම පවතින දේශීය නීතිමය රාමුව, විශේෂයෙන්ම ICCPR පනතේ අදාළ විධිවිධාන පිළිබඳව අනිවාර්ය පුහුණුවක් අධිකරණ පුහුණු ආයතනය විසින් ක්‍රියාත්මක කළ යුතුය.

## නීතිය බලාත්මක කරන ආයතන

- ජාතික පොලිස් කොමිෂන් සභාව විසින්, විශේෂයෙන්ම ප්‍රචණ්ඩත්වය, වෛරී ව්‍යාපාර හෝ සුළුතර ආගමික ප්‍රජාවන්ට බලපාන අදහස් ප්‍රකාශ කිරීමේ සීමා කිරීම් සම්බන්ධ සිදුවීම්වලදී, පොලිසියේ අකර්මණ්‍යතාවය, පක්ෂග්‍රාහීත්වය සහ නීතිය වරණීය ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳ චෝදනා විමර්ශනය කිරීම සඳහා ස්වාධීන අධීක්ෂණ යාන්ත්‍රණයන් ස්ථාපිත කළ යුතුය. එම යාන්ත්‍රණයන් මගින් වාර්ගික ප්‍රචණ්ඩත්වයන් වැළැක්වීමට අපොහොසත් වීම හෝ එවාට නිසි ප්‍රතිචාර නොදැක්වීම සම්බන්ධයෙන් වගවීම සහතික කිරීමටත්, දඬුවම් නොලබා නිදහස් වීමේ සංස්කෘතියක් පවත්වාගෙන යාමට දායක වන නිලධාරීන්ගේ ක්‍රියාවන් හෝ පැහැර හැරීම් සම්බන්ධයෙන් ඔවුන් වගකිව යුතු බවට පත් කිරීමටත් බලය පැවරිය යුතුය.
- පොලිස්පතිවරයා විසින්, නීති සංගතව සහ ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් HRCSL ලබා දී ඇති මාර්ගෝපදේශ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතු අතර,[235] මෙයට අදහස් ප්‍රකාශ කිරීම සම්බන්ධ නඩුවලදී අත්අඩංගුවට ගැනීමට පෙර අනිවාර්ය නීතිමය සමාලෝචනයක් සිදු කිරීම සහ විනිවිද පෙනෙන අත්අඩංගුවට ගැනීමේ හා රඳවා තබා ගැනීමේ පටිපාටි ඇතුළත් විය යුතුය.[236]

- ජාත්‍යන්තර සහ දේශීය නීතිය යටතේ FoRB සහ FoE විෂය පථය පිළිබඳවත්, දේශීය නීතිමය විධිවිධාන නිසි ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳවත් පොලිස් නිලධාරීන් සහ නව බඳවා ගැනීම් සඳහා වන පුහුණු වැඩසටහන්වලට ඇතුළත් කිරීමට ජාතික පොලිස් ඇකඩමිය විසින් පියවර ගත යුතුය.

## සිවිල් සමාජය සහ මානව හිමිකම් ආරක්ෂකයින්

- FoRB සහ FoE ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂකයින්, අධිවාචකයින් සහ අධ්‍යාපනඥයින් ලෙස කටයුතු කරන්න.
- නීත්‍යනුකූල අදහස් ප්‍රකාශ කිරීම් ආරක්ෂා කරන අතරම, නීතියෙන් අවසර තිබුණද සහජීවනය සහ ගෞරවය සම්බන්ධයෙන් ගැටලු මතු කරන ප්‍රකාශයන් හෙළා දකිමින්, මධ්‍යස්ථ මතවාදයක් නියෝජනය කරන්න.
- අයිතිවාසිකම් උල්ලංඝනය වීම්වලට ලක්වූවන්ට සහයෝගය දක්වන්න සහ හානිකර ආඛ්‍යානයන්ට එරෙහි වන්න.
- වෛරී කථනය, දේවාපහාසය, ආගම් මාරු කිරීම සහ මාර්ගගත ප්‍රකාශන සම්බන්ධ නීති අවභාවිත කිරීම් ලේඛනගත කරන්න සහ ඒවාට අභියෝග කරන්න.
- පහත සඳහන් කරුණු සම්බන්ධ නඩු වලදී නීතිමය සහය සහ උපායමාර්ගික නඩු පැවරීම් ලබා දෙන්න:
  - » අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්,
  - » වරණීය ක්‍රියාත්මක කිරීම්,
  - » ආගම ප්‍රගුණ කිරීමට හෝ ප්‍රකාශනය කිරීම මත ඇති සීමාවන්.
- ICCPR ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටින්න.
- පහත කරුණු පැහැදිලි කරමින් පොදු ජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර පවත්වන්න:
  - » අමනාපය ඇති කරන කථනය සහ උසි ගැන්වීම් අතර වෙනස
  - » දේවාපහාස නීති මගින් FoRB සහ FoE යන ද්විත්වයම උල්ලංඝනය වන්නේ ඇයි ද යන වග.
- ගැටලු ඉදිරිපත් කිරීමට සහ වගවීම ඉල්ලා සිටීම සඳහා ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණයන් සමග සම්බන්ධ වන්න.

## ආගමික නායකයින් සහ ඇදහිල්ල මූලික කරගත් ආයතන

- ආගමික ප්‍රජාවන් තුළ සහ එම ප්‍රජාවන් අතර සහජීවනය, බහුත්වවාදය සහ විරුද්ධ මතයන්ට ගරු කිරීම ප්‍රවර්ධනය කරන්න.
- ප්‍රසිද්ධියේ මේ වග සහතික කරගන්න:
  - » සාමකාමී ලෙස ආගම ප්‍රචාරණය කිරීම සහ ආගම මාරු කිරීම නීත්‍යනුකූල මෙන්ම ආරක්ෂිත අයිතිවාසිකම් වේ.
  - » ආගම නාමයෙන් සිදුකරන ප්‍රචණ්ඩත්වය සහ වෛරී කථනය පිළිගත නොහැකිය.
- අඩු පිළිගැනීමක් සහිත ආගමික කණ්ඩායම් ද ඇතුළත් කරගනිමින්, අන්තර්ලබ්ධික සංවාද සහ සමථකරණ සංසද සඳහා විවිධ ආගමික සහභාගීත්වයන් දිරිමත් කරන්න; එමෙන්ම අන්‍යාග මිකකරණය වැනි මතභේදාත්මක මාතෘකා පිළිබඳ සාකච්ඡා ආරම්භ

කිරීමට මෙම වේදිකා භාවිතා කරන්න.

- ආගමික 'අපහාසයක්' සිදුවූ බව හැඟී යන අවස්ථාවලදී, පැමිණිලි ගොනු කිරීම අධෛර්යමත් කරන්න සහ පිරිස් ඒකරාශී වී කලහකාරී ලෙස හැසිරීම වළක්වන්න.
- FoRB සහ FoE යනු ඇදහිලි පද්ධතීන් නොව පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා පවතින අයිතිවාසිකම් බවට සභාවන් දැනුවත් කරන්න.
- වාර්ගික ආතතීන් උත්සන්න වීම වැළැක්වීම සඳහා රාජ්‍ය ක්‍රියාකාරීන් සමග නිර්මාණාත්මක ලෙස සම්බන්ධතා පවත්වා ගන්න.

## මාධ්‍ය සහ ඩිජිටල් වේදිකා

- බහුත්වවාදී සමාජයක් තුළ වගකීම් සහගතව කටයුතු කරන අතරම, FoE තහවුරු කරන්න.
- විවේචනය කිරීම සහ වෛරය ප්‍රකාශ කිරීම ඒකාබද්ධ කර පටලවා දක්වන මතවාදයන්ට එරෙහි වන්න.
- පහත ක්‍රියාමාර්ග හරහා ආගමික කරුණු සම්බන්ධයෙන් වගකීම් සහගත ලෙස වාර්තාකරණයේ යෙදෙන්න:
    - » සංවේදනාත්මක ලෙස වාර්තා කිරීමෙන් වැළකී සිටීම.
    - » සන්දර්භය ඉදිරිපත් කිරීම,
    - » මධ්‍යස්ථ මතවාදයන්ට වැඩි ඉඩක් ලබාදීම.
- පහත කරුණු අතර වෙනස පැහැදිලිව වෙන්කර හඳුනාගන්න:
    - » සාධාරණ විවේචනය, උපහාසය හෝ විරුද්ධ මතය සහ ප්‍රචණ්ඩත්වය උසි ගන්වන වෛරීකථනය.
    - » ආගම් හෝ ආගමික නායකයන් ඉලක්ක කරගනිමින්, යම් නිශ්චිත ප්‍රජාවකට හානි කිරීමේ අරමුණින් සිදුකරන සෘජු ප්‍රකාශ මෙන්ම වක්‍ර/ සංකේතාත්මක ප්‍රකාශ ද හඳුනාගත හැකි මෙවලම් භාවිතය පිළිබඳව සලකා බලන්න.
- ගවේෂණාත්මක මාධ්‍යකරණය හරහා වෛරී කථනය සහ දේවාපහාස නීති අවභාවිත කිරීමට එරෙහිව අභියෝග කරන්න.
- මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතතාව පිළිබඳ පනත යටතේ අන්තර්ගතයන් නියාමනය කිරීමේදී, විනිවිදභාවය සහ නිසි නීතිමය ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීම වෙනුවෙන් පෙනී සිටින්න.
- වාරණය සඳහා ඉල්ලීම් කරනවා වෙනුවට, ප්‍රති-භාෂණය සහ පොදු සංවාදයන් දිරිමත් කරන්න.

# Endnotes


1 ජෝන් ෆී, "භාෂණයේ නිදහස සහ නිදහස් ආගමික භාවිතාව සංගත කිරීම," විලියම් සහ මේරි බිල් ඔෆ් රයිට්ස් ජර්නලය 32, අංක 3 (2024): 682-683. https://scholarship.law.wm.edu/wmborj/vol32/iss3/3/).

2 එම

3 ස්ටෙෆානස් එලායන්ස් ඉන්ටර්නැෂනල්, ආගමික නිදහස හෝ ඇදහීමේ සහ ප්‍රකාශනයේ නිදහස: සංකීර්ණ සහ අනුපූරක සම්බන්ධතාවයක් (ඔස්ලෝ: ස්ටෙෆානස් එලායන්ස් ඉන්ටර්නැෂනල්, 2025), 6.

